ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශයන් ක්‍රියාත්මක කළ යුතු බවට රජයට කරන ඉල්ලීමක්
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවෙන් ජ්වලිත ඉල්ලීමක් 3 පිටුව

කොළඹ කතෝලික සුළුමුල
අතීතාවලෝකනය කළ සසුන් ඉතිහාසයේ ලිපි පෙළ සිය වැනි කොටසත් සම්පූර්ණ කළ වගයි. 8 පිටුව

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල අපට අකැප ද?
ආන්දෝලනයට තුඩු දී ඇති උක්ත මාතෘකාව අළලා කැරෙන මත විමසුමකි. 12 පිටුව

2010 වසරේ හොඳම ආගමික පුවත්පත

ඥානාර්ථ ප්‍රදීපය
ආරම්භය : 1866 ජූනි 07

චතාරිකයේ දෙවන ඉරුදින (සමිඳාණන්ගේ අන්‍යරූප විලාශවීම)

ක්‍රි.ව. 2012 ක් වූ මාර්තු 04 ඉරිදා 146 වෙළුම 39 කලබ සතිපතා පත්‍රය - පිටු 20 - මිල රු. 20 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

ජාත්‍යන්තර පීඩනය සමහන් කර ගන්නට උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව රජයෙන් ඉල්ලා සිටී

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය උදක්ම රජයෙන් ඉල්ලා සිටින්නේ සිය බලය උපයෝගී කරගනිමින් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා කළ හැකි සියල්ල ඉටු කිරීමට බලවත් සැලකිල්ලක් දක්වන ලෙසයි. එසේ නොවූ කල තවත් අනගි අවස්ථාවක් අපතින් මඟ හැරී යෑමට ඉඩ ඇති නිසා එවැන්නකට අපට අවසර නොමැත. අපගේ විශ්වාසය නම් එහි නිර්දේශයන් බොහොමයක් ඇතිවූ තුවාල සුවපත් කිරීමට සහ සමඟද්ධිය, ප්‍රතිසංධානය රැගෙන ඒමේ සංවර්ධනාත්මක ගුණයෙන් යුතු වීම නිසා අන්තර් ජාතික පීඩනය සමහන් කිරීමට සමත් වන බව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව ප්‍රකාශ කරයි.

ශ්‍රී කතෝලික රදගුරු සම්මේලනයේ සභාපති අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ හා මහ ලේකම් අති උතුම් නෝබට් ඇම්. අන්ද්‍රාදි හිමිපාණන්ගේ අත්සනින් යුතුව නිකුත් කළ සම්පූර්ණ නිවේදනය 03 පිටුවේ පළවේ.

පසුගියදා රට පුරා පැවැති උද්ඝෝෂණ මාලාවට සමගාමීව මිගමුව නගරයේ පැවති විරෝධතාවයට නියෝජ්‍ය අමාත්‍ය සරත් ගුණරත්න සහ පළාත් සභා අමාත්‍ය නිමල් ලංසා ඇතුළු පිරිස සම්බන්ධ වී සිටි අයුරු.. (සේයා - එරන්ද)

මාධ්‍ය නිවේදනය

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයට ඇමරිකාව විසින් ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාවක් ඉදිරිපත් කිරීමත්, එයට ඇතැම් බටහිර රටවල් සහයෝගය දැක්වීමත් අප රටේ ස්වාධීනත්වයට සහ ස්වෛරීභාවයට කෙරෙන අනිසි බලපෑමක් ලෙස සහ අප දේශයේ ජනතාවගේ බුද්ධිය නිග්‍රහයට ලක් කිරීමක් ලෙසත් අපි දකිමු.

අප රටට එරෙහිව මෙලෙසින් සිදුවන විදේශීය අනිසි බලපෑම් ඉදිරියේ අපට දිය හැකි ප්‍රබලතම පිළිතුර වන්නේ, රජය විසින් පත් කරනු ලැබූ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විසින්, අප රටේම ජනතාවගේ සාක්ෂි මත පදනම්ව ඉදිරිපත් කර ඇති වාර්තාවේ සඳහන් නිර්දේශ සහ යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීම බව අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ අදහසයි. ඒ වෙනුවෙන් නොපමාව පියවර ගන්නා ලෙස උන්වහන්සේ රජයෙන් ඉල්ලා සිටින අතර, ජාති සහ ආගම් භේදයෙන් තොරව ඒ සඳහා එකට පෙළ ගැසෙන ලෙස මේ රටේ සියලු පුරවැසියන්ගෙන් ඉල්ලා සිටිති.

අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා
සභාපති - අගරදගුරු පදවි කාලීන සිදුවීම් විමර්ෂන කමිටුව

හා.ජුසේ වාස් ලේකම් කාර්යාංශයෙන් වැඩසටහන් රාශියක්

අසේල දසනායක විසිනි

භාග්‍යවත් ජුසේවාස් ජාතික ලේකම් කාර්යාංශයේ 130 වන රැස්වීම සභාපති අති උතුම් ජෝශප් වියානි ප්‍රනාන්දු මහනුවර රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ලංකාරාමයේ දී පැවැත්විණි.

භාග්‍යවත් ජුසේවාස් පියතුමා සාන්තුවරයට එසවීම සම්බන්ධ පරීක්ෂණ මේ දිනවල කෙරීගෙන හා විමසාගෙන යන හෙයින් ඒ පිළිබඳව අඛණ්ඩව හා විශ්වාසයෙන් යාච්ඤා කරන ලෙස ඉල්ලා සිටී. 15 පිටුවට ▶

මෙරට සරසවි වරම් ලබන්නේ 20% යි; ඉතිරි 80% යා යුත්තේ කොතැනට ද?

සා. ජෝශප් විදුහලේ අදියුරු පියතුමා අවධාරණය කරයි

ස්ටැන්ස්ලස් පයස් විසිනි

උසස් පෙළ සමතුන්ගෙන් විශ්ව විද්‍යාල සඳහා තෝරා ගනු ලබන්නේ 20% ක් පමණ වන සුළු පිරිසක් හෙයින් සුදුසුකම් සපිරූ සෙසු බහුතර සිසුන් සඳහා පෞද්ගලික විශ්ව විද්‍යාල හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතන පිහිටුවිය යුතු බවත්, එ තුළින් බුද්ධි ගලනය මෙන්ම විදේශ විනිමය පිටතට ගලා යෑම ද වළක්වා ගනිමින් එම මානව හා මූල්‍ය සම්පත් රටේ සංවර්ධනය සඳහා යෝග්‍ය පරිදි යොදා ගැනීම යුගයේ අවශ්‍යතාවයක් බවත් කොළඹ සා. ජෝශප් විදුහලේ අදියුරු ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමා පැවසීය. 15 පිටුවට ▶

අදියුරු පියතුමා ප්‍රධාන ආරාධිතයා වූ විනිසුරු ප්‍රියශාන් ඩෙප් මහතා කැඳවාගෙන ආ අයුරු..පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමා පසෙක සිටී.

ධීවර අපි කාගෙවත් අතකොළු නොවෙයි

සිසිල් ඩැනීසියස් විසිනි

"ඉන්ධන මිල ඉතා විශාල ප්‍රතිශතයකින් ඉතිහාසයේ ප්‍රථම වරට ඉහළ යාමත් සමඟ තමන් බලවත් පීඩාවට පත්වූ බවත්, තමන්ගේ දුක්ගැනැවිල්ල රටට ම කියා පෑම සඳහා සාමකාමී උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වූ බවත්, ඒ සඳහා කිසිදු රාජ්‍ය නොවන සංවිධානයක තමන් බළල් අත් නොවූ බවත් එහෙත් තමන් උද්ඝෝෂණය කරනු ලැබූයේ රාජ්‍ය නොවන සංවිධානවල මෙහෙයවීමෙන් බවට ඇතැම් රාජ්‍ය නිලධාරීන් කරන චෝදනා තමන් තරයේ ප්‍රතික්ෂේප කරන බැව් මීගමුව හා හලාවත එක්දින, බහුදින හා සුළුපන්න ධීවර සමිති නියෝජිතයෝ ප්‍රදීපයට කීහ.

අපි තනි වී අසරණ වී සිටිනා විට අපේ දුකට පිහිට වන්න කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්, හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්, අනුනාහිමිවරුන්, ධීවර උපාධ්‍ය පියවරුන්, මීසම් සේවක පියවරුන් ඉදිරිපත් වී ඒ සඳහා රජයට දැන්වීමට කටයුතු කිරීම තම සංගම් ඉතා අගය කරන බවත් රජයේ හෝ විපක්ෂයේ අතකොළු නොවී තමන්ගේ දුක් ගැනැවිලි කිසිදු පක්ෂ දේශපාලනයකින් තොරව දියත් කරනු ලැබූ බව ද ඔවුහු කියා සිටියහ. ඒකාබද්ධ ධීවර ජාතික වැඩපිළිවෙලක අවැසිතාව ද ඔවුහු වැඩිදුරටත් කියා සිටියහ.

වාස් පිය සිරිත නව ග්‍රන්ථයකින්

මානව පුරා විද්‍යාව හා ජනසන්නිවේදනය පිළිබඳ දර්ශනපතිවාදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන කුසුම් වෛද්‍යරත්නයන් ලියූ "ගෝවෙන් අමුත්තෙක් ඇවිත්" කෘතිය හා. ජුසේ වාස් පියතුමා ප්‍රස්තූත කරගෙන තිබේ. පර්යේෂණාත්මක ග්‍රන්ථයක් වූ එය මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ට හා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට පිළිගන්වා ඇත. (✍ ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා)

චතාරික ධර්ම විවේකය 2012

අගරදගුරු පදවි නැඟෙනහිර කලාපයේ මීසම්වල සහ ආයතනවල සේවය කරන ගරු පියතුමන් සඳහා චතාරික ධර්ම විවේකය 2012 මාර්තු මස 26 සඳුදා සවස 6.00 සිට 27 අඟහරුවාදා දිවා ආහාරය දක්වා තේවත්තේ ඥානකාන්ති නිවාසයේ දී පැවැත්වෙන බව නැඟෙනහිර කලාපීය නාහිමි අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා දන්වා සිටී.

කතෝලික මුද්‍රණාල පොත්හල දෙතැනක

කොළඹ කතෝලික මුද්‍රණාලයේ ජංගම කතෝලික පොත්හල මාර්තු 3 සෙනසුරාදා තේවත්ත බැසිලිකා පුදබිමේ පැවැත්වේ. අගරදගුරු පදවි ළමා දිනයට සමගාමීව එදින එය තේවත්තට යයි. මාර්තු 09 - 11 දක්වා තලවිල චතාරික මංගල්‍යයට සමගාමීව තලවිල සා. ආනා පුදබිමේ දී කතෝලික මුද්‍රණාලයේ ජංගම පොත්හල පැවැත්වේ. ඔබ සැමට ආරාධනා!

මරිය භටයින්ගේ වාර්ෂික චතාරික පාදනමස්කාරය

"කුරුස පාමුල සිටි මරි මව් සමඟින් අපගේ කැපවීම අළුත් කරමු" යන තේමාව යටතේ ලංකා අප ස්වාමිදුවගේ කොමිටිසියම් සභාව මඟින් සංවිධානය කරනු ලබන වාර්ෂික චතාරික පාද නමස්කාරය මාර්තු 17 සෙනසුරාදා පෙ.ව. 8.00 වත්තල සා. ආනා කල්වාරි භූමියේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා සියලුම මරිය භටයින්ට සහ සැදැහැවත් ජනතාවට ගෞරවයෙන් ආරාධනා කර සිටී.

(✍ සනි ප්‍රැන්සිස්)

"මේ මාගේ පුත්‍රයාණෝ ය. එතුමන්ට සවන් දෙන්න." (ශු. මාක් 9:2-10)

පදවියෙන් පදවියට

මහජන බැංකුව අනුග්‍රහයෙන් තලවිලට විශ්‍රාම ශාලාවක්

මහජන බැංකුවේ 50 වන සංවත්සරය වෙනුවෙන් රුපියල් මිලියන 5 කට අධික මුදලක් වැයකර තලවිල සා. ආනා ජාතික පුදබිමෙහි වන්දනා කරුවන් වෙනුවෙන් ඉදිකරන ලද නේවාසික ගොඩනැගිල්ල මාර්තු 03 සෙනසුරාදා උදේ 9.30 ට හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් විවෘත කිරීමට නියමිතව තිබිණ.

මේ අවස්ථාවට මහජන බැංකුවේ සභාපති ඩබ්. කරුණාජීව මහතා ඇතුළු මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයද, සාමාන්‍යාධිකාරි වසන්ත කුමාර් මහතා ඇතුලු ආයතනික කලමණාකාරිත්වයද මහජන බැංකුවේ කිතුනු ඒකකයේ සාමාජික සාමාජිකාවන්ද, පුත්තලම ප්‍රාදේශීය සේවක මණ්ඩලයද සහභාගිවන බව පුත්තලම ප්‍රාදේශීය කලමණාකාර ටී. ජී. කරුණාරත්න මහතා ප්‍රදීපයට පැවසීය.

පර්සි ප්‍රනාන්දු

හලාවත පදවියේ මරිය හමුදා මහා ධර්ම විවේකය

හලාවත පදවියේ මරිය හමුදාවේ වාර්ෂික ධර්ම විවේකය මාර්තු 23, 24, 25 යන දිනවල තලවිල පුදබිමේ පැවැත්වීමට මරිය හමුදා පදවි අධ්‍යක්ෂ ගරු හැරල්ඩ් ප්‍රනාන්දු පියතුමා ඇතුළු කොමිටිසියම් නිළ මඩුල්ල කටයුතු සූදානම් කර ඇත.

මේ දිනවල චාරිත්‍රික වැඩසටහන්සමඟ පාදනමස්කාරය පැවැත්වීමට ද, ධර්ම විවේකය අවසානයේ දී ආචියස් උත්සවය පැවැත්වීමට ද ගරු පියතුමා සහ නිල මඩුල්ල අදහස්කර ඇත.

තරංගා සුභාෂිනි ප්‍රනාන්දු

හලාවත පදවි ගිහිදූත සේවා අධ්‍යක්ෂ ගරු සාර්ටෝ නෝනිස් පියතුමා සමඟ ජායාරූපයට පෙනීසිටින්නේ නවක පළඳනා ලබා දිව්‍ය හෘදය සංඝයට එක්වූ සාමාජික සාමාජිකාවන් පිරිසයි.

සේයා - ශ්‍රියානි පෙරේරා
සටහන - එලිසබෙත් ඇන්

ගිහි සැදැහැවතුන් අතර යාම යැදුම පණ ගැන්වේ

උදයට සහ සවසට යදින සාන්ත සභාවේ නිළ යැදුම හෙවත් යාම යැදුම පූජක හා පැවිදි පක්ෂයට පමණක් සීමා වී තිබූ යුගය නිමා කරමින්, එය ගිහි ජනතාව අතර ප්‍රචලිත කරවන්නට පසුගිය වකවානුවේ ජන වන්දනා උපාධ්‍ය ගරු ආචාර්ය සිසිල් ජෝයි පෙරේරා පියතුමා විසින් දරණ ලද උත්සාහයේ ඵල නෙලන්නට හැකිවෙමින් තිබේ.

කඳාන, නාගොඩ මීසම්වාසී සැදැහැවතුන් අතරට යාම යැදුම රැගෙන එන්නට මීසම් සේවක ගරු රන්ජන් සිල්වා පියතුමා පසුගිය වසර අවසන් කාලයේ මූලික පියවර ගත්තේය. සිකුරාදා දිනයන්ට නියමිත සැදැ යාම යැදුම පිළිවෙත් යාච්ඤා ඡායා පිටපත් කොට, සිකුරාදා සවස දිව්‍ය පූජාවට පැමිණෙන ජනතාවට බෙදා දී පූජාවට පෙර එතුමන් විසින් එය මෙහෙයවමින් ඒ සඳහා ජනතාව පුරුදු පුහුණු කරන ලදී. ඒ සමගම යාම යැදුම පිළිබඳව ජනතාවට අවබෝධයන් ලබා දුන් ගරු පියතුමා යාම යැදුම පොත් මිළ දී ගෙනැවිත් එම මිළෙන් අඩකට ජනතාවට ලබා දීමට ක්‍රියා කළේය.

පසුව එතුමා අඟහරුවාදා සහ බදාදා උදය දිව්‍ය පූජාවට පෙර උදා යාම යැදුම සඳහා සැදැහැවතුන් බොහෝ දෙනකුට සහභාගි වීමට ඉඩ සලසා දෙමින් ගිහියන් අතර යාම යැදුම ප්‍රචලිත කිරීමේ කාර්යයට උර දී සිටී. එසේම මෙම දේව වචනයේ වසර තුළ වැඩි දෙනකුට දිව්‍ය පූජාවල කියවීම් සඳහා අවස්ථාව ලබා දීමට ද ගරු පියතුමා ක්‍රියා කිරීම විශේෂත්වයකි.

ඩී. ඩී. මේරි රීටා

ගබ්සාව නීතිගත කරන්නට සූදානම මිනී මැරීමට බලපත් දීමක්!

ගාල්ල රදගුරු හිමිපාණෝ විරෝධය පළකරති

අද මේ රටේ ගබ්සාව නීතිගත කරන්නට නීති සම්පාදනය කරන්න සූදානම් වෙනවා. මව් කුසයේ දරුවන්ට ජීවත් වෙන්න ඉඩනොදී විනාශ කර ඔවුන්ගේ ජීවිත විනාශ කරන්න ඇතැමුන් උත්සහ කරනවා. මෙවැනි අපචාර ක්‍රියා අවසන් කළ යුතුයි. මෙවැනි පාපිෂ්ඨ ක්‍රියාවලට ඉඩ නොදිය යුතුයි. කතෝලිකයින් වශයෙන් අපේ බලවත් විරෝධය පළ කළ යුතු" යැයි ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ ප්‍රකාශ කළහ.

රදගුරු හිමි එසේ පැවසුවේ පරකඩුව සදාසරණ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍ය උත්සවයේදීය.

කිතුනු පවුල් ඉතාමත් සුළු සංඛ්‍යාවක් ඇති පරකඩුව දෙව් මැඳුරේ වාර්ෂික මංගල්‍ය උලෙළ සෑම වසරකදීම හැඳල නායකකන්ද මීසම් වාසීන් විසින් සංවිධානය කර පවත්වනු ලැබේ.

රදගුරු හිමි ලේකම් ගරු සම්පත් විලේගොඩ, කනිටු දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු සංජීව පීරිස්, නායකකන්ද මීසම් සහයක ගරු ශිරාන් දසා, දෙහිගහපිටිය මීසම් සේවක ගරු ජූඩ් අමිල ප්‍රනාන්දු පියතුමන්ද, ගරු නිශාන්ත රෝහාන් තේවාචාර්ය තුමාද මේ අවස්ථාවට සහභාගි විය.

තිමල් පෙරේරා

මනෝ විද්‍යා උපදේශක පුහුණුව සාර්ථකව නිමකරයි

කුරුණෑගල 'කරිටාස් - ජනසෙත' ආයතනය මීට වසර කිහිපයකට ප්‍රථම මනෝ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කළේය. ජනසෙත ආයතනයේ අධ්‍යක්ෂ ගරු අජිත් රොහාන් පියතුමාගේ මෙහෙයවීමෙන් 'කරිටාස් රෝමා' ආයතනයේ මූල්‍ය දායකත්වයෙන් එය ආරම්භ කෙරිණි.

පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යා අංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා කොළඹ ඇක්වයිනාස් විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යා අංශයේ අංශාධිපති, ගරු ප්‍රැක්සිඩ් ඇන්තනි ප්‍රනාන්දු නි.ම.නි පියතුමන් විසින් වසර එකහාමාරක පාඨමාලාවක් පැවැත්වූ අතර න්‍යායික පාඩම් මාලා වලට අමතරව ප්‍රායෝගික පුහුණු සැසි ද මේ පාඨමාලාවට අයත් විය.

පාඨමාලාව සාර්ථකව නිම කළ සිසු සිසුවියන් සඳහා වෘත්තිමය උපදේශන සහතික සහ උපදේශන ඩිප්ලෝමා සහතික ප්‍රදානය කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

කුරුණෑගල රදගුරු වසමේ අධ්‍යාපන හා ධර්මෝපදේශ සේවාවේ දහම් ගුරු මාර්ගෝපදේශ කණ්ඩායමෙන් ගුරු භවතුන් 6 දෙනෙකු ද, ජනසෙත ආයතනයේ පෙරපාසල් ගුරු භවතුන් ද, කුරුණෑගල ශික්ෂණ රෝහලේ තැලසිමියා ඒකකයේ සේවය කරන්නියන් තිදෙනෙකු ද මෙම පාඨමාලාව සාර්ථකව නිමා කර සහතික පත්‍ර ලබා ගත්හ.

වසන්ත කුමාර

අති උතුම් වියානි ප්‍රනාන්දු රදගුරු හිමිපාණන්ගේ සභාපතිත්වයෙන් යුත් භාග්‍යවත් ජුසේවාස් පිය ජාතික කාර්යාංශයේ සහයක වශයෙන් සේවය කළ ගරු ඇලෙක්ස් දසනායක පියතුමා විශ්‍රාම යෑමෙන් පසු අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා පත් කරනු ලැබිණ. ඡායාරූපයෙන් දැක්වෙන්නේ පසුගියදා බැල්කම් පෙදෙසේ පැවති ජාතික කමිටු රැස්වීමේ අවස්ථාවකි. ඡායාරූපයේ වමේ සිට අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ නාහිමිපාණන්, අති උතුම් වියානි ප්‍රනාන්දු රදගුරු හිමි, ලේකම් රොනි පෙරේරා මහතා සහ රත්නපුර පදවි උපාධ්‍ය ගරු ක්‍රිස්ටෝපර් කුරේරා පියතුමා ද කමිටු සාමාජිකයන්ගෙන් කොටසක් ද මෙහි වෙති.

තියබෝල්ඩ් සමරතුංග

කඩවත කතෝලික තරුණ සමිතිය ස්වර්ණ ජයන්තිය සමරයි

කඩවත සා. අන්ද්‍රේ අවෙල්ලීනු මුනි දෙව්මැඳුරේ කතෝලික තරුණ සමිතියට වසර 50 ක් සපිරීම නිමිත්තෙන් "අභිමාන සැමරුම් උලෙළ" නමින් විශේෂ උත්සවයක් පසුගියදා කඩවත කේ. සී. පී. ශාලාවේදී පවත්වනු ලැබීය.

සංවත්සර රැස්වීමට පෙර සමිතියේ අතීත සාමාජික වර්තමානයේ ගාලු පදවියේ අනුනායක අතිගරු නිහාල් නානායක්කාර පියතුමාගේ ප්‍රධානත්වයෙන් හවුල් දිව්‍ය පූජාවක් මීසම් වාසින්ගේද සහභාගිත්වයෙන් පවත්වනු ලැබීය. අනතුරුව සමිතිය ආරම්භ කිරීමට පුරෝගාමී වූ එවකට කඩවත මීසම් සේවක ගරු වින්සන්ට් ඩෙප් පියතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සව කටයුතු ආරම්භ කෙරිනි.

අතීත සාමාජිකයන් විසින් දැමූ සවිමත් අත්තිවාරම මත එම සමිතිය සාර්ථකව සිය 50 වෙනි සංවත්සරය දක්වා අඛණ්ඩව ගොඩනැගුන බව කෘතවේදීව සිහිපත් කරමින් සමිතියේ ප්‍රථම සභාපති ක්‍රිස්ටි අබේරත්න, ප්‍රථම ලේකම් එච්. මයිකල් පෙරේරා, ප්‍රථම භාණ්ඩාගාරික එඩ්වඩ් සෙනෙවිරත්න සහ එහි ක්‍රියාකාරි සාමාජිකයකුව සිටි බෙනඩික්ට් රණසිංහ යන මහත්වරුන්ගේ සේවයන් අගයමින් සම්මාන ප්‍රදානයක්ද එදින සිදුවිය.

මේ සැමරුම් උලෙළට සමගාමීව පැවැත් වූ දහම් පාසල් චිත්‍ර තරගයේ ජයග්‍රාහකයන්ට ත්‍යාග ප්‍රදානය ද, දහම් පාසලේ දරුවන්ට පාසල් බෑග් ප්‍රදානය ද සිදුවිය.

මෙම සමිතියේ සාමාජිකයන් හැම විටම කඩවත දේවස්ථානයේ කටයුතු වලට ඔවුන්ගේ පූර්ණ සහාය නොමඳව තමාට දුන් බවත්, ඉදිරියේ දී එම සහාය තමාට ලැබෙන බව විශ්වාස කරන බවත්, මීසම් සේවක ගරු සුනිල් කුමාර පීරිස් පියතුමා ප්‍රකාශ කළේය.

එච්. මයිකල් පෙරේරා

අඳුරු ලෝකයේ දිදුලන තාරකාවන් වන්න

2012 නව වසර ඇරඹුමත් සමඟ කොළඹ ලංකා අප ස්වාමිදුවගේ මරිය හමුදා කොමිටිසියම් සභා මාසික රැස්වීම ඇරඹුනේ සියළුම ක්‍යුරියා නිළධාරින් හා ප්‍රසීඩියම් සහෝදර සහෝදරියන්ට ධර්ම විවේකයකින් ආත්මික සුවයක් උදා කරමිනි.

එදින ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යයෙන් භාවනාත්මකව ජපමාල උච්චාරණය ශිරාන් ප්‍රනාන්දු මහතා මෙහෙයවිය. අනතුරුව දිව්‍ය පූජා යාගයේදී ජාතික හා පදවි ආත්මික අදියුරු රොනී පොන්සියස් පෙරේරා ගරු පියතුමා ප්‍රකාශ කර සිටියේ අඳුරු ලෝකය තුළ සෑම මරිය භටයකුටම දිදුලන තාරකාවන් වන ලෙසටය. ස්වාමීන් වහන්සේ අපව තවත් වසරක ධර්මදානීය සේවාව වෙනුවෙන් කැඳවන බවත්, වෛද්‍යවරයා ඇවැසි රෝගින්ට බව තේරුම් ගෙන අපද රෝගින්, පවුකරුවන් සොයා තව තවත් දේව රාජ්‍යය අප පෙදෙස් වල පතුරුවාලමින් අඳුරු ලෝකයේ දිදුලන පහනක් වන ලෙස එතුමා ඉල්ලා සිටියේය.

බෙනී ජයමාන්න

ඥානාත්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2012 මාර්තු 04 ඉරිදා

මේ අනගි අවස්ථාව මඟ හැරිය යුතු නැත

රට යම් අනතුරකට මුහුණ දී සිටින බවත්, ඒ ව්‍යසනයෙන් ගොඩ ඒමට පක්ෂ, ජාති, පාට, ආගම් භේදයන්ගෙන් තොරව පෙරට ආ යුතු බවත් අවධාරණය කැරෙන විශාල ව්‍යාපාරයක් පසුගිය දින වල ක්‍රියාත්මක වූ බව පැහැදිලියි. කිසිදු බාහිර රටකට අත පෙවීමට ඉඩක් දිය යුතු නැත යන ස්ථාවරයෙහි පිහිටා සියලු ශ්‍රී ලාංකිකයන් ඒ ඉල්ලීමට එකට රොද බැඳගත් බවත් සියලු වාර්තා වලින් මනාව විස්තර කර තිබිණි. එය එලෙස විය යුතු බව අවිවාදයෙන්ම පිළිගත යුත්තකි. අප දේශයේ ස්වාධීනත්වයට හා ඒකීය භාවයට කිසිදු බාහිර බලවේගයක් අත පොවන්නට සැරසෙන්නේ නම් ඒ බලවේග දුරින්ම දුරස් කරවන තැනට කටයුතු කිරීමට ශ්‍රී ලාංකිකයා උපරිමයෙන්ම උත්සහ කළ යුතුයි.

එම පුණ්‍ය කටයුත්ත කිරීම සඳහා කිසිදු ශ්‍රී ලාංකිකයකු හට තවත් කිසිදු අන්වර්ථ නාමයක් අවශ්‍ය නොවන්නේය. තමන් අදහන ධර්මය බලවත්ය යන සැඟවුණ මාන්නයකින් හෝ තමන්ගේ ජාතිය බලවත්ය යන සැඟවුණු මාන්නයකින් හෝ තමන්ගේ පක්ෂය බලවත්ය යන සැඟවුණු මාන්නයකින් පිරි චණ්ඩි එඩියක් මවා ගෙන කරන සංදර්ශනයකට වඩා මෙහිදී ජනතාවට ඒත්තු ගැන්විය යුත්තේ පොදුවේ ශ්‍රී ලාංකික අනන්‍යතාවය තුළ එකට එක්ව කටයුතු කළ යුතු බවයි.

මේ අවධාරණය රටේ ජනාධිපති තුමන්ම ගෙන හැර පෑම අතීශයින්ම වැදගත්ය. එතුමන් අතින් ඒ දේ සිදු වූ අතරම විපක්ෂ නායකයන්ද ඒ මතයට ගොනුවී සිටි බව පසුගිය කාල වකවානුවේදී පැහැදිලිව දිස්වුණි.

මේ සියල්ලෙහි වැදගත් බව වඩාත් තීව්‍රව රදා පවතින්නේ වසර 30 ක වාර්ගික යුද්ධයකින් පසු රටක් හැරියට නැවතත් සාමකාමී මනසකින් නැඟී සිටින්නට ජනතාව දරන උත්සහය සෑම පැතිකඩයකින්ම දිස් කරවන බැවිනි. එහි ප්‍රබල උත්සහයක් හැටියට දේශයේම ජනතාවගෙන් සමන්විත විද්වත් කමිටුවක් හමුවේ යුද්ධයට මුහුණ දුන් ජනතාවගේම සාක්ෂ්‍ය සටහන් කර ගනිමින් පිහිටුවා ලූ උගත් පාඩම් හා ප්‍රති සංධාන කොමිසම සැබෑම නිමිත්තක් බව ඉතාමත් පැහැදිලියි. මේ වැදගත් කොමිසමේ පූර්විකාව පෙන්වා දෙන පරිදිම කොමිසමේ නිර්දේශයන් සියලු පාර්ශවයන්ගේ එනම් රජයේ, දේශපාලන පක්ෂ වල, සමාජයීය නායකයන්ගේ සහභාගීත්වයෙන් යුතුව ක්‍රියාත්මක වීමේ රාමුවක් සැකසීමට දැන් පදනම දමා තිබේ.

මේ නිර්දේශයන් ක්‍රියාත්මක වීම රටේ සියලු ජාතීන් හට සාධාරණව හා යුක්තිගරුකව විසඳුමක් කරා ලඟා වීමට හැකි මාවතක් විවෘත කරන බව ජ්වලිතව පවසමින් ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ල ද දැන් ප්‍රකාශනයක් නිකුත් කොට ඇත. සියලු බාහිර බලවේගයන් නිහඬ කළ හැකි සැබෑ පිළිතුරක් මේ උගත් පාඩම් හා ප්‍රති සංධාන කොමිසමේ නිර්දේශයන් ක්‍රියාත්මක වීම තුළ යම් පමණකට හෝ ගැබ්වී ඇති බව සනාථ කරන එම රදගුරු ප්‍රකාශනය මේ මොහොතේ කරන දැඩි ආයාචනාව පසෙක දැමීම සුදුසු නොවන බව අපිදු අවධාරණය කරන්නෙමු.

රදගුරු මඬුල්ල පවසන පරිදි උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ කොමිසමේ වාර්තාව ඉදිරිපත් කරන නිර්දේශයන් වඩාත් සංවර්ධනාත්මක හා අනාගතය සඳහා බලාපොරොත්තු වලින් සමන්විත බැවින් එමඟින් දේශයට යහපත් පදනමකින් යුතුව වඩාත් අභියෝගාත්මක සහ අතීශයින් හිතකර කාර්ය සාධනයක් ජාතික ප්‍රතිසංධානය වෙනුවෙන් ලබාගත හැකියි. කොමිසමේ ක්‍රියාකාරකම් මඟින් අතීතයේ සිදු වූ සියලු තුවාල සුවපත් කිරීමේ පැහැදිලි අවශ්‍යතාවයක් පවතින අතර නිර්දේශයන් මඟින් දේශය ප්‍රතිසංධානය ඔස්සේ සියලු පීඩිතයන් හඳුනා ගනිමින්, ඔවුනට සාධාරණය ලබාදීම මඟින් ජාතික සමඟිය, සාමය සහ සමෘද්ධිය නැංවිය හැකියි.

මේ සියල්ල සලකා බලමින් ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ල දැඩි ඕනෑකමකින් ඉල්ලා සිටින්නේ සංකේතාත්මක ප්‍රතිචාරයන් හා ක්‍රියාවන් මඟින් ජාතියේ සමෘද්ධිය සහ ප්‍රතිසංධානය ස්ථාපිත කිරීමට රජය පෙරමුණ ගත යුතු බවයි. මූලික වශයෙන් මෙම ප්‍රතිසංධාන වාර්තාව ජනතාව අතර සිහි කැඳවීමක් සඳහා මෙයට වඩා හොඳ පදනමකින් ව්‍යාප්ත කළ යුතුයි. යහපාලනය ක්‍රියාත්මක වීමේ හැඟීම සියල්ලන් තුළ තහවුරු කළ යුතුයි. නීති විරෝධී ලෙස අප ආයුධ අත දරා සිටින කණ්ඩායම් නිරායුධ කළ යුතුයි. සත්‍ය දැන ගැනීමේ ජනතා අයිතිය තහවුරු කළ යුතුයි. විශ්වසනීයත්වය සියලු ජනතාවගෙන් දිනා ගැනීමට පොදුවේ බලයේ පවත්නා රජය කටයුතු කළ යුතුයි.

රදගුරු මඬුල්ල දැඩිව මෙලෙස ක්‍රියාත්මක කළ හැකි දෑ පිළිබඳව ආයාචනා කරන්නේ කිසිදු ජනතා කොට්ඨාශයක් අගතියට පත් කිරීමට කිසිවෙක් කටයුතු නොකළ යුතු බවත් අවධාරණය කරමිනි. එය සැලකිල්ලට ගත යුතු සැබෑම කරුණකි. තවමත් යම් යහ දැක්මක් ඇති කර ගැනීමට හෝ යම් තිරසාර වැඩ පිළිවෙළක ආරම්භයට හෝ තමන් බලවත් යන නියෝජනයට පමණක් දොරගුළු විවර කර තැබීම දක්නට ලැබෙයි. පොදුවේ සියලු ජනතා අපේක්ෂාවන් ජය ගැනීමට ඒවා බාධාවන් බව දැන්වත් අවබෝධ කොට ගෙන ක්‍රියා කිරීමට වග බලා ගත යුතුයි.

මේ දේශය මෙහි උපන් සියල්ලන්ගේය. තමන්ගේ ආගම නිසා අයිතියක්වත් තමන්ගේ ජාතිය නිසා අයිතියක්වත් තහවුරු කර ගැනීමට කිසිවෙකුට පවත්නා නීතියෙන් පිට කටයුතු කිරීමට අයිතියක් නැත යන්න යළි යළිත් තහවුරු විය යුතුයි. අතීතයේ ජීවත් වන හා අතීතය මත ජීවත් කරවන සීමාසහිත මනස් වපසරියෙන් මිදී රජය හා එක්ව, විපක්ෂය එකමුතු කරමින් සිංහල දෙමළ, මුස්ලිම්, බර්ගර් ජාතිකත්වයෙන් බෞද්ධ, කතෝලික, ඉස්ලාම්, හින්දු අධ්‍යාත්මිකත්වයෙනුත් පොහොණ වී එහි සංස්කෘතික ලක්ෂණ හා පොහොසත් මූලයන්ගෙන් සවිමත් වී මේ නිර්දේශ ක්‍රියාත්මක කරන්නට පෙළ ගැසෙන්නේ නම් විදේශ බලවේග ස්වයංක්‍රියව නිර්විත්දන තත්ත්වයට පත්වෙනු ඇත. විදේශිය ශ්‍රී ලංකා ප්‍රජාව දේශය තුළ ඒකාබද්ධ වන්නට මඟක් විවර කර ගනු ඇත. සවිමත් දැක්මක පිහිටා සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරන්නට රට වැසියා පෙළ ගැසෙනු ඇත.

එම නිසා මෙම අනගි අවස්ථාව මඟ හැරිය යුතු නැත යන්න මැදහත් පිළිවෙතේ දිවි මඟ සරිකරන කාගේ කාගේත් ආයාචනයයි. රදගුරු මඬුල්ලත් මේ පවසන්නේ එයම බව නැවතත් අපි තහවුරු කරන්නෙමු.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයෙන් ජ්වලිත ඉල්ලීමක් !

උගත් පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳව විමසා බැලීමේ කොමිසමේ වාර්තාව ප්‍රකාශයට පත්වීමත් සමඟ ඒ ගැන බොහෝ දේවල් ලියැවී ඇතිවාක් මෙන්ම බොහෝ සාකච්ඡාවන්ද සිදුවී ඇත.

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ප්‍රතිසංධානයේ වැදගත් දූත සේවාව පිළිබඳව ජේසුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට පහදා දුන් අන්දම සවිඥානිකව තේරුම් ගෙන සිටී. ජේසුන් වහන්සේ එතුමන්ගේ ඉතා සුප්‍රකට කන්ද උඩ දේශනාවේදී සිය ශ්‍රාවකයන් අමතා මෙසේ වදාළ සේක. “සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය. ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝ ය.” (මතෙව් 5:9) ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනින් මෙසේ අනුශාසනා කර තිබේ. “සියල්ල පැමිණෙන්නේ දෙවියන් වහන්සේගෙන්ය. උන්වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ කරණ කොටගෙන අප තමන් වහන්සේට සමඟි කරගෙන. සමඟි කිරීමේ සේවය අපට දුන් සේක.” එහි තේරුම නම්, මිනිසුන්ගේ පව් ඔවුනට විරුද්ධව ගණන් නොගෙන ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන, දෙවියන් වහන්සේ, ලෝකය තමන් වහන්සේට සමඟි කර ගනිමින් සිටින බවත්, ඒ සමඟි කිරීමේ සේවය අපට භාර දුන් බවත්ය.” (2 කොරින්ති 5:18-19)

ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමාජය තුළ ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය කොමිසමේ වාර්තාව දෙස කල්පනාකාරීව අවධානය යොමු කිරීමේ දී මේ අත්‍යාවශ්‍ය බයිබලීය සත්‍යතාවයන් සාමය උදාකරන්නන්ට සහ ප්‍රතිසංධාන නියෝජිතයන් වෙත ආරාධනයක් කරන බව පැහැදිළිය. අප විශ්වාස කරන අන්දමට යුද්ධයේ අතිශයින් අවාසනාවන්ත අත්දැකීම් හි ප්‍රතිඵලය වූයේ දහසකුත් එකක් අවස්ථාවන් ගිලිහී යෑමය. එහෙයින් අපගේ සුවිශේෂි වගකීම ලෙස වැළඳ ගත යුතු වන්නේ දෙවියන් වහන්සේ විසින් අප හමුවේ තබා ඇති සක්‍රීය සාමය සඳහා වූ ඇරියුමයි. මේ හා සබැඳිව කොමිසමේ වාර්තාවේ පූර්විකාවේ මෙසේ දක්වා ඇත. ‘ශ්‍රී ලංකාව දැන් පෙර නොවූ විරූ මොහොතකට මුහුණ පා සිටී. කලාතුරකින් මෙවැනි අවස්ථාවක් ඒ හා සමාන වැදගත් අභියෝග යන්ගෙන් තොරව උදාවී ඇත. (පිටුව 1) එය තවදුරටත් මෙසේ විස්තර කරයි. ‘කොමිසමේ නිර්දේශයන් සියලු පාර්ශවයන්ගේ එනම් රජයේ, දේශපාලන පක්ෂවල, සමාජයීය නායකයන්ගේ සහභාගිත්වයෙන් යුතු ක්‍රියාත්මක වීමේ රාමුවක් සැකසීමට පදනම දමා තිබේ. (පිටුව 2)

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමූළුව සෑම ලේඛනයකම ඓතිහාසික වශයෙන් යම් යම් සීමාවන් පවත්නා බැව් සිහි ගැන්වීමට කැමතිය. එහෙයින් කවර ලේඛනයක් මඟින් වුවද සියල්ලන්ගේ බලාපොරොත්තු සහ සෑම සියලු දෙනාගේ අවශ්‍යතා වලට පිළිතුරු ලබා දිය නොහැකිය. කෙසේ වෙතත්, උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ කොමිසමේ වාර්තාව, විශේෂයෙන් එහි නිර්දේශයන් වඩාත් සංවර්ධනාත්මක හා අනාගතය සඳහා බලාපොරොත්තු වලින් සමන්විතවේ. අප විශ්වාස කරන පරිදි එමඟින් දේශයට යහපත් පදනමකින් යුතුව වඩාත් අභියෝගාත්මක සහ අතිශයින් හිතකර කාර්ය සාධනයක් ජාතික ප්‍රතිසංධානය වෙනුවෙන් ලබා දෙයි. වාර්තාව මේ බලාපොරොත්තු සහගත ස්වභාවය උලුප්පා දක්වනුයේ මෙසේය. “කොමිසමේ ක්‍රියාකාරකම් මඟින් අතීතයේ සිදුවූ තුවාල සුවපත් කිරීමේ පැහැදිලි අවශ්‍යතාවක් පවතින අතර නිර්දේශයන් මඟින් දේශය ප්‍රතිසංධානය ඔස්සේ සියලු පීඩිතයන් හඳුනා ගනිමින්, ඔවුනට සාධාරණය ලබාදීම මඟින් ජාතික සමඟිය, සාමය සහ සමෘද්ධිය නැංවිය යුතුය. (පිටුව 6 ලේඛනය 1,7)

> **අපගේ විශ්වාසය නම් එහි නිර්දේශයන් බොහොමයක් ඇතිවූ තුවාල සුවපත් කිරීමට සහ සමෘද්ධිය, ප්‍රතිසංධානය රැගෙන ඒමේ සංවර්ධනාත්මක ගුණයෙන් යුතු වීම නිසා අන්තර් ජාතික පීඩනය සමහන් කිරීමට සමත් වන බවයි. මේ නිසා අප ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනුයේ මේ නිර්දේශයන් හැකි ඉක්මණින් ක්‍රියාත්මක කිරීම ඔස්සේ සාමය සහ ප්‍රතිසංධානය මේ මොහොතේ අතිශයින් අත්‍යවශ්‍ය සහ හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා කටයුතු කරන ලෙසයි.**

මේ නිසා ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය උදක්ම රජයෙන් ඉල්ලා සිටින්නේ සිය බලය උපයෝගි කරගනිමින් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා කළ හැකි සියල්ල ඉටුකිරීමට බලවත් සැලකිල්ලක් දක්වන ලෙසයි. එසේ නොවූ කල තවත් අනගි අවස්ථාවක් අප'තින් මඟහැරී යෑමට ඉඩ ඇති නිසා එවැන්නකට අපට අවසර නොමැත. අපගේ විශ්වාසය නම් එහි නිර්දේශයන් බොහොමයක් ඇතිවූ තුවාල සුවපත් කිරීමට සහ සමෘද්ධිය, ප්‍රතිසංධානය රැගෙන ඒමේ සංවර්ධනාත්මක ගුණයෙන් යුතු වීම නිසා අන්තර් ජාතික පීඩනය සමහන් කිරීමට සමත් වන බවයි. මේ නිසා අප ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනුයේ මේ නිර්දේශයන් හැකි ඉක්මණින් ක්‍රියාත්මක කිරීම ඔස්සේ සාමය සහ ප්‍රතිසංධානය මේ මොහොතේ අතිශයින් අත්‍යවශ්‍ය සහ හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා කටයුතු කරන ලෙසයි. අපගේ විශ්වාසය නම් එහි නිර්දේශයන් බරපතල හා අවංක ඕනෑකමකින් ක්‍රියාත්මක කිරීම ඔස්සේ අපගේ සදාදරණීය මවුබිමේ ජාතික එකමුතුව හා සමෘද්ධිය ස්ථාපිත කිරීමට වැඩි වැඩියෙන් දායක විය හැකි බවයි.

අප ඉතා ඕනෑකමින් රජයෙන් ඉල්ලා සිටින්නේ සංකේතාත්මක ප්‍රතිචාරයන් හා ක්‍රියාවන් මඟින් ජාතියේ සමෘද්ධිය සහ ප්‍රතිසංධානය ස්ථාපිත කිරීමට ඉදිරියට පැමිණෙන ලෙසය. මෙහිදී යම් යම් නිර්දේශ හඳුනා ගැනීමට අපට අවසර දෙන්න. වාර්තාව ජන සමූහයා අතර ව්‍යාප්ත කිරීමට අවශ්‍ය කර ඇත. මේ සඳහා වාර්තාව, විශේෂයෙන් එහි නිර්දේශයන් දේශයේ නිල භාෂා ද්විත්වයට පරිවර්තනය කළ යුතුය.

15 පිටුවට »

✠ අතිදැකුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමූළුවේ සභාපති

✠ අතිදැකුම් නෝබට් එම්. අන්ද්‍රාදි නි.ම.නි හිමි
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමූළුවේ මහලේකම්

කතෝලික සභාව හුදු ආයතනයක් නොව විශ්වාසයේ මහා පව්වකි

කාදිනල් හිමිපාණෝ මොරටු මෝදර රජත ජයන්ති මෙහෙයේදී ප්‍රකාශ කරති

කතෝලික සභාව යනු ආයතනයක් නොවන බවත්, රදගුරුවරුන්, පූජකවරුන්, දේවස්ථාන ඇතුලු සියලු දෙයින් පමණක් කිතුනු සභාව මැනීමට නොහැක. කතෝලික සභාව යනු කිතුනු විශ්වාසය තුළ ජීවත්වන්නාවූ සැම දෙනකුගෙන්ම සැදුම් ලත් මහා පව්වකි. එහි දේව ජනතාව සතු වගකීම වනුයේ මේ ලෝකයේ ජීවත්වන සැම දෙනෙකුගේම අභ්‍යන්තර ජීවිතය ප්‍රීතිදායක කිරීම සඳහා කැපවීම බව මොරටුව මෝදර හා. ජුසේ වාස් දෙව්මැදුරේ රජත ජයන්ති දේව මෙහෙයට එක් වෙමින් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.

අගරදගුරු පදවි ප්‍රාප්තියෙන් පසු මෝදර කුඩා කිතුනු සංඝය එතුමන් පිළිගැනීමද මිට සමගාමීව සිදුවූ අතර අළුත් පාලම මංසන්ධිය අසල්දී කාදිනල් හිමිපාණන් පිළිගැනීමෙන් අනතුරුව අලංකාරවත් පෙරහැරකින් දෙව්මැදුර වෙත කැඳවාගෙන එන ලදී. මොරටු කටුකුරුන්ද මීසම් සේවක ගරු ක්‍රිසන්තස් ප්‍රනාන්දු නි.ම.නි පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ කටුකුරුන්ද හා මෝදර කිතුනු ජනතාව එක්ව මෙය සංවිධානය කළ අතර ග්‍රාමයේ පූජක පුතුන් වන ගරු උදාර ධර්මරත්න නි.ම.නි පියතුමාගේ දායකත්වයද ලැබුණි.

අගරදගුරු හිමිපාණන්ගේ දිළිඳු සහන අරමුදල සඳහා මුදල් පරිත්‍යාග කිරීමද මෙහිදී සිදු විය. මංගල්‍ය අවස්ථාවට බෝධිරාජාරාමයේ පූජ්‍ය නල්ලූරුවේ විමල කීර්ති හා පාලිත ස්වාමීන් වහන්සේ සමඟින් මෝදර ජුම්මා මුස්ලිම් දේවස්ථානයේ මව්ලවි මොහොමඩ් ෆායුරුප් තුමන්ද, මොරටු නගරාධිපති මෝදර පොලිස් ස්ථානාධිපති ඇතුලු ආරාධිත පිරිසක් ද සහභාගි වුහ.

එඬේරමුල්ල වාර්ෂික මංගල උත්සවය කොළඹ නැගෙනහිර කලාපීය නාහිමි අතිගරු ඇන්තනි ප්‍රනාන්දු පුල්ලේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මීසම් සේවක ගරු ඇන්ටන් ප්‍රේමලාල් පියතුමා අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමන් සමඟ සහායක පියතුමන් කැඳවාගෙන පැමිණි අයුරු.

එච්. ඒ. කල්දේරා

නායකකන්දේ ජේසු බිළිඳු නොවානයක් ඇරැඹේ



ආශ්චර්යවත් ජේසු බිළිඳුන්ගේ නුවානය දැන් සෑම සිකුරාදා දිනකම පස්වරු 6.15 ට හැඳල නායකකන්ද සා. මරියා දෙව්මැදුරේදී පැවැත්වෙයි. නුවානය පැවැත්වීම ආරම්භ කර ඇත්තේ දෙව්මැදුරේ 150 ජයන්ති මහෝත්සවය නිමිත්තෙනි.

පිටරටින් වැඩම කරවන ලද ආශ්චර්‍යවත් ජේසු බිළිඳුන්ගේ විශාල ප්‍රමාණයේ ප්‍රතිමාවක් දෙව්මැදුර තුළ ස්ථාපිත කිරීම හා ආසිරි ගැන්වීම මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ ප්‍රධානත්වයෙන් නොබෝදා සිදුකරනු ලැබීය.

නායකකන්ද දෙව්මැදුරේ ජේසු බිළිඳුන්ගේ නුවානය පැවැත්වීම ආරම්භ කිරීමෙන් පසුව අවට මීසම් වලින් ද කතෝලික බැතිමතුන් සෑහෙන පිරිසක් එයට සහභාගි වීමට පටන් ගෙන ඇත. ප්‍රතිමාව ස්ථාපිත කිරීමෙන් අනතුරුව ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා එය ආසිරි ගැන්වූ අවස්ථාව මෙහි දැක්වේ.

නිමල් පෙරේරා

පළුගස්දමන විජයබාහුපුර සා. සෙබස්තියන් මුනි බැති පුද

අනුරාධපුර පදවියේ, පලුගස්දමන මීසමේ, විජයබාහුපුර ශු. සෙබස්තියන් මුනිඳුන්ට කැපකර ඇති දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පසුගියදා පැවැත්විණ. මෙවර මංගල්‍යයේ විශේෂත්වය වූයේ, වීර සෙන්පතියාණන් වූ ශු. සෙබස්තියන් මුනිඳුන්ට තම භක්ති ප්‍රණාමය පුද කිරීම පිණිස මින්නේරිය යුඩ හමුදා කඳවුරේ 8 වන මධ්‍යම කාල තුවක්කු රෙජිමේන්තුවේ හට පිරිසක් සහභාගී වීමය.

මංගල මහ දිව්‍ය පූජා යාගයේදී විශේෂ අවධානය යොමු වූයේ, තම නිලය, බලය නොතකා, තම ජීවිතය වුවද පරදුවට තබා විශ්වාසයේ ගමන තුළ ආපසු හැරී නොබැලූ ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ ආදර්ශවත් ජීවිතය වෙතටය. මංගල්‍යයේ සියලු වැඩ කටයුතු මීසම් සේවක ගරු එමාඩ් ප්‍රනාන්දු පියතුමාගේ මඟ පෙන්වීම යටතේ සිදු වූ අතර, වැල්ලම්පිටිය, දෙමටගොඩ, මාදුරුඔය, තොඩුවාව වැනි ප්‍රදේශවලින් පැමිණි සැදැහැවතුන් ද ඒ සඳහා සහභාගී විය. දිව්‍ය පූජා යාගයෙන් පසුව, හමුදා නිලධාරීන් සහ හට පිරිස මීසම් සේවක පියතුමා සමඟ ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු.

රංජිත් මෙන්ඩිස්

චින්තක ද මැල්

අවිස්සාවේල්ලේ වැඩිහිටි උපහාර

අවිස්සාවේල්ල සා. මරියා දේවස්ථානයේ වාර්ෂික ලූර්දු දේවමාතා මංගල්‍යය මෙවරද 91 වෙනි වරට පැවැත්වුණි. එයට සමගාමීව මෙවරත් සා. චින්සන්ද පාවුලා සමිතිය විසින් අවිස්සාවේල්ල සංඝයේ පැරණි සාමාජික සාමාජිකාවන් ගැන සොයා බලා කැඳවීය.

ඔවුන්ගෙන් 25 දෙනෙක් පමණ දේවස්ථානයට පැමිණි අතර දිව්‍ය යාගයට සහභාගි වී දෙවිඳුන්ට තුති දී ගරු පියතුමාගේ රෝගීන්ගේ ආශිර්වාදයෙන් ද එතුමාගේ හැඟීම්බර අතීතාවර්ජනීය දේශනාවෙන් ද දිව්‍ය සත්ප්‍රසාද ලැබීමෙන් ද සම්පූර්ණත්වයට පත්වූහ.

බුලත් හුරුළු දී සාමාජික සාමාජිකාවන් විසින් ඔවුන් සැම පිළිගෙන ප්‍රණීත ආහාර පානාදියෙන් ද සංග්‍රහ කරන ලදි. එහිදී ඔවුන්ගෙන් සමහරුන් විසින් ගීත ගායනා කරමින් අතීත මතක සටහන් යළි සිහිගන්වමින් ඉතා සතුටින් කාලය ගත කරනු පෙණිනි. සා. චින්සන්ද පාවුලා ලාංඡනය යෙදූ බඳුනක් සමඟ තිළිණ හා ශුද්ධ වූ දේශයෙන් රැගෙන ආ ජපමාලයක් ද ඔවුන් හට ලබා දුනි. මීසම් සේවක ගරු මැක්ෂිමස් රුද්‍රිගුපුල්ලේ සහායක ගරු ටෙරන්ස් ප්‍රසංග පියතුමන්ගේ මූලික අධීක්ෂණයෙන් මෙම උත්සවය පැවත්විය.

රේමන් කැලිස්ටස්

මග්ගොන කල්වාරි ජාතික පුදබිම

ශ්‍රී ලංකාවේ ඉපැරණිම කල්වාරිය ලෙස මග්ගොන කල්වාරි ජාතික පුදබිම සැලකේ. 1891 දී නිමල මරිය නිකායේ පියවරුන් සාන්ත විසෙන්ති නිවාසය පාලනය කිරීමට බාරගත් අතර, එවකට සිටි රදගුරු හිමිපාණන්ගේ මූලිකත්වයෙන් ඉහත කී ආයතනයේ පාලනය ගරු චාල්ස් කොන්රඩ් පියතුමාට පැවරුණි. මේ ආයතනයේ ගරු ජෝසප් ගොන්සාල්වේස් ස්වදේශීය ප්‍රැන්සිස්කාන සහෝදරතුමා, කල්වාරිය නිර්මාණය කිරීම සඳහා, ළමා නිවාසය හා චරිත ශෝධනාගාරයේ (දැන් 'සුසිතෝදය') දරුවන්ගේ සහයෙන් මහ වනය එළිපෙහෙළි කර, කඳු මුදුනේ බැම්මක් හා විශාල ලී කුරුසයක් සිටුවා ස්ථාන 13 ට කුඩා ලී කුරුස සිටුවා, පාදනමස්කාරය කිරීමට හැකිවන අයුරින්, කල්වාරියේ වැඩ කටයුතු සෑහෙන අන්දමකට නිමා කළේය. එවකට පාලකව සිටි, ගරු සිදෝර් බෙල් නි.ම.නි පියතුමා වසර 1900 දී මෙම කල්වාරිය ආසිරි ගන්වා ප්‍රථම මංගල දිව්‍ය පූජාව සිදු කළේය.

වසර 1905 දී ගරු බෙල් නි.ම.නි. පියතුමා රෝමයට ගිය අවස්ථාවේදී, මග්ගොන කල්වාරියට ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන ප්‍රමාණයේ ලෝකඩ ප්‍රතිමාවක් ලබා ගැනීමට හැකිවිය. වසර 100 ටත් වඩා පැරණි අතීතයක් ඇති එම ලෝකඩ ප්‍රතිමාව, අදත් මග්ගොන කල්වාරි කඳු මුදුනේ පිහිටා ඇත. 1965 මාර්තු මස එවකට ගාලු රදගුරු අති උතුම් ඇන්තනි ද සේරම් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් එය ආසිරි ගන්වා විවෘත කරන ලදී.

කොළඹ වෙළෙඳ ව්‍යාපාරික මහතකුගෙන් ලැබුණු මුදල් පරිත්‍යාග යකින්, කල්වාරියේ ගල්ලෙන වැඩකටයුතු නිමා කොට එය ගරු ඩී. ඒ. දසනායක නි.ම.නි පියතුමන් විසින් ද, 1966 වර්ෂයේ මාර්තු මසදී නව ජෙත්සෙමෙනි උයන, කොළඹ පදවියේ අනුනායකව සිටි අතිගරු බැසිල් වීරතුංග නි.ම.නි පියතුමන් විසින් ද, ආසිරි ගන්වා විවෘත කරන ලදී. කල්වාරියට අඩුවක්ව පැවති මහ සිකුරාදා තුන්පැය ධ්‍යානය සඳහා උපයෝගිකර ගන්නා ප්‍රතිමාව හා ලී කුරුසය, ගරු මයිකල් කෘස් නි.ම.නි පියතුමන්ගේ පාලන කාලයේදී ලබාග ැනීමට හැකිවිය. එම ප්‍රතිමාව, දියලගොඩ මංසන්ධියේ සිට බැතිමතුන් සහභාගි වූ පෙරහැරකින් කල්වාරිය දක්වා පාදනමස්කාරයෙන් ගෙන ආ බව සඳහන් වේ. මෙම පුදබිමේ 75 වන ජුබිලි සමරුව ශුද්ධාසනයේ ශ්‍රී ලංකා නියෝජිතව සිටි, අතිඋතුම් කාර්ලෝකුරිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ඉතා ගාම්භීරව සිදුකරන ලදි.

වසර 112 ක අතීතයකට හිමිකම් කියන මග්ගොන ඓතිහාසික කල්වාරිය, ජාතික පුදබිමක් ලෙස 2008 අගෝස්තු මසදී රජය විසින් ප්‍රකාශයට පත්කරන ලදී. වත්මන් අධ්‍යක්ෂ ගරු ශ්‍රියාන් රණසිංහ පියතුමා ඇතුළු නිමල මරිය නිකායේ පැවදි හවුල මෙහි පැමිණෙන වන්දනාකරුවන් සඳහා අවශ්‍ය සෑම පහසුකමක්ම ලබාදීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කර ඇත.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

ඔබ බෙල්ලකු නොවී මුතු බෙල්ලෙක් වන්න

ඔබ බෙල්ලෙක් නොවන්න. ඔබ මුතු බෙල්ලකු වන්න. මන්ද තම මාංශ ඉරී ලේ වගුරමින් අධික වේදනාවකට, පීඩාවකට භාජනය වෙමින් තම සිරුරට ඇතුළු වන වැලි කැටය ඉතා අනගි වටිනා මුතු ඇටයක් බවට නිර්මාණය කිරීමේ හැකියාව මුතු බෙල්ලකු සතු වේ යැයි කුඩාගම මීසම් සේවක ගරු ජීවන්ත පීරිස් පියතුමා හේවාදිවෙල ශු. ජපමාල රාජේශ්වරි දෙව්මැදුරේ ධර්ම විවේකයේ දී පැවසීය.

එහිදී වැඩිදුරටත් කතා කළ එතුමා අපේ සිත ගත් විට එය හරිම චංචලයි. හරියට මහ මුහුද වගේ. ඒකෙ රැළි නැගීම ඉවරයක් නෑ. නමුත් ලෝකේ කොහේවත් නැති නිශ්චල බවත්. සුන්දරත්වයත් මහ සයුර මැද තියෙනවා. සමිඳාණන් වහන්සේ අපට කියනවා "නිශ්චල වන්න, මම දෙවිඳාණන් බව සිතට ගන්නැයි" පැවසීය.

හේවාදිවෙල ශු. ජපමාල රාජේශ්වරියගේ දෙව් මැදුරේ තරුණ සංගමය මෙම මේ ඥාන කාන්තිය සංවිධානය කිරීම සඳහා බැතිබර දායකත්වයක් ලබාදුන්නේය.

අහිංසා මධුමාල්

නුවරඑළිය නාසරෙත් පුහුණු ආයතනයට සංචාරක ක්ෂේත්‍රයේ නව පාඨමාලා

ශ්‍රී ලංකා කාර්මික පුහුණු ආයතනය යටතේ දියගල ළමා නගරයට අනුබද්ධිත සංචාරක හෝටල් පුහුණු පාසල නුවරඑළිය හාවාඑළිය නාසරෙත් පුහුණු මධ්‍යස්ථානයේ දී පසුගියදා ආරම්භ විය. ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) සහතිකය ප්‍රදානය කරමින් තෘතීය වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පූර්ණ අධීක්ෂණය හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සහයෝගයෙන් මේ පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

මෙම පුහුණු ආයතනය නොබෝදා විවෘත කළ අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ නුවරඑළිය දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ නිරෝෂන් පෙරේරා මහතා සහ දියගල ළමා නගරයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගි වූ අයුරු.

බෙනී ප්‍රනාන්දු

චතාරික සමය අවශ්‍ය වන්නේ ඇයි?

චතාරික සමය කිතුනු අපට ආශිර්වාදාත්මක කාලයයි. එය සභාවේ වසන්ත සමය වශයෙන් නම් කිරීම නිවැරදි ය. කිතුනු අපට නව මිනිසකු වන්නට නව ජීවිතය දෙන්නාවූ සමයකි. දින 40 ක් තුළ විශේෂ සූදානමකින් යුතුව කිතුනු අප චතාරික සමය අවසානයේ දී ක්‍රිස්තුන් වහන්සේගේ විජයග්‍රාහී මංගල්‍යය ස්මරණය කරමු. උත්සවාකාරයෙන් පවත්වමු. පාස්කු මංගල්‍යය නොමැතිව චතාරික සමය පමණක් පැවැත්වීම අර්ථ ශූන්‍ය ක්‍රියාවකි. මෙම මුළු සමස්ත කතෝලික සභාවේම ශ්‍රාද්ධකාන්ති කාලය ලෙස හැඳින්විය හැකිය. චතාරික සමය අවසානයේ දී අප පවත්වන පාස්කු මංගල්‍යය තවත් වැදගත් මංගල්‍යයක් ලෙස අප සැළකුවත් අනිකුත් සියලු මංගල්‍යයන්ට අරුත් දෙන්නේ මෙම මහා මංගල්‍යයි. මහ සිකුරාදාට නියම අරුත දෙන්නේ පාස්කු ඉරිදායි.

දින 40 තුළ පශ්චාත්තාපික ක්‍රියාවලියට සභාව යොමු කිරීමේ ක්‍රියාවලියේ පසුබිම වන්නේ ජේසු සමිඳුන්ගේ දින 40 ක් තුළ නිරාහාර ශීලය රකිමින් යාච්ඤාව තුළ කාන්තාරයේ දී තම මරණයට හා උත්ථානයට සූදානම් වීමයි. ගැළවීමේ මහා ක්‍රියාවට සූදානම් වීමයි. සභා ඉතිහාසයේ සමහර යුග වලදී මහා සිකුරාදාවට වැඩි සැළකිල්ලක් දී ඇති අතර නිරාහාරශීලයේ වැදගත්කම විදහා පා තිබේ. මේ නිසා සමහර මිසම්වල පවා මහා සිකුරාදා දිනවල තුන් පැය ධ්‍යානය පැවැත්වීම භක්ති අභ්‍යාසය පවත්වා, වැඩි සැළකිල්ලක් එයට දී ඇත. ක්‍රිස්තුත්ථානයත්, මරණය උළුප්පා පෙන්වීමට උත්සාහ කර තිබේ. වික්ෂේප අභිරහස් වලට වැඩි අවධානයක් යොමු කර ඇති අතර, පාස්කුවේ, ආනන්දජනක අභිරහස්වලට එතරම් සැළකිල්ලක් යොමු කර තිබෙන බවක් නොපෙනේ. එපමණක් නොව නිරාහාර ශීලය රැකීම ඉතාම සුලභ භක්ති අභ්‍යාසයක් වූ අතර, සමහර ප්‍රාදේශීය කිතුනු සභාවල මෙය අනුග මනය කිරීම අකුරටම සිදු කරන ලදී.

නමුත් පසු කාලයේ දී අති උතුම් සයවන පාවුළු පාප්තුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලද "Poenitsmini" නමැති ධර්ම ප්‍රකාශයට අනුව නිරාහාරශීලය රැකීම අරුත් බර කිරීම සඳහා ද අපගේ භක්ති අභ්‍යාස අරුත්බරව කිරීම සඳහා, දයාවේ ක්‍රියාවල ඇති වැදගත්කම පෙන්වා දී ඇත. ප්‍රේමය නැති නම් මෙම ක්‍රියාවලින් වැඩක් නොමැති බව පෙන්වමින්, දෙව් වදනේ පසුබිම හා මේ සඳහා එහි විශේෂත්වය පෙන්වා දී ඇත. "I had charity not Sacrifice"

> **චතාරික කාලයේ අප කරන භක්ති අභ්‍යාස යොමු කළ යුත්තේ අපගේ ආත්මාර්ථකාමී බව බිඳ දමා, පරාර්ථකාමී දිවියකට යොමු වීමටත්, ජේසු සමිඳුන්ගේ හදවතට ළං වීමටත් ය.**

එසේ ම දෙවන වතිකාන කතිකාවට අනුව චතාරික කාලය ජනවන්දනාවේ වෙන්කර ඇත්තේ අපගේ කිතුනු ඇදහීම පිළිබඳව ආපසු සිතා බැලීමට යි. දෙවි සමිඳුන් ප්‍රසාද ස්නාපනීය සක්‍රමේන්තුව මඟින් අපට දුන්නාවූ කැඳවීමට පටහැනිව අප ජීවත්වූවා නම් ඒ පිළිබඳව පසුතැවිලි වී නව මාවතකට පිවිසීමටයි. අන් අයව හෙළා දැක්කානම්, වෛර කළා නම්, පාවා දුන්නා නම්, වැරදි මාර්ගයේ ගමන් කළා නම් තම සහෝදරයාට ඊර්ෂ්‍යා කළා නම් මෙම අසිරිමත් කාලයේ දී, වෙනස් වී, අලුත් වී, යාච්ඤා මඟින් සූදානම් වෙමු.

වතිකාන කතිකාවට පෙර කිතුනුවන් මෙම කාලයේ දී විශේෂයෙන්ම ශරීරයට වද හිංසා පමුණුවාගෙන පශ්චාත්තාපික ක්‍රියාවල යෙදුනු බව සභා ඉතිහාස පොත්වල සඳහන් වේ. ඒ නමුත් දෙවන වතිකාන කතිකාවේ ඉගැන්වීම් වලට අනුව චතාරික කාලය විශේෂයෙන් අපට වෙන්කර ඇත්තේ දෙවිඳුන් සමඟ සමගි වීමටත්, අපගේ සහෝදරයින් සමඟ අමනාපකම් අතහැර සමගි වීමටත් තිබෙන වාසනාවන්ත කාලයක් ලෙසයි. මෙම හැරී ඒමට ග්‍රීක් බසින් භාවිතා කර ඇත්තේ MSTNOIA' - CONVERSION OF HEART' හෙවත් දෙවිඳුන් වෙත හැරී ඒමයි. ජේසු සමිඳුන් තම දූත කාර්ය ආරම්භ කරන්නේ පශ්චාත්තාපයට ආරාධනා කරමිනි. "පශ්චත්තාප වන්න. සුබ අස්න අදහා ගන්න" යනුවෙනි.

චතාරික කාලයේ අප කරන භක්ති අභ්‍යාස යොමු කළ යුත්තේ අපගේ ආත්මාර්ථකාමී බව බිඳ දමා, පරාර්ථකාමී දිවියකට යොමු වීමටත්, ජේසු සමිඳුන්ගේ හදවතට ළං වීමටත් ය. එබැවින් පාපයෙන් ජයග්‍රහණය කරා එතෙර වීමත්, අඳුරෙන් ආලෝකය කරා යාමටත්, වහල් බවින් නිවහල් බාවය කරා යාමටත් සියලු දේට වඩා පාපය නමැති මරණය ජයග්‍රහණය කරා යාමටත් මෙම කාලය අපට උදව් වේ.

ප්‍රසාද ස්නාපනය සක්‍රමේන්තුව මඟින්, අපට දෙවිඳුන් කරා යන වන්දනා ගමනකට යොමු කර තිබේ. එය එක්තරා විදියක තවත් පාද නමස්කාරයකි. සෑම කිතුනුවකුටම මෙම ගමන යාමට අභියෝග කරනු ලැබේ. එසේ හෙයින් පෞද්ගලික අපි එකිනෙකා ද පවුල් වශයෙන් හා මීසම් වශයෙන් ද සමස්තයක් ලෙස සභාවක් ලෙස මෙම ගමනට යොමු වෙමු. ඒ ආශිර්වාදය ලබා ගනිමු.

✍ **අතිගරු ජේ. පැට්‍රික් පෙරේරා පියතුමා**

කුරුසියේ පාමුල

දොහොත් මුදුනින් වැඳ වැටී
අල්තාරය ළඟ යැදුම් දී
හදවතේ ගැඹුරින් ආදරය ගැන අසා
අනාදරයෙන් දිවි ගෙවන්නේ
වතාවත් කොට සුදු හදවතින්
පිරිසිදුව ප්‍රේමය උගෙන
සැදැහැවතුන් යළි එළි බසී

පල්ලියේ මහා දොරටුවෙන් නික්මී
දෙව්මැඳුරේ අස්නේ තමන් ළඟ හුන්
පූජ ගන්නට එකට පෙළ උන්
සැදැහැවතා හා අංශු මාත්‍රයක්වත්
හිනා පුලුටක් හෝ නොපෙන්නා
ඇඟේ හැපුනත් රොබෝවකු සේ
කොහොම ඉන්නෙද මිනිස් වෙස් ගෙන

✍ **ඩෙන්සිල් නුගේගොඩ**

දේව අභිමතයට ඉඩ දීම සැබෑ කිතුනු කමකි

අප බොහෝ දෙනා අපගේ කිතුනු ජීවිත හසුරුවා ගන්නේ අපගේ අභිමතය පරිදියි. අපට කැමති විදයට පින් දහම් කටයුතුවල යෙදීමෙන් හා ආගමික වත්පිළිවෙත් වලට සහභාගි වීමෙන් ය. එසේ කරන්නේ එය දේව කැමැත්තට ඉඩ දීමක් යයි අප විසින්ම තීරණය කිරීමේ හේතුවෙනි. දේව කැමැත්තට ඉඩ දීම යන්නෙන් අදහස් වන්නේ මෙසේ කටයුතු කිරීම නොවේ. දෙවිඳුන්ට අපගේ ක්‍රියා වචන හා සිතිවිලි හැසිරවීමට ඉඩ දීම තුළින් පමණක් එම කටයුතු සාර්ථක වේ. අප සමිඳාණන් එසේ කරන්නේ කෙසේ දැයි අපට ඉතා පැහැදිලිව කියා දුන් සේක. "යමෙක් මා අනුව එන්ට කැමැත්තේ ද ඔහු තමකම නසා, දිනපතා සිය කුරුසිය දරාගෙන මා අනුව ආවාවේ" (ලූක් 9:23). එසේ ආරාධනා කරන්නේ ඔවුන් වහන්සේ ද තම කුරුසිය කරපිට තබාගෙන අවසානය දක්වා ම තම මෙලෝ ජීවිතය ගතකොට එම කුරුසය මතම තම ජීවිතය අප සඳහා පූජා කළ නිසාය. එසේ කිරීමට සූදානම් වන අවස්ථාවේ දී ද ඔවුන් වහන්සේ ගෙත්සෙමෙනියේ දී මෙසේ ද වදාළ බව අපි දනිමු. "අබ්බා පියාණෙනි, ඔබට සියල්ලක් ම කළ හැකිය. මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව;" (මාක් 14:36). අප සමිඳාණන්ගේ මෙම වදන් සියල්ල හා සම්බන්ධවූ ඔවුන් වහන්සේගේ ජීවිත ආදර්ශය වූයේ සැම විට දේව අභිමතය ඉටු කිරීම පමණි. එම ආදර්ශවත් ජීවිතය අප කිතුනුකම රැකීමට අවශ්‍ය බව ඔවුන් වහන්සේ අපට එසේ පෙන්වා දුන් සේක. එම නිසා අපගේ කිතුනුකම සැබෑ ලෙසින්ම පූර්ණත්වයට පැමිණෙන්නේ ද එම මාවත ඔස්සේ ගමන් කිරීමෙන් පමණි. ඔබගේ කැමැත්ත ඉටුවේවා යි යදිමු.

✍ **ආර්. වී. ඒ. නවරත්න**

ධර්ම සංග්‍රහය

කිතුනුවන් වශයෙන් අපගේ ප්‍රධානතම අරමුණ විය යුත්තේ අප සමිඳාණන්ට සාක්ෂි දරමින් කිතුනු ජීවිත ගත කිරීමයි. එසේ කිරීමට අප තුළ ප්‍රගුණ කළ යුතු ප්‍රධානතම ගුණාංගය විය යුත්තේ අපග් සියලු ක්‍රියා, වචන හා සිතුවිලි දේව අභිමතයට අනුකූල වන සේ හැසිරවීමය. මෙය ඉතා පැහැදිලිව ජේසු සමිඳාණෝ තම ජීවිත කාලය තුළ විදහා දැක්වූ සේක. ඔවුන් වහන්සේගේ මෙලොව ජීවිතය මුළුමනින්ම පදනම් වූයේ දේව කැමැත්තට ඉඩදීම තුළය. ඔවුන් වහන්සේගේ වදන්වල එය නිතරම ප්‍රකාශ වුනු බව අපි දනිමු. ස්වර්ගයෙහි වැඩ සිටින මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට, "ස්වාමිනී, ස්වාමිනී"යි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෝ ය."(මතෙව් 7:21) මෙය ඉතා පැහැදිලිව අවබෝධ කර ගැනීම අපට ඉතා වැදගත් ය.

ස්මිර්නාහි රදගුරු තුමා වූ ශාන්ත පොලිකාප් තුමා විසින් පිලිප්පිවරුනට ලියන ලද හසුන.

"පොලිකාප් සහ එතුමා සමඟ වෙසෙන ප්‍රෙස්බිටවරුන් (වැඩිහිටියන්) වෙතින් පිලිප්පි හි තාවකාලිකව චාරිකා කරන දෙවියන් වහන්සේගේ සභාව වෙතටයි. අපගේ ගැලවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සහ සර්වබලධාරී දෙවියන් වහන්සේ වෙතින් දයා කරුණාවත්, සාමයත් නුඹලා තුළ වැඩි වර්ධනය වේවා.

මම නුඹලා සමඟ අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ අතිශයින් ප්‍රීති ප්‍රමෝද වෙමි. ඒ තුළ නුඹලා සත්‍ය ප්‍රේමයේ අනුරූපයෙන් ආදරයෙන් පිළිගෙන ඇත.

එසේම නුඹලාට අවස්ථාව ලබා දී ඇති ආකාරයට විලංගු වලින් බඳින ලද සාන්තුවරයන් බවට පත් වූ, සත්‍ය වශයෙන්ම දෙවියන් වහන්සේගේ සහ අපගේ ස්වාමියාණන්ගේ සත්‍ය තෝරා ගැනීමේ කිරීටය වන එම මිනිසුන් හට නුඹලා සහය වී ඇත.

එසේම පුරාණ කාලයේ සිට ජනප්‍රිය වූ නුඹලාගේ ස්ථිර විශ්වාසයේ මූලය, මරණයට මුහුණ දීම සඳහා වුවද අපගේ පාපයන් දරා ගත්, දෙවියන් වහන්සේ විසින් මරණ බන්ධනයෙන් මුදා උත්ථාන කර වදාළ අපගේ ස්වාමියාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් තවමත් පවතින නිසා සහ එල දරන නිසා ද මම තවත් ප්‍රීති ප්‍රමෝද වෙමි.

උන්වහන්සේ තුළ "ඔබ උන්වහන්සේ නුදුටු නමුත් උන්වහන්සේට ප්‍රේම කරන්නහුය.. දැන් ඔබ උන්වහන්සේ නො දකින නමුත්, උන්වහන්සේ අදහා.. කියා නිම කළ නොහැකි, තේජාන්විත මහා ප්‍රීතියකින් ප්‍රීති වන්නාහුය" (1 පේදුරු 1:8-12).

"ඔබ ගැලවී සිටින්නේ දේව වරප්‍රසාදය මඟින් වූ ඇදහීම කරණකොට ගෙනය. එය ඔබගේ ක්‍රියාවක් නොව දෙවියන් වහන්සේගේ දීමනාවකි (එපීස 2:8).

එබැවින්, නුඹලාගේ ඉඟටිය සත්‍යය නමැති පටියෙන් බැඳගෙන සමිඳුන් හට ගරු බියෙන් සේවය කරන්න. එබැවින්, සමූහයාගේ නිරර්ථක වාද විවාද වලින් සහ

සභා පියවරු 28 කොටස

මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි

ස්මිර්නාහි පොලිකාප් තුමා

අසත්‍ය ඉගැන්වීම් වලින් අහක් වී අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව මරණයෙන් උත්ථාන කර මහිමයට පත් කළ සහ තම දකුණු පස සිංහාසනාරූඪ කරන ලද දෙවියන් වහන්සේ අදහා ගනිමින් ස්වර්ගයෙහි ද, පොළොවෙහි ද සියලු දෙය තම වසඟයට ගත්තාවූ ජීවමාන සියල්ලන් සේවය කරන ජීවත් වන්නවුන්ගේ ද මළවුන්ගේ ද විනිශ්චකාරයාණන් වශයෙන් පැමිණෙන, ස්වාමින් වහන්සේව අනුගමනය කරන්න.

මන්ද, අප නොමනා ක්‍රියාවන්ගෙන් ද, ධන තෘෂ්ණාවෙන් ද, මුදලට ඇති ආදරයෙන් ද, අපවාදයෙන් සහ බොරු සාක්ෂි කීමෙන් ද වැළකී, නපුරට නපුරවත්, නින්දාවට නින්දාවවත්, පහරට පහරවත්, සාපයට සාපයවත් නොකර ස්වාමින් වහන්සේ තම ඉගැන්වීම් වලදී පවසන ලද දේවල් පමණක් සිහි කරමින්, එතුමාණන්ගේ අභිප්‍රාය ඉටු කරමින් සහ එතුමාණන්ගේ පනත් අනුග මනය කරමින්. එතුමාණන් ප්‍රේම කළ දෙයට ප්‍රේම කරමු නම් ස්වාමින් වන ජේසුස් වහන්සේ උත්ථාන කළ දෙවියන් වහන්සේ අපව ද උත්ථාන කරන සේක.

විනිශ්චය නොකරන්න, එවිට නුඹලාවද විනිශ්චය කරනු නොලබන්නෙහි ය. සමාව දෙන්න, එවිට නුඹලාට ද සමාව දෙනු ලැබේ. දයානුකම්පා ඇතිව සිටින්න, එවිට නුඹලාට ද නුඹලා අනුන්ට දෙන මිම්මෙන්ම නුඹලාටත් දෙනු ලැබේ.

දිළිඳු සහ ධර්මිෂ්ඨකම උදෙසා හිංසා පීඩා විඳින නුඹලා භාග්‍යවන්තයෝ ය. මන්ද දේව රාජ්‍යය ඔවුන්ගේ ය. සහෝදරවරුනි, ධර්මිෂ්ඨභාවය පිළිබඳව මෙම දේවල් මා ලියනුයේ මාගේම උදාහරණය නිසා නොව, ප්‍රථමයෙන් නුඹලා විසින් එසේ කරනු සඳහා මා හට ආරාධනා කළ නිසාය.

තම කාලයේ පරම්පරාවන් සමඟ මුහුණට මුහුණලා සිටි කාලයේ දී, ස්ථිර ලෙස සහ නිවැරදිව සත්‍යයේ වචනය ඉගැන් වූ ආශිර්වාදලත් සහ කීර්තිමත් පාවුලු තුමාගේ ප්‍රඥාව ස්ථිර ලෙසම මා හට හෝ මා වැනි වෙන අයකුට අනුගමනය කළ නොහැකි ය.

එසේ ම අප සැමට මාතාවක් ලෙස දෙනු ලබන ලද බලාපොරොත්තුව සහ එක්ව සහ දෙවියන් වහන්සේ සහ ක්‍රිස්තුන් වහන්සේ සහ අපගේ අසල්වැසියාට දක්වන ප්‍රේමය මඟින් මෙහෙයවනු ලැබූ ඇදහිල්ලෙහි වර්ධනය වීම සඳහා එතුමා නොමැති අවස්ථාවල නුඹලා හට ලිපිය ලියූහ.

ලබන සතියට ...

ජන වන්දනාව

යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

(පසුගිය සතිය හා සබැඳේ)

149 වැනි ගීතය

"සමිඳාණන් පසසන්න" යන යෙදුම් අවධාරණාත්මක ලෙස පෙන්නුම් කරන ගීත රැසක් ගීතාවලිය ග්‍රන්ථයෙහි අඩංගුය. (උදා : ගීත 111 - 118, 146 - 150). මෙම ගීතය ද එම කේන්ද්‍රීය අදහස රැගත් ගීතයක් වන අතර මුල් පදයත් අවසාන පදයත් "සමිඳාණන් පසසන්න" යන ඉහත යෙදුමින්ම දැක්වේ. දෙවියන් වහන්සේගේ මැදහත්කම නිසා ජීවිතයෙහි උදාවන ජයග්‍රහණය ඇදහිලිවන්තයාගේ නිරන්තර ප්‍රශංසාවට හේතුව වන්නේ ය. මෙම ගීතයේ පදවැල් තුළින් ජනවන්දනාත්මක ලක්ෂණ ද දිවැසිවර ඉගැන්වීම්වල ලක්ෂණ ද නිරීක්ෂණය කළ හැකිය. මෙම ගීතය ප්‍රශස්ති ගීයකි.

ලේඛන සැලැස්ම :
වගන්ති 1 - 5 : ජයග්‍රහණය වෙනුවෙන් සමිඳුන්ට ප්‍රශංසා කිරීමට ඇරියුම් කිරීම.

වගන්ති 6 - 9 : ජයග්‍රහණයේ බලාපොරොත්තුව සහ සතුරන්ට හිමිවන විනිශ්චය

විග්‍රහය සහ අරුත

(අ) වගන්ති 1 - 5)

මෙම ගීතයේ පළමු කොටස තුළ ප්‍රශංසාවේ ගායනය සඳහා හවුල් වීමට කෙරෙන ඇරයුම් මාලාවක් අපට නිරීක්ෂණය කළ හැකිය. එය ගීත සාහිත්‍යයෙහි කැපී පෙනෙන ලක්ෂණයකි. (100 සහ 135 වැනි ගීත) ඒ තුළින් පැහැදිලි අරමුණක් මෙන් ම අවධාරණයක් ද ධ්වනිත වේ. අපගේ ජනවන්දනා කටයුතුවලද යෙදෙන "ආලේලූයා" (දෙවි සමිඳුන් පසසන්න) යෙදුම තුළින් ප්‍රශංසාව යාච්ඤාවේ ආකල්පයක් ලෙස අපට මනාව අවබෝධ කරගත හැකිය.

නව ගීතිකාවක් : ජයග්‍රහණය සහ විමුක්තිය සමිඳුන් වෙතින් හිමිවීම නව අත්දැකීමක් ලෙස ශුද්ධ ලියැවිල්ල තුළ සඳහන් වේ (යෙසායා 42:10).

සැදැහැවතුන්ගේ සභාවේ දී: ජනවන්දනා පිළිවෙත් සඳහා දෙව් මැඳුරට රැස්වන ජනතාව තම ජීවිත ගමන තුළ සමිඳාණන් වහන්සේ ලබා දෙන ජයග්‍රහණයන් සිහිපත් කළ අන්දම මින් පැහැදිලි වේ. සැදැහැවත් ජනතාව මෙම ජයග්‍රහණය අධ්‍යාත්මික හා ශීල ධාර්මික අත්දැකීමක් ලෙස දකිති (ගීත 33:1).

තමන් මැවූ තැනැත්තන් වහන්සේ කෙරෙහි : මෙලොව සෑම ක්‍රියාකාරිත්වයක්ම මැවුම්කාර දෙවි සමිඳාණන්ගේ අණසක යටතේ පවතින බව ශු. බයිබලීය සම්ප්‍රදායන් අවධාරණය කරයි (උත් 1:31, ප්‍රඥා 9:1-3, ගීතා 19:1).

ජය සිරියෙන් : හෙබ්‍රෙව් බසින් එන "යෙෂුවා" යන වදන පරිවර්තනය වන්නේ "ගැලවීම" යනුවෙනි. දේව ජනතාව දෙවි සමිඳාණන්ට තුති පැසසුම් දීමට ද ප්‍රීති සංතෝෂ වීමට ද පදනම වන්නේ උන්වහන්සේ වෙතින් ඔවුන් ලබන ගැලවීමය (ගීතා 118:1).

(ආ) වගන්ති 6 - 9)

මෙම දෙවැනි කොටසේ ඇත්තේ මුල් කොටසට වඩා වෙනස් භාෂා හා ලේඛන ශෛලියකි. එය යුද්ධ ජයග්‍රහණ හා විනිශ්චයේ පසුබිමින් විස්තර වේ. දෙවියන් වහන්සේ අයහපතේ බලවේග අභිබවා ජයගන්නා අතර දේව ජනතාව තම කැඳවීම අනුව අවසාන ජයග්‍රහණය තෙක් ස්ථිරසාරව සිටිය යුතු බව මින් හැඟවේ. එය ජයග්‍රහණය ජනවන්දනාව තුළ සැමරෙන්නේ ය.

දෙමුවහත් කඩුවක් : මෙය එළිදරව්වාදී සාහිත්‍යයෙහි යුගාන්ත සටන හඟවන රූපකයකි (එළිදරව්ව 1:16, 19:15). ඉන් දෙවියන් වහන්සේගේ වචනයේ හා ආඥාවේ බල මහිමය විදහා දැක්වේ.

පළිගැනීම : මෙය විනිශ්චය ආශ්‍රිතව යෙදෙන වදනකි. ගැලවීම සලසාලන දෙවි සමිඳාණන් යහපත් අයට වින කරන සතුරු බලවේගවලට

ශුද්ධ ලියැවිලි වසර

(05)

ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා

විනිශ්චයේ දණ්ඩනය පමුණුවන සේක (යෙසායා 61:2). මෙවැනි විනිශ්චයේ ප්‍රකාශන දිවැසි ග්‍රන්ථවල බොහෝ විට දිස්වේ (ජෝබ් 46 - 51 පරිච්ඡේද).

ගෞරවය : ජනවන්දනාව තුළින් දෙවි සමිඳාණන්ගේ මේ විජයග්‍රහණය සැමරීමට එක්වෙන දේව ජනතාවට එම ජයග්‍රහණයෙහි පංගුකාරයන් වෙමින් සොම්නස් විය හැකි බව මින් ප්‍රකාශ වේ.

යැදුම :

දෙවි සමිඳාණන් වහන්ස, අපගේ මැවුම්කාරයාණන් ද, ගැළවුම්කාරයාණන් ද වන ඔබවහන්සේට අපි හද පුරා තුති පැසසුම් දෙමු. අපගේ දෛනික ජීවිතය තුළ අපට ලබා දෙන සවිය, දිරිය, ආලෝකය වෙනුවෙන් සතුටු වෙමින් තුති පුදමු. අයහපත් බලවේග හමුවේ ඔබගේ නිරන්තර රැකවරණය කෙරෙහි විශ්වාසය තබා එඩිතරව ජීවත් වීමට අපට වරම් දුන මැනව. ආමෙන්.

පළමු සතිය : ඉරුදින සැළෑ යාම යැදුම්

110 වැනි ගීතය

වර්ගීකරණයට අනුව මේ ගීතය අයත් වන්නේ රාජකීය ගීත කාණ්ඩයට ය. නව ගිවිසුම තුළ මෙම ගීතය පිළිබඳ ඇති සඳහන වැදගත් වන්නේ එය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මෙසියානික දූත සේවාව විස්තර කිරීම සඳහා ශුභාරංචි ග්‍රන්ථ කතුවරුන් විසින් යොදා ගනු ලැබ ඇති හෙයිනි (මාක් 12:35-37). දෙවියන් වහන්සේ විසින් ආලේප කරන ලද රජ කෙනෙකුගේ කර්තව්‍යයත් පූජකවරයකුගේ කර්තව්‍යයත් මෙසියස් තුමාගේ දූතික සේවාව තුළ සංකලනය වී ඇති අන්දම මෙම ගීතයෙන් විදහා දැක්වේ. මූලික වශයෙන් මෙම ගීතය දාවිත් රජ පරපුරින් ආ රජ කෙනෙකුගේ ජෙරුසලමෙහි දී සිදුවූ අභිෂේකය අරබයා සම්පාදිත ගීයක් සේ දිස්වේ.

ලේඛන සැලැස්ම :
වගන්ති 1: රජතුමා වෙත යොමුවන පළමුවන දේව පණිවුඩයේ ප්‍රකාශය.

වගන්ති 2-3: රාජාභිෂේක පිළිවෙත හා ජනතා ප්‍රතිචාරය

වගන්ති 4: රජතුමා වෙත යොමුවන දෙවැනි දේව පණිවුඩයේ ප්‍රකාශය

වගන්ති 5-7: දෙවි සමිඳාණන් මඟින් හිමිවන ජයග්‍රහණය

විග්‍රහය සහ අරුත

(අ) වගන්ති 1)

සමිඳාණෝ කතා කොට : මෙය දේව අනාවරණය පිළිබඳ බොහෝ ලෙස යෙදෙන දිවැසි යෙදුමකි (යෙසායා 1:24). මගේ සමිඳුන්ට : හෙබ්‍රෙව් බසින් යෙදෙන "අදෝනි" යන්න ඊශ්‍රායෙලයේ රජවරුන් සඳහා භාවිතා වූ ඇමතුමකි.

(ආ) වගන්ති 2-3)

දෙවියන් වහන්සේ දාවිත් රජ වෙත දෙන ලද පොරොන්දුව අනුව එම පරපුරෙන් සිහසුනට පත්වන සෑම රජ කෙනෙකුටම දෙවියන් වහන්සේගේ ආශිර්වාදය හා රැකවරණය හිමි වන්නේය (2 සාමුවෙල් 7:8-14). නව ගිවිසුමෙහිදී මෙය සපිරෙන්නේ ජේසු සමිඳාණන් තුළිනි (මතෙව් 22:45).

ලබන සතියට ....

2012 දේව වචනයේ වසර - චතාරික සමයේ දෙවැනි ඉරුදින

තේමාව - මහිමයට පත්විය හැක්කේ පරිත්‍යාගය තුළින් පමණකි

පළමුවන කියවීම : උත්පත්ති 22:1-2,9,10-13, 15-18

තම පරපුර ඉදිරියට ගෙන යාම සඳහා වයස්ගතව සිටි කාලයේ දෙවියන් වහන්සේ දුන් තම පුත්‍රයා උන්වහන්සේගේම ඉල්ලීම පරිදි යාගයක් කොට ඔප්පු කිරීමට ආබ්‍රහම් කිසිදු පැකිළීමකින් තොරව සූදානම් විය. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගේ ඇදහිල්ල පිළිගනිමින් ආබ්‍රහම් ඔප්පු කිරීමට සූදානම් වූ යාගය වළක්වාලූ සේක. මෙසේ උන්වහන්සේ ආබ්‍රහම් පුත් ඊසාක් මරණයෙන් ගලවා ගත් සේක. තවද මෙමඟින් උන්වහන්සේට මිනිස් පූජා අනවශ්‍ය බව අඟවමින් එකල තිබුණු මිනිස් පූජා පිළිබඳව විරෝධය ද පල කළ සේක. මෙම පාඨය මඟින් ආබ්‍රහම්ගේ අචල විශ්වාසය ඉස්මතු කර දැක්වෙන අතර දරු පරපුරක් පිළිබඳ ඔහුගේ අපේක්ෂාව ද ඉටු වූ බව අවධාරණය කෙරේ.

දෙවන කියවීම : රෝම 4:31-34

දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගේ පුත්‍රයා මරණින් ගලවා ගත් නමුත්, උන්වහන්සේ පාපිවූ අප වෙත දක්වන නිමක් නැති ප්‍රේමය නිසා සිය ඒකජාතක පුත්‍රයාණන් පවා මරණයට පත්වීමට ඉඩ දුන් සේක. පාවුලු තුමා පවසන්නේ මෙවැනි දෙවි කෙනකු අප සමඟ සිටිත් නම් අපි කිසිවකුට හා කිසිවකට නොබිය විය යුතු බවයි.

ශුභාරංචිය : මාක් 9:2-10

කන්ද මත ප්‍රකාශ වූ ජේසුස් වහන්සේගේ තේජශ්‍රීය උන්වහන්සේ මුහුණ දෙන්නට යන කධ්‍යක මරණය නිසා බව පේදුරු තුමා ඇතුළු ශ්‍රාවකයෝ තේරුම් නොගත් හ. කන්ද මතට යාමට පෙර තමන් වහන්සේ දුක් විඳ මරණයට පත් විය යුතු බව තම ශ්‍රාවකයන් හට අවධාරණය කළ සේක (මාක් 8:31-33). කන්ද මතට උන්වහන්සේ ගෙන යන්නේ ගෙත්සමනි උද්‍යානයේ උන්වහන්සේගේ වේදනාව අත්දුටු පේදුරු, ජොහාන් හා ජාකොබ් ය (මාක් 14:33). "මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය" යන දෙවියන් වහන්සේගේ ප්‍රකාශය ජේසුස් වහන්සේ සමිඳාණන් වහන්සේගේ දුක්විඳින සේවකයා බව අපට සිහිගන්වයි (යෙසායා 42:1). එය ව්‍යවස්ථාවත් (මෝසෙස්) දිවැසාවලියත් (එලියා) එනම් මුළු පුරාණ ගිවිසුමත් අපේක්ෂා කළ බව පෙන්නුම් කරයි. උන්වහන්සේගේ තේජශ්‍රීය උත්ථානයේ පිළිබිඹුවකි. මෙය වඩාත් පැහැදිලි වන්නේ එම දර්ශනය ගැන උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වනතුරු කිසිවකුට නොකියන ලෙසට දුන් ආඥාව මඟින් ය.

මෙනෙහි කිරීම

දෙවියන් වහන්සේ කෙරෙහි තිරසාර ඇදහිල්ල, පරිත්‍යාගය හා අභියෝග වලින් පිරුණු එකක් වුවත් එය අප ජයග්‍රහණය කරා ගෙන යයි.

සිය ඒකජාතක පුත්‍රයාණන් පවා අපගේ පවු උදෙසා යාගයක් බවට පත් කළ දෙවියන් වහන්සේ අප සමඟ සිටින තුරු කිසිවෙකුට අප බියවීමට හේතුවක් නැත. කිසිවක් අපට හානි කළ නොහැකිය. කරදර, වේදනාව හා අභියෝගවලට සාර්ථකව මුහුණ දීම තුළින් පමණක් අපට මහිමය හා සාර්ථකත්වය ලබා ගත හැකිය. ජේසුස් වහන්සේ අපට පෙන්වා දී ඇති සාර්ථකත්වයේ මඟ එය වේ.

සතියේ මෙනෙහි කිරීම

ගරු හෙන්රි සිල්වා පියතුමා

25

උත්පත්ති පොත

(පසුගිය සතිය හා සබැඳේ)

9. ආබ්‍රහම් මුහුණ දුන් අත්දැකීම්

ආබ්‍රහම් මිසරයේ පාරාවෝ සමඟ

(උත්පත්ති 12/10-20)

කානාන් දේශයේ පැවැති සාගතයක් නිසා ආබ්‍රහම්ට ආහාර සොයා මිසරයට යන්නට සිදු වෙයි. ආබ්‍රහම්ගේ භාර්යාව වන සාරාගේ රූපශ්‍රීයට වශීවූ පාරාවෝ රජ තම අන්තඃ පුරයට ඇය ගෙන්වා ගන්නේය. මෙය සිදුවූයේ ආබ්‍රහම් තම සහෝදරිය ලෙස ඇය හඳුන්වා දීමෙන් පසුව යැයි කියැවේ. ආබ්‍රහම් තම ජීවිතය බේරා ගැනීම සඳහා පාරාවෝට අසත්‍ය ප්‍රකාශයක් කළ බව පෙනුනද සමහරෙක් උත්. 20/12 හි ආබ්‍රහම්ගේ ප්‍රකාශයක් ආශ්‍රයෙන් ඔහුගේ හැසිරීම සාධාරණ බව කියති. එම ප්‍රකාශය මෙසේය. "එහෙත් සැබැවින්ම ඈ මාගේ සොහොයුරිය, ඈ මගේ මවගේ නොව පියාගේ දුවය." ඇතැමුන් පවසන්නේ හාරාන්හි විසූ හුරියන්වරුන්ගේ රදළ පවුල් අතර පැවැති වරප්‍රසාදීය නීතියට අනුව ඔවුන්ගේ භාර්යාවන්, සහෝදරී යන නිල නාමය දැරූ බවය. දී ඇති පැහැදිලි කිරීම් කෙසේ වුවත්, ආබ්‍රහම්ගේ දුබලතාවයද එළිදරව් වෙයි. ඔහුගේ ජීවිතය සුරක්ෂිත වුවත් තම භාර්යාවගේ ජීවිතය සුරක්ෂිත නො-වේ. ඇයගේ ජීවිතය අනතුරේය. එබැවින් ඇය ගලවා ගනු ලැබෙන්නේ හුදෙක් දේව මැදහත්වීමකිනි. අප මෙහි දකින්නේ කුමක්ද ? දෙවියන් වහන්සේ තම ගැලැවීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා දුර්වල මනුෂ්‍යයකු තෝරා ගෙන ඇති බවයි.

මෙම විස්තරය, සාරා සතුවූ අතීශය ශෝභා සම්පන්න බව පිළිබඳ පුරාණ වාචික සම්ප්‍රදායයන් වෙත අප ගෙන යනවා විය හැකිය. කරුණු කෙසේ වෙතත්, මෙම විස්තරය ප්‍රබල ජනප්‍රවාද ශෛලියක් දරණ බව ද කිව යුතුය.

ආබ්‍රහම්ට මෙල්කිසදෙක් මුණ ගැසෙයි (උත්. 14/17-24)

මෙම කථාව පටන් ගන්නේ, උත්පත්ති 13:8-10 සහ ද්විතීය නීති සංග්‍රහය 29/23 සඳහන් වන ෂිහාර්, එල්ලාසාර්, ඒලාම් සහ හොයිම් හි රජවරු සතර දෙනාගේ සමගි පෙරමුණ විසින් ආබ්‍රහම් ගේ බෑණා වූ ලොත් (උත්. 14/12) අල්ලාගෙන යෑම ආශ්‍රයෙනි. මෙම නගරවල ජනතාව පසුකලෙක ඉශ්‍රායෙල් ජනතාවගේ සතුරන් බවට පත්වූහ. තවද ආබ්‍රහම් මෙල්කිසදෙක් මුණ ගැසීමද අනාගත ඉශ්‍රායෙල්වරුන් සඳහා වැදගත් වෙයි. එබැවින් මෙම විස්තරය, ආබ්‍රහම්ගේ පෙළපත සම්බන්ධයෙන් පසුකාලීනව සිදු වන්නට යන දේ පිළිබඳ පූර්ව ලක්ෂණ ඉදිරිපත් කරන බව පෙනේ.

මෙම විස්තරයෙහි, ආබ්‍රහම් කරලියට එන්නේ, පුහුණු යුද භටයන් සහිත බලවත් ගෝත්‍රික නායකයකු ලෙසටය. ලොත් බේරාගෙන ආපසු පැමිණීමෙන් පසු ඔහුට, රාජකීය මෙන්ම පූජක කාර්යභාරයන්ද ඉටු කළ බව කියැවෙන සාලෙම් නැතහොත් ජෙරුසලෙම්හි රජවූ මෙල්කිසදෙක් මුණ ගැසෙයි. මෙල්කිසදෙක් මහෝත්තම දෙවියන් වහන්සේගේ (එල් එලියොන්) පූජකයකු විය. එය කානානිවරුන්ගේ ප්‍රධාන දෙවියා සඳහා වූ නිල නාමයකි. මෙය, දැකිය හැකි, පරිදි ඊශ්‍රායෙල්ගේ දෙවියන් වහන්සේ සඳහා ද මෙම නිල නාමය භාවිත වූයේ ඔවුන් වහන්සේ විශ්වයේ මැවුම්කාරයාණන් වීම හේතුවෙනි. ජෙරුසලෙම්හි රජකම් කළ දාවිත් සහ සලමොන් යන දෙදෙනා ද රාජකීය මෙන්ම පූජක කාර්යයන් ඉටු කළ බැව් පෙනේ. (2 සාමුවෙල් 6/17, 1 රාජාවලිය 8/54-66). පසුකාලීන ඉශ්‍රායෙල් සම්ප්‍රදායයන් පෙන්නුම් කරන්නේ ජෙරුසලෙම්හි රජවරුන් සතු පූජක කාර්යයන් මෙල්කිසදෙක්ගේ පූජක කාර්යයන් හා සාපේක්ෂව හඳුනා ගත් බවය. 'නුඹ මෙල්කිසදෙක්ගේ පරපුරෙන් සදහටම පූජකයෙක්ය' (ගීතා. 110/4) ඒ හා සමානව, හෙබ්‍රෙව් ලිපියේ කතුවරයාද ක්‍රිස්තුන් වහන්සේගේ උත්තම පූජකවරය පැහැදිලි කරන්නේ මෙල්කිසදෙක් ගේ පූජකවරය ආශ්‍රයෙනි. ආබ්‍රහම් මෙල්කිසදෙක් විසින් ආශිර්වාද කරනු ලැබීම ඉඟි කළේ ඔහු යාවේ දෙවි මහෝත්තමයාණන්ගේ ආශිර්වාදය හිමි කර ගන්නා බවය. මෙය ආබ්‍රහම් මතු අනාගතයේදී විශාල පෙළපතක් හිමි කර ගැනීමට හේතු සාධක වෙයි.

ආබ්‍රහම්ගේ විශ්වාසය පරීක්ෂා කරනු ලැබීම (උත්පත්ති 22/1-19)

මෙම විස්තරය, තම දේශයද, නෑ පරපුර ද අත්හැර දෙවියන් වහන්සේ විසින් පෙන්වනු ලබන දේශයට යන්නට ආබ්‍රහම් කැඳවීම ලබන උත්. 12/1-6 හා සමාන්තර වෙයි. මෙහිදී, තමන් මහත් ජනතාවකගේ පියා වීම සඳහා වූ එකම බලාපොරොත්තුව වන ඊසාක් යාගයක් කොට පුද කරන ලෙස දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට පවසන සේක. ආබ්‍රහම්, දෙවියන් වහන්සේට කීකරුව ඊසාක් යාග කිරීම සඳහා සියල්ල සූදානම් කරයි. අවසාන මොහොතෙහි එය වලක්වනු ලැබේ. දෙවියන් වහන්සේ එම යාග පූජාව ඔප්පු කරනු සඳහා බැටළුවකු ආබ්‍රහම් වෙත සපයන සේක.

මෙම විස්තරය ඉදිරිපත් කරන පණිවුඩය තෙආකාරය. එනම්,

1. දෙවියන් වහන්සේ තුළ ආබ්‍රහම්ගේ විශ්වාසය යළි තහවුරු කෙරේ.
2. පුරාණ මැද පෙරදිග ප්‍රචලිත වූ මිනිස් බිලි පූජා ප්‍රතික්ෂේප කිරීම සිදුවෙයි. (2 රාජාවලිය 16/3, මීකා 6/7) පුරාණ ගිවිසුමේ ඉගැන්වීමට අනුව සතකු යාග කොට පූජා කිරීම මඟින් කුළුඳුල් දරුවන් මුදවා ගත යුතු විය. (නික්මයාම 13/11-17,34/19-20)
3. නැවත වරක්, ආබ්‍රහම් හට දෙවියන් වහන්සේ දුන් දෙ ආකාර පොරොන්දුව ඔවුන් වහන්සේ අලුත් කරන සේක. එනම් ආබ්‍රහම් විශාල පෙළපතක් උරුම කර ගන්නා බවට හා එම පෙළපත කානාන් දේශය අයත් කර ගන්නා බවට වූ පොරොන්දුවය.

(තවත් කොටසක් ලබන සතියේ...)

රට හදන්න කලින් මේ දේශපාලකයන් හැදිය යුතුයි

කතුතුමනි,

එතෙර සංචාරයක යෙදී සිටි අප රටේ කැබිනට් ඇමැතිවරයකු හෝටලයකදී බීමතින් ඇඳවැටී තුවාල ලබා රෝහලක ප්‍රතිකාර ලැබූ බව මෙරට මාධ්‍ය පසුගියදා වාර්තා කළේය. එම මාධ්‍ය වාර්තාවලට අනුව අදාල ඇමැතිවරයා පිළිබඳ විස්තර එම රටේ මාධ්‍ය ඔස්සේ ද ප්‍රචාරය වී ඇත. ශ්‍රී ලංකාවේ කැබිනට් ඇමැතිවරයාගේ හැසිරීම සම්බන්ධයෙන් එරට වැසියන් කුමක් සිතන්නට ඇත්දැයි මෙහිදී සිතා බැලීම වැදගත්ය. අදාල ඇමැතිවරයා සිය හැසිරීම තුළින් රටට කර ඇත්තේ බරපතල නිගරුවකි. විශේෂයෙන් දේශපාලනඥයින් ජනතාවට ආදර්ශවත් ලෙස හැසිරෙන රටකදී මෙවැන්නක් සිදුවීම අප රටේ අභාග්‍යයකි.

දේශපාලනඥයින් නීතිගරුක බවින් හා විනයගරුක බවින්ද සමාජයේ සිය අවතුම් පැවතුම් තුළින් ද ජනතාවට ආදර්ශවත් විය යුතු බව පොදු ජන අපෙක්ෂාවය. එහෙත් අවාසනාවකට අපගේ දේශපාලනඥයින් බහුතරයකින් ඉටු නොවන්නේ ද එයයි. කොළඹ තරුපහේ හෝටලයක පිහිනුම් තටාකයට සිය ඇඳිවත ඔසවා ඇමැතිවරයකු මුත්‍රා කළේ ද වැඩි ඈතක නොවේ.

දේශපාලනඥයින්ගේ, විශේෂයෙන් ඇමැතිවරුන්ගේ මෙවන් අවාදර්ශී කටයුතු මෑතක සිට වර්ධනය වෙමින් පවතී. එහෙත් එවන් මුග්ධ දේශපාලනඥයින්ට එරෙහිව වගකිවයුත්තන් පියවර ගන්නේද නැත. රාජ්‍ය නිළධාරියකු දෙනෝදාහක් ජනතාව බලා සිටියදී ගස් බැන්ද ඇමැතිවරයාට එරෙහිව කිසිදු පියවරක් ගැනුනේ නැත. සාමාන්‍ය මගීන් සඳහා වෙන්වූ දොරටුවකින් ගුවන් තොටුපලට ඇතුළු වූ දේශපාලනඥයකුට (ඔහු හඳුනාගැනීමට නොහැකිවීමෙන්) ආචාර නොකළ ආරක්ෂක නිළධාරියකුට නොසරුප් බසින් බැණවැදී ගුවන් තොටුපලේ යකා නැටූ එම දේශපාලනඥයාට අවවාද කිරීමක් හෝ කරනු නොලැබීය.

විවිධ දූෂණයන්ට සම්බන්ධ දේශපාලනඥයින් පිළිබඳව නිරතුරුව ජනමාධ්‍ය මගින් හෙළිදරව් කරනු ලැබුවද වීනා හඬට ප්‍රතිචාර නොදක්වන බීරි අලින් මෙන් අදාල දේශපාලනඥයින්ගේ නායකයින් ඔවුන්ගේ නොපණත්කම් හමුවේ නිහඬව සිටීම එකී දූෂිතයින්ට උඩගෙඩි දීමකි. ඇතැම් විට සිය දේශපාලන පැවැත්මට එකී දූෂිතයින්ගෙන් ඉටුවන සේවාව දේශපාලන බලවතුන් නිහඬ කිරීමට හේතුවනවා විය හැකිය.

තමන් නීතියේ ආධිපත්‍යයෙන් මිදුන මහේශාක්‍ය සර්වබලධාරින් ලෙස සිතා තමන්ට කළ නොහැකි කිසිවක් නැතැයි විශ්වාස කරන දේශපාලනඥයින් සමඟ ආශ්චර්යයේ ගමනක් යා නොහැකි බව නායක කාරකාදීන් වටහාගැනීම ඔවුන්ගේද දේශයේද යහපතටම හේතුවනු ඇත.

ලිඩ්වින් කිරිඇල්දෙණිය
හලාවත

කිතුනු මැති ඇමැති සංසදයක් පිහිටුවන්න

කතුතුමනි,

ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රටකි. සුලු ආගමික කිතුනු ජනතාවට අවහිර තාඩන පීඩන එල්ල වීම ප්‍රවර්ධනය වෙමින් පවතී. මෙය පුරවැසියාගේ පුද්ගලික හා සිවිල් නිදහසට බාධාවකි. අවහිරයකි. අනික ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනිය. සන්ධාන ගත පක්ෂ මෙම ක්‍රියාකාරකම් පිටුපස සිටින බව නොරහසකි. රාජ්‍ය නායකයින් ද මුනිවත රැකීමෙන් ගම්‍යවන්නේ ඔවුන්ද මෙම ක්‍රියාකාරකම් අනුමත කරන බවකි.

මීට එකම විකල්පය නම් පාර්ලිමේන්තුවේ සෑම පක්ෂ නියෝජනය කරන කිතුනු මැති ඇමැතිවරුන් පක්ෂ පාට නොබලා එකමුතු කර කිතුනු මැති ඇමැති සංසදයක් පිහිටුවා ගැනීමයි. එමගින් කිතුනු විරෝධීව රට තුළ ක්‍රියාකරවන කණ්ඩායම්වලට පාර්ලිමේන්තුවේ හඬක් ගොඩනගාගෙන කටයුතු කළ හැකිය.

ඇන්ටනි මොරගොඩ
නිට්ටඹුව

නාවලපිටියේ සා. මරියා පාසල පාසල් දහසට ගැනීමෙන් ප්‍රශ්න ඇතිවේද?

කතුතුමනි,

මහනුවර රදගුරු වසමේ පිහිටි නාවලපිටිය සා. මරියා දේවස්ථානයට අයත්ව තිබූ සා. මරියා විදුහල 1961 කතෝලික පාසල් රජයට පවරා ගැනීමත් සමඟ විදුහල හා බැඳුනු මීසම් බැතිමතුන්ගේ අනන්‍යතාවයන් කප්පාදු කරමින් එවකට රජය සම්මත කරන ලද පණතට අනුකූලව ලැබිය යුතු වරප්‍රසාද හා අයිතිවාසිකම් උල්ලංඝණය වෙමින් කාලාන්තරයක් පුරාවට සිදු වූ අකටයුතු විවිධ අසීරුතා මැද්දේ කටයුතු කර ගෙන යයි.

එම සිද්ධීන් සමහරක් ඥානාර්ථ ප්‍රදීපයේ ද පළ විය. රදගුරු හිමිපාණන් ඇතුළු පූජක තුමන් හා දේශපාලකයන්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිළධාරීන්, රජයේ බලධාරින් දැනුවත් කිරීම් සිදු කර ඇත. එම අවස්ථා වලදි සුළු වශයෙන් ලද සහනයන් නිසා විවිධ බාධක මැඩ පවත්වා ගැනීමට හැකි වී ඇත. ඒ නමුදු හෙට එම තත්ත්වයට වඩා උග්‍ර තත්ත්වයකට මුහුණ දීමට කරුණු කාරණා සිදු වෙමින් පවතී.

පාසල් 1000 වැඩ සටහන යටතේ සා. මරියා විදුහල තෝරාපත් කර ඇති බව සැළවූ විට කිතුනුවන් කබලෙන් ලිපට වැටෙතැයි සැක පහළ වී ඇත. එහෙත් ජාතික වශයෙන් සහා ශ්‍රෙෂඨයන් හා අධ්‍යාපන ඇමැතිවරුන් නිවේදනයක්ද නිකුත් කර තිබිණි. (උද - 2012.01.15 දින ඥානාර්ථ ප්‍රදීපයේ කතු වැකිය සඳහන් පරිදි ජනතාවගේ විරුද්ධත්වයක් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇති කම සඳහන් විය.) ඒ අනුව සා. මරියා විදුහල තෝරා ගැනීම කිසිසේත් සුදුසු නොමැත. පළමු වන කාරණය එහි ඉඩම් ප්‍රමාණය ඉතා අල්පය. තවද කතෝලික නිළ ලාංඡන, පාසලේ නම වෙනස් කිරීම, ප්‍රතිමා ඉවත් කිරීම වැනි දෑ සිදු වීමත් සමඟ කිතුනුවන්ට අහිමි වන දෑ බොහෝය. දහම් පාසල් පවත්වා ගැනීම, භක්ති අභ්‍යාස කටයුතු, ආගමික සංස්කෘතික කටයුතු වැනි දෑ නුදුරු අනාගතයේදී නැත්තටම නැති විය හැකිය.

අපගේ දේවස්ථානයේ ඒ සඳහා ඉඩකඩ පහසුකම් නැත. දිව්‍ය පූජාව පැවැත්වීමට හා එක පූජක තුමෙකුට ලැගුම් ගැනීම සඳහා පමණක් සීමා සහිත ඉඩ ප්‍රමාණයක් ඇති අතර හතර පැති කඩම වීදියේ ගොඩනැගිලි වලින් වට වී ඇත. එම නිසා ඉහත කී බලධාරින්ගේ අවධානය යොමු කොට දක්වන ප්‍රතිචාරය වෙනුවෙන් කිතුනුවෝ ඉවසීමෙන් පසුවෙති.

මිකි ප්‍රනාන්දු
නාවලපිටිය

පුදසුනේ සමිඳුන් නැති ලෙසේ

කතුතුමනි,

දෙවියන් වහන්සේගේ මහිමය සඳහාත්, අපේ සියළුම ආත්මික, ශාරීරික අවැසිතා උන්වහන්සේගේ දෝතට භාරකරනු සඳහාත්, කිතුනු දෙව්මැඳුරු තුළ නිතිදින, නිතිපතා පුදදෙන දිව්‍ය යාගයන් උන්වහන්සේට ප්‍රසන්න ලෙස ඔප්පුකිරීමට පුදසුනේ සමිඳුන් වැඩ ඉන්නා බව බැතියෙන් අදහා, යාගය තුළ සිදුකරන්නාවූ සියළුම පිළිවෙත් හා සාමූහිකව සම්බන්ධ විය යුතුය.

එහෙත් ජීවිත කාලයටම එකම වරක් පමණක් දෙවියන් වහන්සේගේ මැදහත්කමින් දෙඅත් අල්වා යළි කිසිවකුටවත් වෙන් කළ නොහැකි වන ලෙස ආශිර්වාද කර විවාහ ජීවිතයට ඇතුලු කරගන්නාවූ මංගල යුවළක් වෙනුවෙන් එක්ව යැදීමට ආරාධනා ලැබ මැඳුරට පැමිණෙන බොහෝ දෙනෙක් පුදසුනේ සමිඳුන් වැඩ ඉන්නා බව නොඅදහන පිරිසක් ලෙස හැසිරෙති. ලබා ඔබේ ඇරයුම් සමිඳේ..... ආවෙමු සාදෙට අප මෙදිනේ..... මංගල ඇඳුමෙන් සැරසී..... යනුවෙන් ගයා සමිඳුන් අභියස මනාලිය, යෙහෙලියන් සහ මල්කුමාරයන් පඬුරු පුදන්නේ උන්වහන්සේට ප්‍රසන්න මංගල ඇඳුමකින් නොව, අඩනිරුවත් වත පෙන්වන විලාසිතා මවන වේදිකාවකට පමණක් සුදුසු ඇඳුමකිනි. බාලේපටන් දැරියන් වඩනා මෑණිවරුන් විලිබිය රකිනා ඇඳුමැතිව ජීවත්විය යුතු ඔවදන් දුන්නත් එක් ලස්සන දවසක ඒ රුවැති දියණියන් සමිඳුන් අබියසට නොමනා ඇඳුමෙන් සරසා යවන මෑණිවරුන් වෙත මුලින්ම වරද පටවමු.

විවාහ මංගල උත්සව දවස තම නෑ මිතුරන් පිරිවරා සතුටු විය යුතු දවසකි. එහෙත් විවාහ මංගල යාගය සිදුවෙන පැය සමිඳුන්ට ප්‍රසන්න විය යුතුය. යාගය නිමවෙන අවසන් විනාඩියේ දී පවා මැඳුරට පැමිණෙන සැදැවතුන් නමට එකදා ගැනීමේ පිළිවෙත ඉටුකිරීමට එකකුදු නෑර පෝලිම් ගැසුනත් ස්වාමීන් වහන්සේගේ දිව බොජුන වලඳන්නට පැමිණෙන්නෝ ස්වල්පයක් වෙති. මේ සියළුම ක්‍රියා දෙස විමසිලි දෑස් යොමු කරනවානම් විවාහ මංගල දිව්‍ය පූජාවක් තුළ සමිඳුන් වැඩ ඉන්නා බව නො අදහන පිරිස බෙහෙවින් වැඩිබව කිව යුතුය.

පී. වී. ඩී. ලුවී මයිකල්
කපුවාගාර

රෝමානු කතෝලික නම ලැජ්ජාවක්ද ?

කතුතුමනි,

ඉකුත් ජනවාරි මස 29 වන දින ඔබ ප්‍රදීප පුවත් පතේ පලවූ ෆ්‍රැන්සිස් ජයසිංහ මහතාගේ අපේ රටේ කතෝලික ආගම රෝමානු ද? ශ්‍රී ලාංකික ද? යන පාඨය යටත් පළවූ ලිපියට පිළිතුරු වශයෙන් මෙය ලියමි.

පළමුව ඔහු සහ සමස්ත ලෝකය කතෝලික දහමේ විශ්වීය භාවය අවිවාදයෙන් පිළිගනී. එසේ වූ කල එහි කාර්යයක්ෂම මෙහෙයුම සඳහා කේන්ද්‍ර වූ මූලස්ථානයක් අවැසි වනු ඇත. ඒ අනුව එක් එක් රටට ආවේනික වන පරිදි කතෝලික දහම මුද්‍රා කිරීම අර්ශුන්‍ය ව්‍යායාමයකි. එයට හේතුව නම් කතෝලික දහම තරම් නිසියාකාර සවිමත් පදනමක් මත නොසැලෙන පන්නරයකින් යුක්තව සහ විනයානුකූලව ශික්ෂණයකින් සංවිධානාත්මක ලෙස ගොඩනැගුන ආගමක් වෙනත් නැති හෙයිනි.

කිතු දහම ලොව පුරා ප්‍රචලිත කිරීමේ මධ්‍යස්ථානය ලෙස තෝරා ගන්නා ලද්දේ රෝම නගරයයි. ඒ හේතුවෙන් මෙලොව වසන බහුතර ජනතාවක් අදහන කතෝලික ආගමට අරුණෝදයේ කිරණ නිකුත් වන්නේ රෝමයේ සිටය. මෙවැනි පසුතලයක් තුළ අප රෝමානු කතෝලිකයන් වශයෙන් හඳුන්වා ගැනීම වරදක් වන්නේ කෙසේ ද?

අප දේශානුරාග යක් ප්‍රදර්ශනය කිරීම සඳහා කතෝලික දහම යොදා ගැනීමෙන් ඵලක් නැත. එවිට අපගේ මූලස්ථානය අප විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම ඔස්සේ දහමින් බැහැර නොවන්නේ ද?

එල්. ප්‍රනාන්ඩස්
බටහිර පළඟතුරේ

සදාචාරාත්මක ශ්‍රී ලංකාවක් උදෙසා...

"සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගේ අත්අඩංගුවට පත් මීගමුවේ ධීවරයන්" හය දෙනකු බේරා ගැනීම සඳහා මැදිහත් වන ලෙස රජයෙන් ඉල්ලා සිටීමට මීගමුවේ කතෝලික ශාසනාරක්ෂක බල මණ්ඩලය කටයුතු කර තිබිණි."

"මීගමුව මහ නගර සභාවේ මන්ත්‍රීවරයකු කපා ඝාතනය කිරීමට තැත් කිරීමට එරෙහිව මීගමුවේ සමාජ සංවිධාන කීපයක් හා නාගරික මන්ත්‍රීවරු කීප දෙනෙක් ඇතුළු පිරිසක් පසුගියදා මීගමුව නගරයේ විරෝධතා පෙළපාලියක් සංවිධානය කර තිබිණි."

මේ පසුගිය දා පළවුණු පුවත් දෙකකි. මෙම ක්‍රියාකාරකම් දෙකම පැසසුම් කටයුතුය. අත්‍යවශ්‍යය. කිතුනුවන් බහුතරයක් ජීවත් වන නිසා මීගමුව හැඳින්වෙනුයේ "පුංචි රෝමය" නමිනි. එසේ ද වුවත් මීගමුව විවිධ ජාතීන්ගේ හා ආගමිකයන්ගේ සංකලනයකි. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ජාතීන් වෙත්වා කිතුනු, බුදුනු, ඉස්ලාම්, හින්දු ආගමිකයෝ ද මීගමුවේ වෙති. මොවුන් අති බහුතරය සාමකාමී දිවි පෙවෙතකට හුරුවූ එ නිසාම විවිධ ජාතිකත්වයන්, විවිධ ආගම් ඇදහීම් ඉවසන්නට පුරුදු වූවෝ වෙති. ජනතාවගේ මෙම සාමකාමී පැවැත්මට අතීතයේ මීගමුවේ විසූ දේශපාලකයන්ගෙන් ද ලැබුණේ මහඟු පිටිවහලකි. මීගමුවේ එදා සිටි දේශපාලන නායකයෝ මැරයෝ නොවූහ. ඔවුන් මැරයන් ඇසුරු කළෝ ද නොවූහ. එ නිසාම අතීත මීගමුව තුළ ආයුධ සංස්කෘතියක් ද නොවීය. එම නායකයෝ සදාචාරවත් හා නීතිගරුක පුද්ගලයෝ වූහ. ඔවුන් ජනතාවට ආයුධ එල්ල කළේවත් ජනතාව ඔවුනට ආයුධ එල්ල කළේවත් නැත. ඒ සඳහා දැක්විය හැකි හොඳම උදාහරණය වන්නේ 1988 /89 භීෂණ යුගයේදී ත්, රටපුරා එ.ජා.ප. මැති ඇමැතින් ඝාතනය වෙද්දී කිසිදු ආරක්ෂක භටයකු නොමැතිව පන්මල්ල කිහිලි ගන්නා ගෙන මීගමුවේ වෙළෙඳපළෙන් මාළු එළවළු ගන්නට පැමිණි, එ.ජා.ප. ආණ්ඩුවේ ගරු කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමැති එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා ය.

1990 දශකයේ දී ඒ තත්ත්වය වෙනස් වූ අතර අද පුංචි රෝමය ද ආයුධ සංස්කෘතියට හුරු වෙමින් සිටී. රටම අවිචාරවත්ව පාලනය වන යුගයෙක - අධීක්ෂණ මන්ත්‍රීවරයකු ද වන ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයකු වෙතින් තමන්ගේම ජනාධිපති උපදේශකයකු ඝාතනය වී යැයි පැවසෙන යුගයෙක මීගමුවේ ප්‍රාදේශීය දේශපාලනඥයකු පිහි පාරකට ගොදුරු වීම ගණන් නොගත යුතු තරම් දෙයක් වූවත් පුංචි රෝමය තුළ එවැන්නකට වුවද විරෝධතාවයක් පැන නැගීම වැදගත් ය. එයින් පැහැදිලි වන්නේ අප ආයුධ සංස්කෘතිය නොඉවසන බවය.

එසේම සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගේ අත්අඩංගුවට පත් වූ මීගමුවේ ධීවරයන් හයදෙනා පිළිබඳව මැදිහත් වී ඔවුන් නිදහස් කර ගැන්මට කටයුතු කරන ලෙස රජයෙන් ඉල්ලා සිටීමට මීගමුව කතෝලික ශාසනාරක්ෂක බල මණ්ඩලය කටයුතු කොට තිබේ. සෝමාලියාව සමඟ අපේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ද නොමැත. එබඳු තත්ත්වයක් තුළ එම ධීවරයන් ගලවා ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ද පැසසුම් කටයුතුය. 1980 දශකයේ මීගමුව කලාපීය නාහිමි ලෙස කටයුතු කළ අතිගරු අයිවන් පෙරේරා පියතුමන් ප්‍රමුඛ මීගමුවේ ගරු පියතුමන් සමාජ දේශපාලන කරුණු වෙනුවෙන් මැදිහත් වූ අයුරු මෙහි දී අපට සිහිපත් වේ.

★ මීගමුවේ ඉඩම් හා නිවාස නොමැති වූවන්ගේ ප්‍රශ්නය.

★ මීගමුවේ පාරිසරික හානිය විශේෂයෙන් මීගමුව කළපුව පිළිබඳ ප්‍රශ්නය.

★ මදුරු වසංගතය පිළිබඳ ප්‍රශ්නය.

★ මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳ ප්‍රශ්නය.

★ ළමා අපචාර පිළිබඳ ප්‍රශ්නය ආදිය ඉන් සමහරක් වේ.

එම ප්‍රශ්න වෙනුවෙන් හඬ නගද්දී එතුමන් කිතුනුවන් පමණක් නොව වෙනත් ආගමිකයින්, ස්වේච්ඡා සංවිධාන ආදිය ද ඒකරාශී කරගත්හ. තම ඉල්ලීම්, විරෝධතාවන් පුළුල් ජනතා ඉල්ලීම්, විරෝධතාවන් බවට පත් කර ගත්හ. අප එය දකින්නේ ක්‍රිස්තු ජීවිතය නැවත පණ ගැන්වීමක් ලෙසය. ක්‍රිස්තු තුමා ගත් කුරුසිය කරට ගැනීමක් ලෙස ය. ශු. බයිබලය තුළ ක්‍රිස්තු තුමන් අප දකින්නේ දේශනාවාදියකු ලෙස පමණක් නොව ජනතා දුක් ගැනැවිලි දෙස නෙත් හෙළු, රෝගීන් නිරෝගී කළ, කොරුන් ඇවිද්දවූ, අන්ධයනට පෙනීම ලබා දුන්, බිහිරන්ට ඇසීම ලබා දුන් ජීවක වරයකු ලෙසය.

සමාජය දූෂණය කළ පරිසිවරුන් විෂයයෙහි අනුකම්පා විරහිත විවේචන එල්ල කළ සමාජ ශෝධකයකු ලෙසින්, ජෙරුසලමේ දේවස්ථානය වෙළෙඳ පලක් කරගත්තවුනට එරෙහිව එතුමෝ කසය අතට ගත්හ. ඒ අනුව කිතුනු කාර්ය භාරය ලෙස අප දකින්නේ යැදුමට එහා ගිය කාර්යභාරයක් ඉටු කිරීමය.

වත්මන් ශ්‍රී ලාංකික සමාජය තුළ නායකත්වය දරන්නවුන් පරිසිවරුන්ගේ වංශයට වෙනස් වන්නේ කොයි ලෙසකින් ද? අද දූෂණය, නාස්තිය, හොරකම ඉහවහා ගොස් ඇත. පීඩිතයෝ තව තවත් පීඩනයට ලක් වෙති. මිනීමැරුම්, අතුරුදන් කිරීම්, පැහැරගෙන යාම් වල කෙළවරක් නැත. මෙවන් වටාපිටාවක කතෝලික නොකිතුනු නම දරන්නවුනට මේවාට සංවේදී නොවී සිටිය හැකි ද? මීගොමුව කතෝලික ශාසනාරක්ෂක බල මණ්ඩලයටත් ඒ අභියෝගයෙන් පලාගිය නොහැකිය. මීගමු කිතුනු පූජක සංඝයටත්, ඒ අභියෝගයෙන් පලාගිය නොහැකිය. සදාචාරාත්මක මීගමුවක් - පුංචි රෝමයක් ගොඩ නගමු. සදාචාරාත්මක ශ්‍රී ලංකාවක් ගොඩ නගමු.

ස.බ. වෙල්ගම – මීගමුව

ධීවර සුසුම, ධීවර

පොදු ජනතාව නියෝජනය කරන ලද 1956 විප්ලවයේ දී සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන "පංච මහා බලවේගය" පෙරමුණට පැමිණියේ නිරායාසයෙනි. එය වසර ගණනාවක් පුරා පීඩනයට ලක් වූ සිංහල උගතුන්ගේ හා නිර්ධන පංතියේ බලවේගය කරලියට පැමිණීමක් විය. එකල මෙම වෙනස බොහෝ විට සිදුවූයේ සිංහල බෞද්ධ ගම් නියම්ගම් වල සහ නාගරික කම්කරු ජනතාව අතර විය.

කතෝලික අප මෙම විප්ලවයේ දී "ප්‍රතිගාමී" ධනවාදී පැත්තේ තුප්පහි සංස්කෘතියක් කරපින්නා ගත් පරගැතියන් සේ අන්තවාදීන් විසින් හංවඩු ගැසුනි. එහෙත් ගැමි, අහිංසක කතෝලිකයා මෙම විප්ලවය සමඟ විය. මෙයට හොඳම උදාහරණය වන්නේ මීගමුවේ ව. ස. ප්‍රනන්ද නම් වමට බරවූ කතෝලික දේශපාලනඥයා ය. මීගමුවේ දුගී ධීවර ජනතාව ඔහු සමඟ විය. කතෝලික සභාව එකල වපරැසින් වාම දේශපාලනය (සම සමාජ, කොමියුනිස්ට්) දෙස බලන යුගයක් විය. එවැනි පසුබිමක් තුළ මීගමුවේ ව.ස. ප්‍රනන්ද ශූරීන් මීගමු අසුනට තරග කොට නම්බුකාර, ජයග්‍රාහී පරාජයක් ලැබුවේ යන්තමිනි. මීගමුවේ ප්‍රනාන්දුලා මැති සබයට ගිය කල්හි හලාවත කොරයලා ඒ පැත්තෙන් එක් විය.

මෙම දේශපාලන පසුබිම යටතේ, මීගමු ධීවර ප්‍රජාව, තමන්ට සිදුවන කෙනෙහිලිකම්, දුඃඛ දෝමනස්ස පළ කළේ, සුපුරුදු "කතෝලික නිහඬතාවය", "නීතිගරුක බව" ඉවතලා, වාම දේශපාලනයට නෑකම් කියන උද්ඝෝෂණ, පෙළපාලි, සටන් පාඨ වලින් උතුරා ගිය නියම ධීවර ජනතා සටනකිනි. (එහෙත් සත්‍ය වශයෙන්ම මෙය වාම දේශපාලනයක් නොවූ අතර පිටාර ගියේ ධීවර හදවතෙහි වූ සිත් තැවුල් ය.)

කතෝලික ජන සංඝයට මෙන්ම අවශේෂ ලක් වාසීන්ට ද , ඉතා වැදගත් කරුණ වන්නේ 56 විප්ලවයේ දී මෙන්, පංච මහා බලවේගයේ "සඟ / කම්කරු" යන සාධක මෙවර මීගමුව - හලාවත ධීවර දිස්ත්‍රික්කයන් හි දී "පුදැදුරු / ධීවර" යන කතෝලික ජනතා අපට ඉතා සමීප වූ සාධක බවට පත්වීමය. ආදේශ වීමය.

ඉතා ආනන්දනීය තත්ත්වය වන්නේ, විවිධ දේශපාලන බලවේග නොසලකා හරිමින් නිරායාසයෙන්ම කතෝලික ජන බල පදනමක් වූ ධීවර ප්‍රජාව, "පුදැදුරු" හෙවත් පූජාප්‍රසාදින්වහන්සේලා අවට රොක් වීමය. එසේම ගරු පියතුමන්ලා ද, ධීවර ප්‍රජාව හැර දමා නොගොස් ඔවුන් සමඟ සටන් පෙරමුණේ සිටීමය. මෙහිදී උතුරු කොළඹ කලාපීය නාහිමියන් සමඟ මීගමු පූජාප්‍රසාදින් වහන්සේ රාශියක් (ඒ ඒ කතෝලික ගම්මාන, මීසම්, නියෝජනය කරමින්) ධීවර ජනතාව සමඟ එක් රොක් වී, පොලීසිය ප්‍රධාන ආරක්ෂක හමුදාවන්ට කරුණු කාරණා කියන්නට ඉදිරිපත් වූහ. හලාවත දිසාවේ ද තත්ත්වය එසේම විය. අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණන්ගේ මඟ පෙන්වීම යටතේ හලාවත පදවියේ අනුනායක හිමිවරු සහ ගරු පූජාප්‍රසාදින් වහන්සේ, හලාවත ධීවර ප්‍රජාවට අනුශාසකත්වය ලබා දුන් අයුරු ජනමාධ්‍ය මඟින් ඉතා අපූරුවට පෙන්වා දුනි.

මෙහි දී දකුණේ, බේරුවල සිට තංගල්ල දක්වා සහ උතුරේ මන්නාරම සිට ත්‍රිකුණාමලය දක්වා ධීවර ප්‍රජාව, මීගමු - හලාවත සම්බන්ධ හේතු කාරණා දේශපාලන නායකයින් පෙන්වා දී විසඳීම සඳහා පාඩම් සහ ධීවර අරගල කොමිසම පෙන්වා දී

මෙහි වෘකයින්ගේ කාරයින්ගේ බේරා ගැනීම නායකත්වය මෙයට සහ දේශපාලන අනෙකුත් සහාය කරන සඳහා ප්‍රලා නොඅනුමත සංහිඳියාව ධීවරයාගේ ජනතාව, සහන ඔස් වෙසෙන පත්වෙමින් අභිලාෂය

රදගුරු හිමි සය නමකට සෙවන දුන් දැ

සියනෑ කෝරලයේ කැලණියට අයත් ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් මුනිවරයාණන්ට කැප කරන ලද දළුගම මීසම, සභාවේ රදගුරු හිමි සය නමකටම සෙවන ලබා දුන් වාසනාවන්ත මීසමක් හැටියට හඳුන්වා දීමට හැකිය. වර්ෂ 1865 ඉදිකරන ලද දළුගම ඓතිහාසික දේවස්ථානය පිළිබඳ ශිලා ලේඛන පුවරුවක් අදටත් මෙම දෙව්මැදුර තුළ දක්නට තිබෙයි.

මුල් අවධියේ දී නුවර පාරේ කඩවත, ඇල්දෙනිය සිට ගම්පහ වැලිවේරිය ඇතුළු මීරිගම දක්වාත්, එඬේරමුල්ල, කිරිමැටියාගාර, කුරුකුලාවට අමතරව පිලපිටිය, පෑලියගොඩ, කැලණිය විහාරයට යාබද රෝස පල්ලියත්, පමුණුවිල, සපුගස්කන්ද, දිප්පිටිගොඩ සහ මාබිම මීසම් කීපයක් ද දළුගම මීසම මඟින් පාලනය වූයේ ය.

දළුගම ඓතිහාසික ඉපැරැණි දේවස්ථානය පිළිබඳව ඉතිහාසඥ ක්වෙරෝස්ගේ "Conquest of Ceylon" ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ.

"කොළඹ සිට ලීගයකට දුරින් කැලණි ගඟ බඩ ශු. ආනා තුමියගේ දේවස්ථානය ද ගඟ අනික් පස කෝට්ටේ රජ දරුවන්ගේ රාජ විමානය පිහිටි ප්‍රදේශයේ ශුද්ධවූ බර්තොලමෙයුස් තුමන්ගේ දේවස්ථානය ද, මල්වානේ වැදගත් ස්ථානයක් වූ මාපිටිගම දේවමාතා විමන ද, එහි සිට අර්ධ ලීගයකට ඊසාන දිගට රමණීය කඳු ගැටයක් මත අවට සුන්දර මිටියාවත් වලින් යුක්තව දොම්පේ පිහිටියාවූ ස්වර්ග ාරෝපිත අප ස්වාමිදුවගේ දේවස්ථානය හා තාපසාරාමය ද එම සාරවත් ප්‍රදේශයේ හදවත තුළ දළුගම ද පිහිටියේය"

මෙරට කතෝලික සභාවේ රදගුරු හිමිපාණන් සය දෙනකුට සෙවන ලබා දෙමින් තම පූජක දිවිය අස්වැද්දීම සඳහා වූ තෝතැන්නක් බවට පත් වූ දළුගම මීසම හා සබැඳි රාජගුරුප්‍රසාදි වංශ කතාව මුලින්ම ඇරැඹෙන්නේ අති උතුම් ඩබ්ලිව්. දොන්. සිල්වෙස්ටර් හිමිපාණන් ගෙනි. පූජක වරම් ලැබීමට පෙර කෙටි නිවාඩුවකට පැමිණි තරුණ සිල්වෙස්තර් පූජක සිසුවාට දළුගම නැවතීමට සිදුවූයේ ඔහුට අලුතෙන් ලැබුණු රැකියාව නිසාවෙනි. දළුගම ගම් සභාව මඟින් පාලනය කෙරුණු සමූපකාර සංගමයේ පරීක්ෂක ධුරය දැරුවේ ඔහුය. මෙම Co-op Inspector ට නවාතැන් ලැබුණේ දළුගම පරණ නුවර පාරේ "පනරුක් සෙවණයි", එය ස්වර්ගස්ථ වූ ගරු ජෝශප් කබ්රාල් පියතුමාගේ සහෝදරියකට අයත් වූවකි. දළුගම දේවස්ථානයට නුදුරු එම නිවසේ සිට සිල්වෙස්තර් සහෝදර තුමා විවිධ අපෝස්තලික සේවාවල යෙදුණි. ඔහු සවසට ගමේ දරුවන්ට ගීතිකා ගායනය පුහුණු කෙළේය. ඒ දිනවල මෙම පූජක සිසුවාට පියානෝව දක්ෂ ලෙස වාදනය කිරීමේ හැකියාවක් ද තිබුණි. 1947 - 48 වසර වල දළුගම මීසමේ "ඥානපාත්‍රයේ" මරිය හමුදා ප්‍රසීඩියම ආරම්භ කිරීම සඳහා පුරෝගාමී වූයේ බ්‍රදර් සිල්වෙස්තර්ය. වසර කීපයක් ඉක්ම යත්දී පූජක වරම් ලබා 1982 දෙසැ. 16 දින ගාලු පදවිය බාර ගනිමින් අති උතුම් ඩබ්ලිව්. දොන් සිල්වෙස්තර හිමිපාණන් පිටත්ව ගියේ දළුගම දේව ජනතාව ද අමන්දානන්දයට පත් කරමිනි.

දළුගම මීසම හා බැඳුණු රදගුරු වංශ කතාවට ඊළඟට ඇදෙන්නේ විශ්‍රාමලත් අති උතුම් ඔස්වල්ඩ් ගෙ ාමිස් අගරදගුරු හිමිපාණෝ යි. එතුමන්ගේ නිජ බිම වූ කැලණි පිලපිටිය ශා. ආනා දෙව් මැඳුර මුල් කාලයේ අයත්ව තිබුණේ දළුගමට ය. 1948 දී තරුණ ඔස්වල්ඩ් බොරැල්ල සා. ඇලෝසියුස් පුංචි සෙමනේරියට පා තබද්දී මෙම පූජක සිසුවාට එදා මාර්ගෝපදේශකයා වූයේ එවකට දළුගම මීසම සේවකව හුන් ගරු මනුවෙල් අපෝන්සු පියතුමායි. මනුවෙල් අපෝන්සු පිය සමයේ එක් දිනෙක දිප්පිටිගොඩ පාතිමා නව දෙව්මැදුරට අත්තිවාරම දමද්දී අපත් සමඟ ඔස්වල්ඩ් පූජක සිසුවා ද ඉංජිනේරු ගඩොල් ඇද්ද හැටි අද මෙන් මට මතකයි. 1951 දෙසැ. 28 දින කැලණිය දළුගම මීසමෙන් ඉවත්ව වෙනම සභාවට බවට පත්වුවද මෙම නිහතමානී ගෝමිස් පියනම දළුගම මීසම කිසිදිනෙක අමතක කළේ නැත. 1968 ජූලි 17 දින ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ රාජගුරු අභිෂේක උලෙළේ දී කොටහේන ශා. ලුසියා ආසන දෙව්මැදුර පුරා සිටි පිරිසගෙන් වැඩි දෙනෙකු දළුගම මීසම් ජනතාව යැයි කීම අසාධාරණ නොවේ. එතුමා දළුගම මීසම් ජනතාව අමතක කොට නැති බව අපි දනිමු.

ඊළඟට තවත් රදගුරුතුමකුට සෙවන දීමට තරම් දළුගම මීසම භාග්‍යවන්ත වූවාය. වාසනාවන්ත වූවාය. එම වාසනාව අපට හිමිකර දුන්නේ 1969 සිට 1971 දක්වා දෑ අවුරුදු කාලයක් අප මීසම භාර පියතුමා හැටියට අප මීසමට අමරණීය සේවාවක් ඉටුකළ ගරු රේමන්ඩ් පීරිස් පියනමයි. 1987 ජූලි 18 දින උන්වහන්සේ ඇතුගල්පුර රදගුරු තුමා වශයෙන් පත්වීම බාර ගනිද්දී දළුගම දේව ජනතාව ඉමහත් උද්දාමයෙන් ප්‍රීති ඝෝෂා කළහ. වසර 22 ක උදාර එඬේරික සේවාවක් ඉටුකොට අද විශ්‍රාමිකව පසුවුවද අදටත් දළුගම සැදැහැතියනට එතුමන්වත් එතුමන්ට දළුගමවත් අමතක නොවූ බව අපි හොඳාකාරවම දනිමු.

දළුගම ග්‍රාමයේ ප්‍රෞඪ ඉතිහාසය තව තවත් ඔප මට්ටම් කෙරෙමින් රදගුරු නිලය දිනාගත් අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් අප මීසම් ඉතිහාසයේ තවත් අභිමානවත් මඟ සලකුණෙකි. 1980 ජූලි 05 දින පූජක වරම් ලද මෙම තරුණ පූජාප්‍රසාදිවරයාගේ මුල් පත්වීම වූයේ දළුගම මීසම යි. ඒ ගරු ලියෝ පෙරේරා පියතුමා මීසම් සේවකව සිටි කාලයේයි. දළුගම අප මීසමෙන් ලද පූජක පුහුණු පන්තරයත් සමඟ සන්නද්ධ වූ මෙම පියනම පසුකලෙක දී අගරදගුරු මැදුරේ භාණ්ඩාගාරික ධුරයට පත් කෙරුණි. රත්නපුරය හා ගාලු පදවිවල ආත්මික එඬේරාණන් හැටියට කටයුතු කළ මෙම ක්‍රියාශීලී රාජගුරුප්‍රසාදීන් වහන්සේ 2009 ජූලි 1 වන තුරුත් ඇතුගල්පුර පදවිය තුළ වි දායක වෙමින් කටයුතු කිරීම අපට ඉ

දළුගම සහායක පියතුමා හැටියට අවදියේ දළුගම ග්‍රාමය හා දේවස්ථාන ප්‍රැන්සිස් සාලෙස් මුනි ජීවිත කතාව පි කරුණු හෙළිකරන "කතා දෙකක්" න ලියා පල කිරීමට මා උනන්දු කෙළේ ඇන්තනි පෙරේරා රදගුරුතුමා බව කිරීම ද යුක්ති යුක්තය.

මින් අනතුරුව අපේ අවධානය නොබෝදා ශා. ලුසියා ආසන දෙව් මැ වම් ලබාගත් නවක සහයක රදගුරු හි වෙතය. ගරු පිදේලිස් ලයනල් එම්මා පියතුමා පූජකවරය ලබා ගැනීමෙන් ප සේවය ආරම්භ කෙළේත් දළුගම මීස පේමාදරයෙන් නවක පියතුමා දළුගම පිළිගත් අන්දම අපට අමතක නොවේ. මීසම පාලනාධිපති ධුරය දැරුවේ ගරු ජයතිලක පියතුමායි. සපුගස්කන්ද දේ නිවාසය බවට පත්කරගනිමින් එම්මා දළුගම දේව ජනතාව වෙනුවෙන් ඉම අපෝස්තලික සේවාවක් ඉටුකළ බව කි

1981 ජූලි 25 වැනි දින පූජාත්වරය ග්‍රැන්විල් සිල්වා නවක පියතුමා ද සහ පියතුමකු හැටියට හා පුරා කියා පියන මීසමටයි. එදා අප මීසම බාරව සිටියෙ පෙරේරා පියතුමායි. මීසම් පාලනය පි අත්දැකීම් රාශියකින් පිරිපුන්ව සිටි ලි නවක පූජක පුතු වැළඳගත්තේ පිය වසර දෙකක් පුරා මැක්ස්වල් සිල්වා පි ඉගෙන ගත් දේ බොහෝ ය.

ගරු මැක්ස්වෙල් සහයක පියතුමා ගතකරද්දී මම නැසීගිය තිස්සත් සමඟ

...ීතයක් වේවා !

...ලාවත ධීවර උද්ඝෝෂණයට ...නොවූ සැටියක් පෙනේ. මීට ...ණා සොයා බැලීම අදාළ ...ා මෙන්ම ආගමික ...ගේ ද වගකීමක් ලෙස ...ය හැකිය. ජාතික ප්‍රශ්නය ...දහා ස්ථාපිත කළ උගත් ...ා සංහිඳියාවේ කොමිසම පරිදි, ...ලය සහ උද්ඝෝෂණය ගැන ...ක් පත් කිරීම කාලෝචිත යැයි ...ය හැකිය.

...දී සුපුරුදු දේශපාලන ...ගන් සහ එන්. ජී. ඕ. ...ගන් අසරණ ධීවර ජනතාව ...ීම කතෝලික ආගමික ...යේ එඬේරමය වගකීමකි. ...නාය දැක්වීම රජයට සම්බන්ධ ...ඥයින්ගේ ද යුතුකමකි. ...දේශපාලන පක්ෂ ද මීට ...ර ගැනීම සමබර විසඳුමක් ...යෝජනවත් වනු ...ානය. මේ සියලු විසඳුම්වල, ...ල ප්‍රතිඵලය විය යුත්තේ ...ී අභිවෘද්ධියයි. අසරණ ගොවි ...රජයෙන් ලබා දෙන විවිධ ...සේ ඉහළ ජීවන මට්ටමක ...ජනතාවක් බවට ක්‍රමයෙන් ...ී පවතී. ධීවර ජනතාවගේ ...ද එයම වන්නේ ය. ගොවි ජනතාව මහ ජනතාවට බත සපයන පරිදි, ධීවර ජනතාව බතට අවැසි නැතිවම බැරි මාළුව සපයයි.

මේ අනුව සිරිලංක උතුර, දකුණ, බටහිර, නැගෙනහිර යන සිව්දිග වෙසෙන ධීවර ජනතාවගේ එකමුතුවක් අත්‍යවශ්‍යව ඇත. (මෙවර උද්ඝෝෂණය රටට දැනුනේ මීගමුවේ සහ හලාවත ධීවර ජනතාවගෙන් පමණකි) එම නිසා දීප ව්‍යාප්ත ධීවර සංසදයක් හෙවත් ධීවර සම්මේලනයක් ස්ථාපිත කිරීමට කාලය පැමිණ ඇත. මෙහි දී "පුදැදුරු - ධීවර" සාධකය, අඛණ්ඩව අපරට ජනතා පංච මහා බලවේගයේ බලසම්පන්න සුසංයෝගයක් විය යුතුය. ධීවර ජනතාව ද, ගොවි ජනතාව මෙන් සමාජයේ වැදගත් කොටසක් බවට පත්වන්නේ එවිටයැ. සකල ලක් වාසී ජනතාවට එය අමතක නොවේවා!

ධීවරයාගේ කඳුළු සුසුම් පහ වී ගොස්, ජවසම්පන්න ධීවර හඬ, ඉමිහිරි ධීවර ගීතයක් බවට පත්වේවා! කතෝලික ජනතා පැතුම එයම නොවේ ද?

වෛද්‍ය නෙල්සන් දයානන්ද වැලිකඩආරච්චි
මීගමුව

...ළුගම මීසම

...1 දින සිට අද ...ශාල සේවාවකට ...හත් සතුටෙකි. ...කටයුතු කරන ...ය ගැනත් ශුද්ධවු ...ළිබඳවත්, ...මැති පොත ...ගරු හැරල්ඩ් ...මහිලා සඳහන් ...යාමු වන්නේ ...දුරේදී රදගුරු ...මි දෙනම ...නුවෙල් ප්‍රනාන්දු ...සු සිය මීසම් ...මෙනි. හද බැති ...ජනතාව විසින් ... එවකට දළුගම ...ද බෙනඩික් ...වස්ථානය තම ...නුවෙල් පියතුමා ...ගත් ...තිවමනාය. ...ලද මැක්ස්වල් ...යක පදවි පූජක ...ැගුවේ දළුගම ...ස් ගරු ලියෝ ...ළිබඳ ගැඹුරු ...යෝ පියතුමා ...සනෙහසිනි. ...යතුමා දලුගමින් ... දළුගම ...ා ඥානාර්ථ

ප්‍රදීපය පුවත්පතට "ඇබිත්තයා" කාටූනය ලියමින් සිටියෙමි. 1984 ජූනි 17 දා පළවූ 131 වැනි කාටූනය මැක්ස්වෙල් පියතුමා ගැනය. එය මෙසේ විය. තිස්සගේ චිත්‍රයේ ඇඳ තිබුණේ ලියෝ පියතුමා සන්කිරිස්තියන්ට කතා කරන විලාසයෙකි.

ලොකු සුවාමි - මැක්ෂි කෝ?
සන්කිරිස්තියන් - මොක මේ වෙලාවෙ සුවාමිට මැක්ෂිකෝව මතක් වුණේ රට යන්නවත් හිතිල ද?
ලොකු සුවාමි - "විකාර නැතිව ගිහින් පුංචි සුවාමිට කතා කරනවා"

1983 එක් සැන්දෑවක දළුගම මීසමෙන් එකතු කරගත් දැනුම් සම්භාරය ද පොදි බැඳගෙන ගරු මැක්ස්වෙල් සිල්වා පියතුමා තිබ්බටුගොඩ මීසම් සේවක පියතුමා වශයෙන් මාරු වී ගියේය. එදා තරුණ සහයක පියතුමා පෙරටුකොට ගෙන දළුගම ග්‍රාම වාසීන් තිබ්බටුගොඩ ගියේ බස් පහකින් ය. අද දළුගම දේව ජනතාව දැයට ලැබුණු ලෙසිනාහි නාමධාරී නවක රදගුරු තුමා ගැන අන් හැමෝටම වඩා තුටුපහටු වීම අරුමයක් නොවේ.

යට දැක්වූ රදගුරුතුමන්ලා සය දෙනා වෙත යම් තරමකින් හෝ සෙවන ලබා දීමට, එතුමන්ලාට ඇප උපස්ථාන කිරීමට ඇප වූ කැපවූ දළුගම මීසම් ජනතාව නිහතමානීව අද ආඩම්බර වෙති. මෙම වරම අප මීසම ලද දුර්ලභ භාග්‍යයෙකි. දේව වරමකි. මෙම සුවිශේෂී ප්‍රසාදය ලැබීමට තරම් අප භාග්‍යවන්ත වූයේ අප මීසමේ ආරක්ෂක සාන්තුවරයා වූ සා. ෆ්‍රැන්සිස් සාලෙස් මුනි මොක් පුරයේ රන් කිරුළ දැරූ අග රදගුරු ප්‍රසාදීත් කෙනෙකු වූ නිසා දැයි විටෙක සිතෙයි.

මොරිස් බොල්ලෑගල
දළුගම

'යටගිය දවස' 100 වැනි කොටස සපුරයි

කොළඹ කතෝලික සුළමුල -02

පෘතුගීසීන් සහ ඕලන්දයන් අතර කොළඹ පැවැතියේ තියුණු සටනකි. ඕලන්ද ආක්‍රමණික හමුදාවෝ ක්‍රි.ව. 1655 දී පළමුවෙන් ම කොළඹ ආශ්චර්යමත් අප ස්වාමිදූ ගේ හෙවත් මිලාගිරියේ කතෝලික දෙව් මැඳුර අල්ලා ගත්හ. එ තැනින් පෙරට පැමිණි ඔවුහු හල්ෆ්ටඩෝර්ප්හි ජීවයේ අප ස්වාමිදූ ගේ දෙව්මැඳුර ද සන්තබස්තියමේ ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ නමින් වූ දෙව්මැඳුර ද වුල්ෆන්ඩාල්හි ගුආඩලූපේ අප ස්වාමිදූ ගේ දෙව්මැඳුර ද ජින්තුපිටියේ ශු. තෝමස් මුනිඳුන් ගේ දෙව්මැඳුර ද ආක්‍රමණය කළෝ ය.

මෙම අවසානකොට සඳහන් කළ ශු. තෝමස් මුනිඳුන් ගේ නමින් වූ දෙව් මැඳුරේ උන්වහන්සේ ගේ විශාල ප්‍රතිමාවක් විය. දෙව් මැඳුරට කඩා වැදුන ඕලන්ද භට පිරිස එම ප්‍රතිමාව පිටතට ගෙන විකෘති කළහ. එය පරිහාසයට පත් කරමින් අංග ඡේදනය කොට කාලතුවක්කුවක ආධාරයෙන් නගරයට වීසිකැර දමන ලදි. මෙයින් ඕලන්දයන් අතට පත් වූ සෙසු දෙව් මැඳුරුවලට අත් වූ ඉරණම කුමක් දැයි අමුතුවෙන් කිව යුතු නො වේ. පෘතුගීසින් දිවයින මත පා තැබීමට පෙර සිට ම මෙරට ජනතාව ශු. තෝමස් අපෝස්තුළුවරයාණන් ගැන දැන සිටියේ එතුමන් දිවයිනේ කොළඹට වැඩම කළ බවට ඔවුන් තුළ විශ්වාසයක් පැවැති නිසා ය. පෘතුගීසින් ද මෙම විශ්වාසයේ පැවැති බවට සාක්ෂි දී ඇත. ශු. තෝමස් මුනිඳුන් ගේ දෙව්මැඳුර මෙතරම් විශේෂ වූයේ මේ නිසා ය.

යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ
100

මෙය සත්‍යයක් ම බව පිළිගන්නට අද ලිඛිත සාධක ලැබී තිබේ. මෙය ග්‍රීක බසින් ආසියාවේ කතෝලික ඉතිහාසය ලියා ඇති ඉතිහාසඥ නිකේෆොරෝස් කැලිස්ටොස් සන්තුපොලෝස් පැහැදිලි ව සඳහන් කරයි. ආරම්භයේ සිට ක්‍රි.ව. 610 දක්වා වූ කාලයේ ආසියාවේ කිතුනු ඉතිහාසය කාණ්ඩ 18 කින් සමන්විත ග්‍රන්ථයක සටහන් කරන හෙතෙම මෙසේ ලියා ඇත්තේ ක්‍රි.ව. 1328 පෙරය. (ශ්‍රී ලංකාවේ කිතුනු දායකත්වය - 15 වැනි පිටුව).

කෙසේ වෙතත් පෘතුගීසි සෙබළු කොළඹ රැකගැනීම සඳහා එඩිතර සටනක කලක් යෙදී සිටියහ. ඔවුන් විසින් ඕලන්ද ප්‍රයත්නයන් දෙක තුනක් ම පරදවන ලදි. මින් එක් සටනක දී තුවාල ලද හල්ෆ්ට් ජනරාල් වරයා ද මිය ගියේ ය.

හත් මසක් තුළ මෙසේ කොළඹ ආරක්ෂා කළ පෘතුගීසි භටයනට විරුද්ධ ව මුහුණට මුහුණලා සටන් වැදීමට වඩා ක්‍රමයෙන් ඔවුන් අහේනියට පත් කිරීම යෝග්‍ය යැයි සිතූ ඕලන්ද භට පිරිස, නගරයේ ගනු දෙනු හා සම්බන්ධතා ද සියල්ල අවහිර කළහ.

මෙසේ දිය ගොඩ සැම මාර්ගයන් බාධා කිරීමේ හේතුවෙන් ආහාර මෙන් ම ආයුධ හිඟයෙන් ද පීඩනයට පත් ඉතිරිව සිටි වීර පෘතුගීසි භට පිරිස ක්‍රි.ව. 1656 මැයි මස ඕලන්දයිනට යටත් වූහ.කොළඹට ඇතුළු වූ ජයග්‍රාහී ඕලන්ද හේවායෝ එහි පිහිටි කතෝලික දෙව්මැඳුරු සියල්ල විනාශ කැර දැමුවෝ ය. මේ ගැන ජේසු නිකායික සහෝදරතුමකු සඳහන් කර ඇති වැදගත් කතාවෙකි. ඒ මෙසේය.

කොච්චින් (අද කොච්චි) නුවර සිටි මෙම සහෝදරතුමා මීට පසළොස් වසරකට පෙර ඕලන්දයින් ගේ ව්‍යසනයෙන් දිවයින ආරක්ෂා කැර දෙන පිණිසත් ඔවුනට දඬුවම් පමුණුවන පිණිසත් දෙවිඳුන් යදිමින් සිටිය දී හෙතෙම දර්ශනයක් දුටුවේ ය. මේ දර්ශනය වූ තැනැත්තා ඕලන්දයිනට දඬුවම් කරන ලෙස නොඉල්ලන්නැයි ඔහුට අවවාද කළේ ය. එයට හේතුව - "පෘතුගීසින් ගේ දුෂ්ට ක්‍රියාවන් නිසා ඔවුනට දඬුවම් පමුණුවනු පිණිස මම ඕලන්දයින් තෝරා ගතිමි" හෙතෙම වැඩි දුරටත් විස්තර කළේ යැයි සටහන් වන්නේ ය. (මෙය සටහන් වන්නේ ජේසු නිකායික ලේඛනයකයි)

මෙසේ ආරම්භ වූ ඕලන්ද පීඩනය සීඝ්‍රයෙන් දරුණු විය. දෙව් මැඳුරු විනාශ කිරීම හැර ගරු පියවරුන් සියලු දෙනා ම දිවයිනෙන් පිටුවහල් කැර යවන ලදි. පියතුමකු සඳහා ආරක්ෂාව සැපයීම මෙන් ම පියතුමකු සිටින වග දැන රජයට නො දන්වා සිටීම ද මරණීය දණ්ඩනය ලැබිය හැකි වැරැදි වූහ. කතෝලික ළමයින් රෙපරමාදු ආගමේ පිළිවෙත් අනුව ක්‍රිස්තියානි කළ යුතු වූ අතර, ඔවුන් එම පාසල් වලට යැවීම අනිවාර්යයෙන් ම කළ යුතුව තිබුණි. රෙපරමාදු දෙව් මැඳුරු වලින් පිට විවාහ වීම භූමදාන කිරීම ආදි සියල්ල තහනම් කෙරිණ.

ශු. තෝමස් අපෝස්තුළුවරයාණන් ගේ පාද පහස ලබා භාග්‍යවත් වූ කොළඹ නගරය පෘතුගීසි දහම් දූත පිරිස ගෙන් පුනර්ජීවයක් ලැබුවත් ඒ සමඟ පැමිණි යුරෝපීය පාපතර කණ්ඩායමක ගේ පාපිෂ්ඨ පැවැත් ම නිසා දේව උදහසට ලක්වූයේ දැයි ප්‍රශ්න කළ හැකි ය.

මේ අවස්ථාවේ මහනුවර දෙ වැනි රාජසිංහ රජු අසරණ වූ කතෝලිකයිනට ඉමහත් අස්වැසිල්ලක් වූ බව සඳහන් කළ යුතු යි. එතුමා නුවර රාජධානියේ ඉමෙහි පිහිටි සීතාවක, කැන්දගමුව, රුවන්වැල්ල සහ රත්නපුර යන පළාත් වලට ඔවුන් කැඳවා ආරක්ෂාව සපයා දුන්නේ ය.

කතෝලික දහමේ තුන්වැනි වසන්තය සඳහා පූර්වෝක්ත සියල්ල තුඩු දුන් බව කිව යුතු යි. මේ මහා ව්‍යසනය මැද දහමෙහි සෘජුව රැඳී සිටි පිරිස කෙරෙහි බැල්ම හෙලූ දේවෝත්මයාණෝ ඔවුනට සරණ වීම් වස් ශික්ෂාකාමී පූජක මිණි පහනක් දිවයිනේ දල්වන්නට මඟ පෑදූහ. ඒ ක්‍රි.ව. 1651 උපත ලබා, 1676 දී පූජකවරයට ඔසවන ලදු ව 1686 දී දිවයනට සැපත් වූ භාග්‍යවන්ත ජූසේ වාස් පියතුමෝ ය. එතුමන් පසු පස ඉන්දියාවේ ඔරතෝරියාන නිකායික පියවරු ද, දිවයිනට පැමිණියහ. මේ අතර ක්‍රි.ව. 1705 දී පැමිණි ශික්ෂිත, වියත් ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාට විශේෂ තැනක් හිමි වන්නේ ය. මේ පියවරුන් දෙදෙනා දිවයිනට දෙව් දැති වරමක් ම යැයි කිව යුතුයි. මෙ තැන් සිට මෙ රට කතෝලික දහම දේශානුගත වී නව මුහුණුවරක් ගත් බව රහසක් නො වේ.

දිවයිනට සැපත් වී යාපනයෙන් පුත්තලමට ද පුත්තලමෙන් නුවරට ද පැමිණ, සිරගත වීම ඇතුළු නොයෙක් තාඩන පීඩන විඳ දරා, පසුව නුවර රාජානුග්‍රහය ලබා ගත් ජූසේ වාස් පියතුමා යාචකයකු ගේ විලසින් වරින් වර කොළඹට පැමිණියේ ය. මෙය දැනගත් ඕලන්ද පාලකයෝ එතුමන් අල්ලා ගැනීම් වස් වෙර දැරුවත් ඒ උත්සාහය අසාර්ථක විය. රාත්‍රි කාලයේ පැමිණි පියතුමා පීඩනයට පත් කතෝලිකයින් සොයා ගොස් ඔවුන් දිරිගන්වා, සණසා එක්සත් කණ්ඩායමක් බවට පත් කළේ ය. වාස් පියතුමන් ගේ සහාය සඳහා ඔරතෝරියාන නිකායේ පියවරු රැසක් ද මෙහි ක්‍රමයෙන් පැමිණියහ. එතුමන්ලා ද නුවර රාජධානියේ රැඳී සිට නිතොර කොළඹට "කාන්දු වී" සේවා කළෝ ය. කලකට පසු පියතුමකු ස්ථිරව ම කොළඹ රැඳී සිට රහසේ සේවා කළේ ය. එතුමා ගැන ද ඕලන්දයින් දැඩි සෙවිල්ලෙන් සිටියත් එයින් පලක් නො වීය.

මේ කාලය තුළ බොහෝ දෙනෙක් කතෝලික දහම වැළඳ ගත්හ. ඒ අතර දෙව්මැඳුරු කිහිපයක් ද කොළඹ ඉදිවිය. මේවා පිටස්තරයෙන් සාමාන්‍ය නිවෙසක ස්වරූපය ගත්තත් ඇතුළත සකස් වී තිබුණේ දේව වන්දනාවේ අවශ්‍යතාවයන් අනුවයි.

මේවායේ සේවා කළ පියතුමන්ලා ගැන ද කොළඹ නගරේ මහා මාර්ගවල එතුමනට වද දුන් සැටි ද විස්තර කෙරෙන වාර්තා රැසෙකි. එක්තරා ඉග්නේෂස් ද අල්මේඩා නමැති පියතුමකු අල්ලා ගෙන ඕලන්දයට ම පිටුවහල් කිරීම පිළිබඳ සවිස්තර වාර්තාවකි. එහෙත් මේ සියල්ල මැද දැඩි ශක්තියකින් යුතුව විශ්වාසය රැකගත් කතෝලික පිරිස ගැන අවසානයේ දී රෙපරමාදු පිරිස පවා පැහැදීමට පත් වූහ. මේ වන විට ඒ පිරිස ද කතෝලිකයන් කෙරෙහි අනුකම්පාවෙන් ඕලන්ද භට පිරිස් කඩා පැනීම් ආදිය ගැන ඔත්තු දුන්හ.

ඕලන්දයින් ආරම්භයේ දී කතෝලිකයින් පීඩනයට පත් කළේ ඔවුන් පෘතුගීසිනට පක්ෂවනු ඇතැයි යන බියෙනි. එහෙත් පෘතුගීසි බලය ක්‍රමයෙන් පහ වී යාමත් සමඟ ඒ බිය ද පහවී ගියේ ය. තවද ක්‍රි.ව. 1762 - 5 අතර ඔවුන් නුවර රාජධානියට විරුද්ධව යුද වැදීමත් සමඟ කතෝලිකයිනට පීඩා කිරීම අවාසි වනු ඇතැයි සිතා ගත්තෝ ය. මේ අනුව ක්‍රි.ව. 1774 සිට කොන්දේසි මත අත්සන් තබා කතෝලික පූජාප්‍රසාදිවරුනට කොළඹ නැවැතී සිටීම සඳහා අවසර දෙන ලදි.

ක්‍රි.ව. 1796 දී ඉංගිරීසිහු ඕලන්දයින් පරාජයකොට දිවයිනේ මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අත්පත් කර ගත්හ. කොළඹ ඔවුනට යටත් කැරගත් විගස, ඔවුන් ගේ ප්‍රථම හමුදා ආණ්ඩුකාර තුමා හෙවත් ජෙනරාල් ජේම්ස් ස්ටුවර්ට් මසක් ගත වන්නට පෙර ඉංගිරිසින් ගේ පාලනය යටතේ පවතින දිවයිනේ සියලු පළාත්හි ජීවත්වන කතෝලික පියතුමනට තම ආගමික කටයුතු කර ගැනීම සඳහා නිදහස දානය කළේ ය. ක්‍රි.ව. 1806 මැයි මස 27 වැනි දින තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාර තුමා නිල නිවේදනයක් නිකුත් කොට එම සියලු ප්‍රදේශවල ඔවුනට පූර්ණ ආගමික නිදහස සහතික කළේ ය.

පැදි නදිය

ඔබ නෑ අම්මේ!

නන් දෙසින් රසවත් කව්ගී ඇසෙනා විට
මොකක්දෝ දොම්නසක් දැනෙනවා මට විටින් විට
ආදර අම්මේ, අද ඔබ නැති බව දැනෙන විට
කාටත් හොරා වැටෙනවා මට කඳුළු කැට

සෙනෙහස් පියුම් විලේ ඔබ අග රාජිනියයි අම්මේ
ඒ ගුණ සුවඳ මා වින්දා හොඳ හැටි අම්මේ
නමින් 'මේරි එළිසබෙත්' ලෙස දුන් ගුරුහරුකම් අම්මේ
අවවාදයට වඩා මහ මෙර ලෙස දුන්නා ආදර්ශය අපෙ අම්මේ

ජූඩිත් රසිකා ගීතාංජලි හතුරුසිංහ

සමුගත් සුහදයාණෙනි!

වසරක් ගත වුනත් ඔබ අහිමිව දැනට
අද ඊයේ සිදු වූ සේ දැනේ මට
නෙත්පුරා පිරි උණුසුම් කඳුළු කැට
ළය තුළ සඟවා ගන්නෙමි දිරිගෙන සිතට

ඔබ හා ගෙවූ ඒ යුග දිවියෙ මතක
යළි යළි රිදුම් දෙයි දුක සඟවා සිතෙක
තනිකම පාළුවෙන් පිරුණු අඳුරු ලොවක
විඳවමි ලොවට රහසින් ඔබ ගැන මතක

යන හැම තැනම අප හා එකටම උන්න
දරු දෙදෙනාට නොඅඩුව සෙනෙහස දුන්න
මේ ගිය ගමන දෙවිඳුන් හා එක් වන්න
අමතක වෙන්න ඇති අපවත් ගෙන යන්න

ඒ දිවිය නැවතත් නොඑනා බව දනිමි
ඔබෙ යහ ගුණ සුවඳ නිරතුරු සිහි කරමි
ඔබෙ දිවි නිසා නිති දෙවිඳුන්ට තුති පුදමි
ඔබ දෙවිඳුන් ළඟ යැයි සිතා මම සතුටු වෙමි

ලිලන්ති පීරිස්
කොරළවැල්ල

වාස් පිය සමිඳ !

මියැදෙන මෙරට කිතු දම යළි පණගන්න
ලැබගෙන අවසරය දෙව් මත විලසින්න
අරගෙන හිඟන වෙස සහයකු සමඟින්න
සපැමිණ ඔබයි දහමට යළි පණදුන්න

එදවස කිතුනු දන සිරිලක තුළ විසුව
නිදහස නැතිව දෙවිඳුන් රහසේ යැදුම
සියවස දහහතේ මෙම ගනඳුර නැසුව
සිසිලස ඔබයි දහමින් ලක එළි කෙරුව

අපේ හෙළගති දමිළ සිංහල හොඳට දැනගෙන
අපේ හැදියා ගති සිරිත් හැම අගය කරමින
අපේ ජන හද ගැස්ම හරියට හොඳට දැනගෙන
අපේ රට තුළ දහම තිර කලෙ ඔබයි වෙරගෙන

සුවකර වසූරිය ලෙඩ දන සිටි වැතිරී
දුරු කර සාගතය මෙහි තිබූ පැතිරී
නිමකර නියඟ වැසි ජල රට මැද ඉතිරී
පෙළහර පෑහ දෙවි බල සැම තැන විසිරී

තියබෝල්ඩ් සමරතුංග
රත්නපුර

පාතිමා මෑණියේ

රට වටා පෙරහැරෙන්
දම් සුවඳ පතුරමින්
සැරිසැරූ අතීතේ
පාතිමාවේ මෑණි
ඔබයි අපේ මෑණි

යනෙන මඟ මොහොතකට
නවාතැන් ගත් එදා
මඟ තිබූ දෙව් මැඳුර
නමින් දුම්මලදෙණිය
ඔබට මතකද මෑණි

ඒ වගත් සිහිවන්න
ඔබේ පිළිරුව තබා
බුහුමන් කළෝ අප
ගම්වාසි පැරැන්නෝ
බැති සිතින් මෑණියනි

කලක් ගතවී ගොසින්
හුදකලා වී ඉඳින්
කවුරුන් හෝ ඒවිදැයි
මලක් පුදකර යන්න
බලා සිටි අප මෑනි

වරද නිවැරදි කරන්
නිතින ඔබ නමදින්න
ඔබේ පිහිට ලැබ ගන්න
දෙනු මැනවි ඔබේ වරම්
සමාවී මෑණියනි

දුම්මලදෙණියේ පද්මා

අරුමය !

අහස පියස කැර
ලක්බිම විසුමට
සිහළිච්චි හා දෙමළිච්චි
පොල් තල් කොළ ගෙන
පැලක් හදනවා
කිරි උතුරන්නට එන්න කියා
නැවුම් මුට්ටියක්
එළකිරි බඳුනක්
රැගෙන යන්න බැරි මිනිසුන්ට
නිදහස ගැන මහ කවක්
ලියන්නට ඉඩක් කොහේ?

පිටිපන මා. ජයවීර

බේද නොතකන නිදහසක්!

නිදහස, නිදහස, නිදහස, නිදහස
සිව් දෙසින් ඇසෙනා නිදහස
කාහල නදින් ගිගුම් දෙන නිදහස
අපිත් සමරමු, හැට හතර වන නිදහස

යටත් විජිත සිඳ බිඳ ලු නිදහස
ලෙයින් මුසපත් නොවූ නිදහස
හෙළ බස, මව් බස කර වූ නිදහස
දිවි හිමියෙන් රකිමු, අප ඒ නිදහස

තිස් වසක් පුරා අළු යට සැඟවූ නිදහස
යුධ ගිනි නිවී හිස එසවූ නිදහස
හෙට දිනටත් කැන්දන් යා යුතු නිදහස
නැණ නුවණින් හසුරවමු, ඒ උදාර නිදහස

කැමති ආගමක් වැළඳ ඇදහූ නිදහස
කැමති මතයක් දරා පැවසූ නිදහස
කැමති පෙදෙසක් තෝරා දිවි ගෙවූ නිදහස
සහතික කරමු, භේද නොතකන නිදහස

වසන්ත පී. ඒ. රත්නායක
රද්දොළුගම

නිදහස ලැබුවා ද ?

ජාතික කොඩිය අඩ කුඹ කර තබා ඇත
ජාතික ගීයෙ පද සුන්රුත් වෙලා ඇත
ජාතික ඇඳුම අඳිනා තරුණයෙක් නැත
ජාතික හැඟුම ඇති හෙළයන් රටේ නැත

හෙළ බස ඔහේ උඹ බං ලඟ රැඳී ඇත
හෙළ ගති කොහේ? පර ගැති බව වෙලී ඇත
මළ ගිය වුන් පවා කඳු ලැලි හෙළනු ඇත
වල ගිය ජාතිකාභිමන ළඟ වැසේ නෙත

සුද්දන්ගේ රටින් නිදහස ලැබ ගත්තු
රටවල් බොහෝ ඇත තමකම රැක ගත්තු
අප හට බැරි වුනේ ඇයි සිහි කර පුත්තු
දැන්වත් හැදෙන්නට පාඩම් ගත යුත්තු

රටින් අඩක් පිටරට වල වහලුන් වී
කටින් බතල හිටවති සමහරු ලං වී
වැටෙන් පැන ගියා! මෙහි හෙළ ගති සුන් වී
වහෙන් ඔරෝ මොකටද බොරුවෙන් මත් වී

ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්
තලාව

නවක රදගුරු තුමෙනි !

ආසිරි ලබා මිදි උයනේ සේවයට
පූජක පුතකු ලෙස ආ දින අප ගමට
මල් නැටුමකින් පිළිගෙන උණුසුම් ලෙසට
ගෙන ආ අයුරු සිහිවේ උතුරා සතුට

ඔබ පියතුමකු වු දා මම ජීවිතයේ
ගැඹුරක් නොදත් පොඩි දැරියක් සේ සිටියේ
ගරු රදගුරුතුමකු ලෙස ඔබ වඩින දිනේ
මව් පදවිය සමඟ දිවියේ ගැඹුර දැනේ

දියණියක් ලෙසින් මා ඔබ දුටුවේ එදා
දරු සෙනෙහසින් පිරි අම්මා කෙනෙකි මෙදා
රදගුරු පදවි ලැබ එනවිට ගමට මෙදා
නොහැකිය පැමිණි පිළි ගැනුමට සතුට බෙදා

අයදිමි පියාණනි සමිඳුගේ මිදි උයනේ
කිතු ගොස පතුරන්න සැමවිට කිතු සබයේ
ජීවමාන දෙවිඳුන් ධර්මය හමුවේ
යුගයේ දිවැසිවරයා ඔබ වන්න පියේ

අනුජා තුෂාරි ප්‍රනාන්දු
ප්‍රංශයේ
පැරිස් නුවර සිට

දුම්රිය ගමන

රැකියාවට යාමට දුම්රියෙ මා ආවා
සැමදා ඔබගේ නෙත් මා දුටුවා
ඔබ සිටිනා මැදිරියටම ගොඩ වූවා
පළමුව සිනාසී දෙවනුව බස් දෙඩුවා

මිතුරන්ගේ විහිළු වලින් අප දෙදෙනා
හිත් එක් වුනා සැමදා ආදර පානා
සති අන්තයේ අප හැමදා හමු වුනා
මව් පිය ආසිරි අප දෙදෙනා හට ලැබුනා

දෙවිඳුන්ගේ පිහිට ලැබූ අප දෙදෙනා එක්වූවා
එදා සිට දෙදෙනකු නොව එකෙකියි වූවා
අප හට උදව් කළ හැම හට සෙත වේවා
දුම්රිය ගමනෙ අගය කාටත් වැටහේවා!

ආනන්ද ජයකොඩි
කැපුන්ගොඩ

අත්හැරීම

වරම් නෑ මට සිනාවෙන්නට සිනාසෙමි මම හදවතින්
දෙනෝදාහක් ගැවසෙන ලොව තනිවෙලා මා හද සොවින්
ජීවිතය මේ දැයි සිත සිතා හෙලමි දුක් සුසුමන්
කුමක් කරන්නද කොහේ යන්නද ගෙවෙන්නේ දින ලතවෙමින්

ඇකයේ හොවා ලේ කිරට පෙරූ දරු සෙනෙහස කෝ කොයිදෝ?
ආ මඟ විඳිදුක් කරදර මහමෙර දැරුවේ කා වෙනුවෙන් දෝ?
හැලේ කඳුළු වැල් තෙමේ මිහිතලය ගුවන් ගැබ කම්පා වේදෝ?
සියල්ල අනියත මේ ලෝකය තුළ සතුට සදාකාලික වේදෝ?

දරු කුසගිනි වරා නෙතනිදි දරුවෝ හැදූ ඒ අම්මා
පුරා පෙරුමන් සැදූ මාලිගා අහස් ගව්වක ගැටුනා
දුකද සැපතද එකසේ සලකා ඔවුන් මිනිසුන් කෙරුවා
කෝ ඒ මිනිසුන් ඈ දමා ගොස් හඬයි අද කිරි අම්මා

සුනේත්‍රා කෝදාගොඩ
උතුවන්කන්ද

අම්මා

හිරුත් සමඟ නුඹ අවදිව
දිවා රෑයේ නිති වෙහෙසව
සඳ තරු මිලිනව ගිය පසු
නින්දට ගිය සුදු අම්මේ

නුඹෙ රුධිරය කිරි කරවා
කිරි සයුරෙන් මා නහවා
ගතට සිතට සවිය දුන්න
නුඹයි මගේ අම්මා

ලෝකෙට නොම බරක් වෙන්න
රටට වැඩැති අයෙක් වෙන්න
ගුණ දහමින් සිත වඩන්න
ඔවදන් දුන් අම්මේ

මගේ විලිරුදා අතරේ
පෙනුනේ මට ඔබේ මුහුණ
මමත් මවක් වූ දිනයේ
දැනුනා මට නුඹේ අගේ

දෙපා වාරු නොමැති කමින්
අද නුඹ එක් තැන් උනාට
මගේ සිතින් මගේ ගතින්
නුඹට දිරිය දෙන්නම් මං

තුෂාරි සංගපාලආරච්චි
දුන්ගාල්පිටිය

තවත් චතාරිකයක්ද?

චතාරිකය - ඇරඹුනාය
නළලේ අළු - තැවරුවාය
මරණය ගැන - කියවුනාය
මං පොඩ්ඩක් - බිය වුනාය

කල්වර් බිම් - මැතුරුවාය
ට්‍රිප් එකකට - සැරසුනාය
ගමේ මැඳුර - නොදුටුව අය
බස් එකටත් - ගොඩවෙලාය

අපොයි දුකෙන් - සුසුම්ලනව
මහ පාරෙත්. - දණ ගහනව
කුරුස පෙට්ටි - කරගහනව
දොඩව දොඩව - පියමනිනව

ඉටි පන්දම් පොකුරු - පිටින්
කානික්කන් - සිලින් බිලින්
බැතිබර වු මහ - දෙනුවන්
කුරුස ගසට - හිස ඔසවන්

ජේසු සමිඳු - කුරුස ගසේ
ඉකි බිඳිනව - එදා ලෙසේ
යන්න එපා - නොදැක සිතේ
බොරු නොකරන් - දුවේ පුතේ

ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා
පුල්ලුහේන

බැසිල් ෆොන්සේකා විසිනි

සාම සංස්කෘතියක් බිහි කිරීමට ආගම් දායකත්වය



පසුගිය සතියේ, එක්සත් ජාතීන්ගේ මණ්ඩලීය රැස්වීම් වාරයේ දී ජගත් ආගමික නායකයින් වෙතින් සාමයේ බලාපොරොත්තු හඬක් නික්මිණි. කැඩුණු හා බිඳුණු ලෝකයේ සංකීර්ණ ජන කොටස් සාමයේ රැහැනින් ඒකරාශී කිරීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි එකම මග සමයාන්තර සංහිඳියාව උදාකැරුම බවට විවිධ ආගම් නායකයින් විසින් මහා හඬක් නගන ලදි.

එක්සත් ජාතීන්ගේ මහා සමුළු බිමේදී මෙම සමයාන්තර සංහිඳියාවේ අවැසිතා හඬ ලොවටමැ ප්‍රකාශ කළේ එහි රැස්ව සිටි කිතුනු ආගමික නියෝජිත පිරිස විසිනි. වර්ෂයක් පාසා පෙබරවාරි මස 1-7 දක්වා ජගත් සමයාන්තර සතිය ලෙසින් ප්‍රකාශයට පත් කරනු ලැබීය. ඒ අනුව ලෝකය පුරා ඒ ඒ රටවල සමයාන්තර සහයෝගිතා සංවිධාන මෙම සතිය තුළ දී විවිධ ක්‍රියාකාරකම් හා කතිකාවන් පැවැත්විය. ලෝක සමයාන්තර ආගමික නියෝජිතයන්ගේ එකමුතු සැසිවාරය එක්සත් ජාතීන්ගේ මහ සමුළුවේදී පැවැත්විණි. ශුද්ධාසනයේ නිත්‍ය නියෝජිත ඇතුළුව අන් කිතුනු, ඉස්ලාම්, හින්දු, බෞද්ධ, බහායි, ජුදා ආදි ආගමික නියේජිතයෝ ද එම අවස්ථාවට සහභාගි වූහ.

මිනිසා ඇතුළු සියළු භෞතික දෑ පුපුරා විනාශයට කරා යෑමට ආසන්නය. මිනිසා හා විශ්වයේ සංහිඳියා පැවැත්මට එකම සක්‍රීය මාර්ගය සමයාන්තර එකමුතු දායාදය බැව් එම දිනයේ දී යළිත් තහවුරු කැරිණි. මෙම සමයාන්තර සංහිඳියාව බිහිකැරුමට විවිධ මං පෙත් තෝරා ගත යුතු යයි ද සනාථ කැරිණි. සමයාන්තර සංහිඳියා පැවැත්ම සඳහා සංගීතය, නාට්‍ය, චිත්‍ර හා අන් විචිත්‍ර කලාවන් හා සෞන්දර්යයන් යොදා ගැනීම ප්‍රබල මාධ්‍යයක් වෙනු ඇතැයි ද සනිටුහන් කරනු ලැබීය. "එක ලොවක්" යන තේමාව යටතේ ඒ ඒ රටවල් වලට ආවේනික කලා නිර්මාණයන් තුළින් ලෝ සමයාන්තර සංහිඳියාව කුලු ගැන්විණි.

මාලදිවයිනේ ප්‍රජාතන්ත්‍රවාදය හා ආගමික නිදහස තහවුරු කරයි ද?

"වර්තමානයේ දී මාල දිවයිනේ උදා වී ඇති විරෝධතා රැල්ල හමුවේ එරටේ ප්‍රජාතන්ත්‍ර වාදී ක්‍රියාදාමය හා ආගමික නිදහස තහවුරු කිරීමට කාලය දැන් උදා වී තිබේ." ජාත්‍යන්තර මාධ්‍ය වෙත මෙලෙස අවධාරණය කරනු ලබන්නේ, ඉන්දීය ජගත් කිතුනු කවුන්සලයේ සභාපති ජෝන් දයාල් නම් කතෝලිකයකු වන මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකරුය. මාලදිවයිනේ ජනතා විරෝධි රැල්ල ආරම්භ වූයේ හිටපු ජනාධිපති මොහොමද් නෂීද් විසින් අපරාධ පිළිබඳ අධිකරණයේ මොහොමද් ඉබ්දුල්ලා විනිසුරු වරයා අත් අඩංගුවට ගැනීමට නියෝග කිරීමෙන් පසුවයි.

විනිසුරු වරයා විසින් නිදහස් කරනු ලැබ ඇත්තේ, හිටපු ජනාධිපති වරයාගේ දේශපාලන විරුද්ධවාදියෙකි. "මාලදිවයිනේ පවත්වූහ. අස්ථාර තත්ත්වය ඔස්සේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැරව හමුදා පාලනයක් ඇතිවිය හැක. එසේ වුවහොත් දැනටමත් අහිමි වී ඇති ආගමික නිදහස මුළුමනින්ම වැළැලී යා හැක. 'අරාබි වසන්තය' තුළින් සිදු වී ඇති දෑ ආදර්ශයට ගෙන මාලදිවයිනේ යළි නිදහස් දේශයක් වශයෙන් බිහි වේවා යන්න අපේ ප්‍රාර්ථනයයි." එලෙසින් ද එතුමා විසින් අවධාරණය කරනු ලබයි.

වර්ෂ 1997 ව්‍යවස්ථාවට අනුව මාලදිවයින ඉස්ලාම් රාජ්‍යයකි. වෙනත් ආගම් ඇදැහීම නීතියෙන් තහනම් ය. මාල දිවයිනේ පුරවැසියෙකු වෙනත් ආගමක් වැළඳ ගතහොත්, ඒ තැනැත්තාගේ පුරවැසි භාවය අහෝසි වෙයි. 2011 වර්ෂයේ දී කිතුනුවන් 50 දෙනෙකු නීතියේ රැහැනට ගෙන ඔවුන් යළි ඉස්ලාම් දහමට හරවා ඇත. සිජෝ කොකාතු නම් කිතුනු මහාචාර්ය වරයා රටින් පිටුවහල් කරනු ලැබුවේ ඔහු සතුව තිබූ ශු. බයිබලය හා ජපමාලය සොයා ගැනීමෙන් අනතුරුවය.

පළමු තැන ආගමට ද ප්‍රේමයට ද?

"ඔබ හා ඔබේ ප්‍රේමවන්තයා හෝ ප්‍රේමවන්තිය එකම ආගමට අයත් නොවන්නේ නම් ප්‍රේමයේ නාමයෙන් ඔබ ආගම වෙනස් කරන්නෙහි ද?" මෑතදී පිලිපීනයේ සිදු කළ සමීක්ෂණයකින් අසන ලද එම ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් දක්වා ඇත්තේ, ආගමට මුල් තැන දෙන බවයි.

ප්‍රේම වන්තයෝ සියයට පනහක් ප්‍රකාශ කොට ඇත්තේ නියත වශයෙන් ම ආගම වෙනස් නොකරන බවයි. තවද ප්‍රේම වන්තයන්ගෙන් සියයට 18 ක් ප්‍රකාශ කර ඇත්තේ, සිය ආගම වෙනස් නොකිරීමට ඉඩ ඇති බවය. විශේෂයෙන් කතෝලික පවුල් එම ස්ථාවරයෙහි පිහිටා සිටිති. ඉස්ලාම් ප්‍රේම වන්තයන්ගෙන් සියයට 56 ක් සිය ආගම වෙනස් නොකරන බැව් දක්වති. පිලිපීන ජනතාවගෙන් සියයට 93 ක් පමණ කිතුනුවෝ වෙති.

දහම් උගැන්වීම් නොතකන කිතුනු දේශපාලනඥයන් දෙවිඳුන්ට උත්තර දිය යුතුයි

"වඳ බෙහෙත් පාවිච්චිය, ගබ්සාව, සමලිංගික පැවැත්ම ආදී කරුණු කාරණා පිළිබඳ කිතුනු උගැන්වීම් වලට එරෙහිව ක්‍රියා කරනා කිතුනු දේශපාලනඥයන් දෙවිඳුන්ට වග උත්තර දිය යුතුයි.

එබැවින් සියළු කිතුනු දේශපාලඥයන් සිය ජීවිත දෙවිඳුන් සමඟ ගමන් කළ යුතු බැව් වටහා ගත යුතු වෙනවා. මෙලෙස කතෝලික ජාත්‍යන්තර මාධ්‍යයට ප්‍රකාශ කරනු ලැබුවේ, ඉලිනෝස් හි අතිඋතුම් ඩැනියල් ජෙන්කි රදගුරු හිමිපාණෝය. එතුමා විසින් මෙලෙසින් ප්‍රකාශ කරනු ලැබුවේ, ඇමෙරිකානු ජනාධිපති බැරැක් ඔබාමා විසින් ගබ්සාව හා වඳ බෙහෙත් පිළිබඳ ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා නීති රීති සම්මත කර ගැනීම හේතු කොටගෙනය.

තවද සමලිංගික පැවැත්ම හා ගබ්සාව නීතිගත කිරීමේ පණතක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ද නියමිතය. ඩේවිඩ් කැමරන් අගමැතිගේ මෙහෙයවීම යටතේ මෙම පණත ඉදිරිපත් කැරුණත්, ඊට පැතුරුණු විරෝධයක් ද පවති. "කිතුනු හෘද සාක්ෂිය හමුවේ සිය පක්ෂයට විරුද්ධව හෝ මෙබඳු පාපතර ක්‍රියාවන්ට එරෙහිව සිය ඡන්දය පාවිච්චි කිරීමට සියලු කිතුනු දේශපාලනඥයන්ට යුතුකමක් තිබෙනවා.

කිතුනු උගැන්වීම් හා සංස්කෘතිය මත ගොඩ නැගුණු බ්‍රිතාන්‍ය ජන ජීවිත පැවැත්මට එරෙහිවීමට ද කිතුනු දේශපාලනඥයන්ට හැකියාවක් නැහැ." මෙලෙස අවධාරණය කරනු ලබන්නේ බ්‍රිතාන්‍යයේ මාර්ක් ඩේවිස් අතිඋතුම් කතෝලික රදගුරු හිමිපාණෝය.

කිතුනුවන් 52 මරා 75 තුවාල කළ ත්‍රස්තයන්ට අධිකරණයෙන් මරණීය දඬුවම

වර්ෂ 2010 ඔක්තෝබර් මස 31 වැනිදා ඉරාකයේ බැග්ඩෑඩ් හී ගැලවීමේ අප ස්වාමි දු ගේ දෙව් මැඳුර තුළ පැවැති දේව මෙහෙයට විශාල සිරියානු කතෝලික පිරිසක් රැස්ව සිටියහ. ගිනි අවි රැගත් අල් කයිඩා සංවිධානයේ තිදෙනෙක් දෙව් මැඳුර තුළට කඩා වැද ඇදැහිලි වන්තයන්ට දිගින් දිගට වෙඩි තැබුවෝය. එම ඓතිහාසිගත ඝාතනයෙන් 52 ක් ජීවිතක්ෂයට පත්වූහ. තවද 75 ක් මරණීය තුවාල ලැබූහ. මියගිය අය අතර පූජකවරු දෙදෙනෙක් ද වූහ.

ඉරාකයේ ත්‍රස්තවාදය පිළිබඳ නීතිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඔවුන් වරද කරුවන් වශයෙන් තීරණය කරණු ලැබුවේ පෙබරවාරි මස 02 දාය. එම මරණීය දණ්ඩනය ඉරාක ජනාධිපති විසින් ද අනුමත කිරීමට නියමිතය. වර්ෂ 2003 දී සිදුවූ ඇමෙරිකානු ආක්‍රමණයෙන් පසුව සිදුවූ කිතුනු පීඩනයන් අතර එම ඝාතනය අති විශාලතම පීඩනය බව වාර්තා වී ඇත. නිමක් නොවන කිතුනු පීඩන හමුවේ, ඇති හැකි දැනුවත් බොහෝ කිතුනුවන් ඉරාකය අතහැර යාම නොකඩවා සිදුවන්නේ පවත්නා නොතිත් පීඩනයන් නිසාය. කෙසේ වුවද, ඝාතකයන්ට දී ඇති මරණීය දණ්ඩනය කතෝලික උගැන්වීම අනුව අනුමත නොකැරෙනු ඇතැයි ද කිතුනු පුවත් වාර්තා කරයි.

පැහැරගත් කතෝලික දරුවන් දහස් සංඛ්‍යාවක් ඉස්ලාම් දහමට

වසර කීපයකට ඉහතදී නැගෙනහිර තිමෝර් රාජ්‍යයේ පවුල් වලින් රැගෙන ගිය කතෝලික දූ දරුවන් දහස් සංඛ්‍යාවක් ඉන්දුනීසියාවේ බලෙන් රඳවාගෙන ඇත. ඔවුන් ඉස්ලාම් දහමට හරවා ඉස්ලාම් විද්‍යාලයන් හි අධ්‍යාපනයට යොමු කොට තිබේ.

ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඉන්දුනිසියාවේ බටහිර ජාවා ප්‍රදේශයේ පදිංචි කරවූහ. ඉන්දුනීසියාවේ කතෝලික අංශයන් මඟින් ලබාගත් තොරතුරු අනුව පසුගිය දා එම තතු හෙලි කරනු ලැබුවේ ශුද්ධාසන පුවත් විසිනි. කතෝලික මිනිස් ක්‍රියාකාරී සංගම් විසින් එම දරුවන් නැගෙනහිර තිමෝරයේ වෙසෙන අදාළ පවුල් වලට බාරදීම සඳහා යත්න දරනා නමුත් ඊට යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. වසර 1999 දී නැගෙනහිර තිමෝර් රාජ්‍යය ඉන්දුනීසියාවෙන් නිදහස ලබා ගැනීම සඳහා කළ අරගලයේදී බටහිර තිමෝරයට පලා ගිය අනාථ ජනතාවගේ දරුවන් 4000 ක් පමණ සංඛ්‍යාවකට නැගෙනහිර තිමෝරයේ වෙසෙන සිය දෙමාපියන් වෙත ආ පසු පැමිණීමේ වරම් මෙලෙසින් ඇහිරී තිබේ.

අනාථයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කොමසාරිස්ගේ උත්සාහයන් පවා ඉටු නොවී ඇති අතර එම අනාථ දරුවෝ මෙන්ම දෙමාපියෝ ද අතිශය අසරණ භාවයක ගිලී සිටිති. "පැහැරගනු ලැබූ මෙම අසරණ දරුවන්ගේ සිද්ධියෙන් හුවා දක්වනු ලබන්නේ රාජ්‍යයන් අතර දේශපාලන මතිමතාන්තර නිසා ජනතාව පෙළෙනා අයුරුයි. ලෝකයේ බලවතුන්ගේ ක්‍රියාදාමයන් නිසා විශේෂයෙන් අසරණ දරුවන් දුක් විඳිනා ආකාරය මෙම සිද්ධියෙන් ද මැනැවින් තහවුරු වෙනවා." මෙලෙස අවධාරණය කරනු ලැබුවේ සමයාන්තර කතිකාව පිළිබඳ කොමිසන් සභාවේ මහ ලේකම් ගරු බෙනි සුංසත්සෝ පියතුමාය.

ආගම අබිං වූ රුසියාවේ දරුවන්ට දැන් ආගම උගන්වති

මේ වසරේ සැප්තැම්බර් මාසයේ සිට රුසියාවේ පාසල් වල ආගම උගැන්වීම අනිවාර්ය වේ. වර්ෂ 2010 අප්‍රේල් මාසයේ සිට පළාත් 19 ක පිහිටා ඇති පාසල්වල සීමිත කාලයක් ඇතුළත ආගම් උගැන්වීම කරගෙන ගියේ එම ව්‍යායාමයේ සාර්ථක හෝ අසාර්ථකත්වය අගැයුමට ලක් කිරීම සඳහාය.

රුසියාවේ ඔතොඩොක්ස් සභා නායක තුමාගේ ආශිර්වාදය ඇතිව මුළු රට පුරා පාසල් වල ආගම උගැන්වීම අනිවාර්යය බවට පත් කිරීම දෙමාපියන්ගේ සතුටට හේතු කාරක වී ඇත. වසර 70 කට පෙර රුසියාවේ ආගම් අතුරෙන් තමන් කැමැති ආගමක් උගෙනීමේ අවස්ථා හැම දරුවෙකුටම ලැබෙනු ඇත. තමන්ගේ ආගම උගෙනීම තුළින් දරුවන් අධ්‍යාත්මිකත්වයක් අත්දකිනු ඇතැයි ද දෙමාපියෝ විශ්වාස කරති. රටපුරා පාසල් වල ආගම උගැන්වීම ආරම්භ වීමත් සමඟ අදාල ගුරුවරුන්ගේ හිඟයක් ඇති විය හැකි නිසා ආගම උගන්වන ගුරුවර ගුරුවරියන් නොපමාව පුහුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය විසින් නව සක්‍රීය වැඩසටහනක් ද දැනටමත් ආරම්භ කොට ඇත.

හිර බත් කන දරුවන්ට පිහිට

මියන්මාර රාජ්‍යයේ විවිධ පළාත්වල ළමා සිර ගෙවල් පිහිටා ඇත. මෙම සිර ගෙවල් වලට සිරබත් කන බොහෝ දරුවෝ දිළිඳුකමේ ශාපය හේතු කොට ගෙන වරදවලට යොමු වූවෝ වෙති. කුස ගිනි නිවා ගැනීම සඳහා දබර කරගැනීමේදී අන් අය මරා දැමූ දරුවෝද මේ අතර වෙති. තවද දුප්පත්කම හේතුකොට ගෙන දෙමාපියන් වෛශ්‍යා වෘත්තියට යොමු කරනු ලැබූ දූ දරුවෝ ද විවිධ අපරාධ වලට යොමු වී සිරබත් වළඳති.

මියන්මාරයේ සිරබත් කන දරුවන්ගේ ශෝකාකූල යථාර්ථය හෙළි දක්වනු ලැබුවේ එම අසරණ දරුවන්ගේ ජීවිත වලට ක්‍රිස්තු ආලෝකයක් ගෙන ඒමට කැපවී සිටින දේව ධර්මය හදාරන චාන් කවාං නම් ගැටවර තරුණයෙකි. ඔහුගේ පියා කතෝලිකයකු වූ අතර මව ප්‍රොතෙස්තන්ත ඇදැහිළි වන්තියකි. කුඩා කල සිට කතෝලිකයකු වශයෙන් හැදුණු වැඩුණු ඔහු වයස 17 දී දේව හඬට ඇහුම්කන් දී ගිහි දේව සේවය සඳහා කැපවී සිටී.

දැනට වසර දෙකකට ඉහතදී පාසල් යන කිතුනු දරු දැරියන් පිරිසක් ඒකරාශි කරගෙන අනාගත දරුවන්ට සේවය කිරීම සඳහා සංවිධානයක් බිහි කර ගත්තේය. ඔහු සිතුවාට වඩා දරු දැරියෝ ඊට එක්ව යම් පුහුණුවකින් පසුව බාල වයස්කාර දරුවන් රඳවා ඇති සිර ගෙවල් වලට ගොස් ඔවුන්ට ආහාර පානාදියෙන් පමණක් නොව දේවාදරයෙන් ද සත්කාර කරති. එමෙන්ම මියන්මාරයේ අසරණ දරුවන්ගේ දුක් පීඩාවන්ට ලොවැ හමුවේ ප්‍රකාශ කිරීම සඳහා මියන්මාරයේ පිහිටා ඇති ජාත්‍යන්තර දේව ධර්ම ආයතනයට ඇතුළත්ව ඇදැහිල්ලෙන් ශක්තිමත් වීමට උගැන්වීම ද කැරෙයි.

ලෝකයේ විවිධ රාජ්‍යයන්ගෙන් එම දේව ධර්ම ආයතනයට පැමිණ අධ්‍යාපනය ලබන සිසු දරු දැරියන් මඟින් මියන්මාරයේ පීඩිත දරුවන්ගේ යථාර්ථය ලොවට හෙළි කරමින් ඔවුන්ට නොතිත් ආධාර සත්කාර ලබාදීමේ ක්‍රියා මාර්ගයක් ද විවෘත කිරීම ඔහුගේ ජීවිත පරමාර්ථය බැව් ද චාන් කවාං විසින් කතෝලික පුවත් වලට වාර්තා කරයි. මියන්මාරයේ පවත්නා දරිද්‍රතාවය නිසා විවාහක පවුල් නිරන්තරයෙන් බිඳ වැටෙති. එමඟින් පීඩාවට පත්වන්නේ ද දරු දැරියන් ය. එබැවින් කිතුනු ඇදැහිල්ල ඔස්සේ පවුල් ශක්තිමත් කිරීමට සැමගේ දායකත්වය අවශ්‍ය බැව් ද ඔහු සනිටුහන් කරයි.

සංවාද මණ්ඩපය

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල අපට අකැප ද?

රටක වටිනාම වස්තුව එම රටේ දරුවන් ය. ඒ එම රටේ අනාගතය ඔවුන් අත දරා පවතින හෙයිනි. රටේ බුද්ධිමත්ම දරු පිරිස විශ්ව විද්‍යාලවලට ඇතුලු වී විවිධ ක්ෂේත්‍රයන්හි සුවිශේෂ දැනුමක් ලබා උපාධි ලබාගෙන රටට සේවය කිරීම සඳහා සමාජයට පිවිසෙති. විවිධ ක්ෂේත්‍ර සඳහා වෙන් වෙන් විශ්ව විද්‍යාල රජය විසින් නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, ගණකාධිකරණය, කළමනාකරණය හා කෘෂිකර්ම විද්‍යාව පිළිබඳව උපාධි ලබා විශ්ව විද්‍යාල සිසුහු සමාජයට පිවිසෙති. සමහර උපාධි ලබාගත් පසු රැකියාවක් ලබා ගැනීම සඳහා තමුන් යම් ප්‍රයත්නයක් දැරිය යුතුය. එහෙත් වෛද්‍ය උපාධිය ලබාගත් සියලුම සිසුන්ට රජයේ රෝහල්වල වෛද්‍යවරුන් වශයෙන් පත්වීම් ලබා දෙනු ලැබේ. උසස් පෙළ විභාගයේ දී ලබාගත් ලකුණු මට්ටම් අනුව සමහර සිසුන් දන්ත වෛද්‍යවරුන් සහ පශු වෛද්‍යවරුන් වශයෙන් වෛද්‍ය විද්‍යාල පුහුණුවට ඇතුලු කරනු ලැබේ. මෙම සිසුනට ද රැකියා ලබා ගැනීමේ දුෂ්කරතාවයක් නැත.

කොයිතරාතිරමේ බලවතෙක් වූවත්, පොහොසතෙක් වූවත්, අසනීපයක් වූ විට යා යුත්තේ වෛද්‍යවරයකු වෙතය. තම ජීවිතේ අවසාන මොහොතේ දී පවා පිහිටට සිටිනුයේ වෛද්‍යවරයා ය. ඒ නිසා සමාජයේ උසස්ම ගෞරවය හිමිවනුයේ වෛද්‍යවරයාට ය. මෙවර පස්වෙනි පංතියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලංකාවෙන්ම පළමු තැන ලබා ගත් සිසුන් දෙදෙනාගෙන් අනාගතයේ කවුරු වීමට සතුටුදැයි මාධ්‍ය විමසූ විට ඔවුන් දෙදෙනා ම පැවැසුවේ තමන් වෛද්‍යවරුන් වීමට සතුටු බවය. මෙම වෘත්තියේ ගරුත්වය හා පිළිගැනීම එයින් ම පැහැදිලි වේ. අප රටට කෙදිනකවත් වෛද්‍යවරුන් වැඩි වී නැත. සැමදාම වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතී. ඒ රටේ ජනගහණය අනුව රජයෙන්ම අනුමත ගණනට වෛද්‍යවරුන් පුහුණු කිරීමට අපහසු හෙයිනි. ගරු සෞඛ්‍ය ඇමැති තුමන් පවසා ඇති ලෙස පිටරට විශේෂ පුහුණුවලට ගිය වෛද්‍යවරුන් සමහරක් ආ පසු පැමිණ නැත. ඒ අපේ රටේ මෙන් හතර පස් ගුණයක පමණ වැටුපකට ඒ ඒ රටවල සේවය කළ හැකි හෙයිනි. එසේම, අපට අවශ්‍ය තරම් වෛද්‍යවරුන් පුහුණු කිරීම සඳහා අතිරේක වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීමට රජයට ප්‍රතිපාදන නොමැත. ඒ, එදිනෙදා ජීවිතය ගෙන යාමට පොදු ජනතාවට අවශ්‍ය හදිසි සේවාවන් සඳහා ප්‍රමුඛත්වය දීමට අවශ්‍ය නිසාය.

මේ තත්ත්වය යටතේ රජය පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමට පියවර ගෙන තිබේ. එය මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ය. යහමින් මිල මුදල් ඇති අය තම දරුවන් ඕස්ට්‍රේලියාව, එංගලන්තය වැනි රටවලට පෞද්ගලික වියදමින් යවා වෛද්‍ය පුහුණුව ලබා දේ. ඒ සඳහා එක් අයෙකුට රු. කෝටි පහමාරක් පමණ වැයවෙතැයි ගණන් බලා තිබේ. එවැනි වියදමක් දැරිය හැකි අය ද අප රටේ සිටී. සැම වසරකම ඇතැම් ගිවිසුම් අනුව චීනයෙන් සහ රුසියාවෙන් ද අප රටේ සිසුන් සුළු පිරිසකට වෛද්‍ය ශිෂ්‍යත්ව ලැබේ. එහෙත් එය කිසිසේත් අප රටට ප්‍රමාණවත් නොවේ. එම නිසා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල අප රටට ඉතා ඵලදායකය. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ එක් සිසුවෙක් පුහුණු කිරීම සඳහා රුපියල් ලක්ෂ හැටපහක් පමණ වැය වෙතැයි සැළකේ. එම වියදම දරා අප රටේ දී ම තම දරුවා වෛද්‍යවරයකු කරගැනීමට හැකි දෙමාපියන් පමණටත් වඩා ඇත. එය ජනතාවගේ භාග්‍යයකි. රජයේ වෛද්‍ය විද්‍යාලයේ පුහුණුව ලබන එක් සිසුවකු වෙනුවෙන් ලක්ෂ දහයක් පමණ රජයට වැයවෙන බව ගණන් බලා තිබේ. එය ජනතාවගේ මුදල් ය.

මෙම පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීම ගැන විශ්ව විද්‍යාල සිසුන් බලවත් විරෝධය පල කර සිටී. එසේම, රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය ද, ලංකා වෛද්‍ය සභාව ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ද නොයෙකුත් තර්ක ඉදිරිපත් කර පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විවෘත කිරීමට විරුද්ධව කරුණු දක්වා ඇත. මේ මඟින් නිදහස් අධ්‍යාපනයට මරු පහරක් වදින බව විශ්ව විද්‍යාල සිසුන්ගේ තර්කය වී ඇත. රජයේ වෛද්‍ය විද්‍යාලවලට ඇතුලු කරගන්නා එකදු ශිෂ්‍යයකුවත් අඩු නොකරයි නම් ද, එසේම එම වෛද්‍ය විද්‍යාලවල පුහුණුව ලබා පිටවෙන එකද වෛද්‍යවරයකුටවත් පත්වීම ලැබීමේ ගැටළුවක් ඇති නොවේ නම් ද, නිදහස් අධ්‍යාපනයට මේ මඟින් පහරක් වදී යයි යන තර්කය පිළිගත නොහැකිය. එය හුදෙක් ආත්මාර්ථකාමී න්‍යායකි. පුහු තර්කයකි. තවද, අද වෛද්‍යවරුන් වශයෙන් සේවය කරන පිරිස ද හුදු මහජනතාවගේ වියදමෙන් ම අධ්‍යාපනය ලබා එම තත්ත්වයට ආ අය බව අමතක නොකළ යුතුය.

සාමාන්‍ය ජනයා තෙරපීගෙන බස්වල යනවිට යහමින් මිල මුදල් ඇති අය සුඛෝපභෝගී සැප වාහනවල ගමන් යති. ඇතැම් අය නිවාස නොමැතිව දුක් විඳිද්දී අන් අය ඉතා සැප පහසු මන්දිරවල ජීවත් වෙති. සමහරෙක් රෑට ආහාරයක් නොමැතිව දුක් විඳිද්දී සැප හෝටල්වල දහස් ගණනක් රසමසවුලෙන් යුත් ආහාර භුක්ති විඳිති. ඇතැම් අය රාත්‍රී සමාජ ශාලාවලට ගොස් සූදු ක්‍රීඩාවේ යෙදී ලක්ෂ ගණන් මුදල් පැරදී ආපසු එති. රජයේ පාසල් කොපමණ තිබුණත් පෞද්ගලික පාසල් කොපමණ තිබේ ද? ඒවා ද සිසුන්ගෙන් පිරී තිබේ. ඒ හැර, ජාත්‍යන්තර පාසල් ද විශාල මුදලක් අය කර පවත්වාගෙන යනු ලැබේ. ඒවා ද සිසුන්ගෙන් පිරී ඇත. සමාජය පවතින තාක් කල් මෙම තත්ත්වය මෙසේ ය. ඒවාට කිසිවෙකුට විරුද්ධ විය නොහැකිය. විරුද්ධ වීමෙන් පලක් ද නැත.

ඒ හැර පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විවෘත කිරීමෙන් අපේ රටේ වෛද්‍යවරුන්ගේ අඩුව පුරවා ගත හැකිය. දරුවන් පිටරට යවා වෛද්‍ය පුහුණුව ලබා ගැනීම සඳහා දෙමාපියන් රට යවන මුදල මෙහිම රඳවා ගත හැකිය. පිටරට සිසුන් අනිවාර්යයෙන්ම අපේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට විශාල වශයෙන් එනු ඇත. ආර්ථික අහේනියට පත්වී ඇති අප රටේ ආර්ථිකයට ඒ මගින් ලැබෙන සහනය ඉමහත් ය. ඒ හැර ඒ මඟින් අප රටට ලැබෙන කීර්තිය ද, ප්‍රසිද්ධිය ද බෙහෙවින් ඵලදායක ය.

මේ අනුව, පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විවෘත කිරීම මඟින් අප රටට ලැබෙන ප්‍රයෝජනය අති මහත් ය. එම නිසා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල තවත් විවෘත කිරීමට උසස් අධ්‍යාපන ඇමැති එස්. බී. දිසානායක මහතා දරන ප්‍රයත්නය අතිශයින් පැසසුම් කටයුතුය. එය ජනතාවගේ පොදු ශුභ සිද්ධියට ඉමහත් සේ ඉවහල් වනු බව ඉතා පැහැදිලිය.

✍ පමුණුගම
ඩී. ඇන්ටනි වික්‍රමසිංහ

සෙනෙට් මන්ත්‍රී මංඩලය යළි දොරට වඩී ද?

2012. 02. 19 ලිපිය හා සබැඳේ.

ඩබ්. කේ. ජිනදාස, ඊ. පී. වික්‍රමආරච්චි වැනි ස්වදේශීය වෛද්‍යවරු, ඒ. ඩී. ජයසේකර වැනි ගුරුවරු ද, ඩොරින් ද සූසා වැනි බර්ගර් ජාතිකයන් ද, කේ. ආදමලි වැනි මැලේ බෝරා ජාතිකයන් ද, එස්. නඩේසන්, සර්කන් අයිමා වෛද්‍යනාදන් වැනි දමිළ ජාතිකයින් ද, සිරිල් ද සොයිසා, වයි. ආර්. පියසේන වැනි ව්‍යාපාරිකයන් ද, ස්ටැන්ලි කල්පගේ වැනි මහාචාර්යවරු ද, රෙජී පෙරේරා වැනි කලාකරුවන් ද. ඩී. ජී. විලියම් වැනි වෘත්තීය සමිති නායකයන් ද, එස්. ඩී. එස්. සෝමරත්න වැනි චිත්‍රපට නිෂ්පාදකයන් ද අශෝක කරුණාරත්න වැන්නන් කුලගෝත්‍ර නියෝජනය කරමින් ද සෙනෙට් මංතිධුර හෙබවූ බව නොරහසකි. එහෙත් මේ හැම පත්වීමකට ම දේශපාලන හස්තයන් හොල්මන් කිරීම තත් අපේක්ෂාවල පාරිශුද්ධතාවය කිළිටි කිරීමක් විය.

බොහෝ විට පාර්ලිමේන්තු මැතිවරණ වලින් අතුරු මැතිවරණ වලින් පරාජිත වූවන් පරාජය වී දින දෙක තුන ගතවීමටත් කලින් සෙනෙට් මංත්‍රීවරුන් ලෙස පත් කර තිබීම එහි ගෞරවයට කැළලක් වූ බව නොරහසකි. එවැනි පරාජිත තත්ත්වයට පත් තම හෙන්චයියලාගේ මනදොල පිනවීම සඳහා ක්‍රියා කිරීම තුළින් සෙනෙට් මංත්‍රී මංඩල අපේක්ෂා සුන්වී යාම නොවැළැක්විය හැක්කකි. දේශපාලනික බැඳීම් වලින් මිදී ක්‍රියා කිරීම සඳහා අධිකරණ ඇමැති ධුරය සෙනෙට් මංඩලයට ලබා දීම අගය කළ යුත්තකි. ගතවූ අවුරුදු 25 තුළ ශ්‍රීමත් ලලිත රාජපක්ෂ, ඊ. බී. වික්‍රමනායක , එම්. ඩබ්. එච්. ද සිල්වා, පෙයාර්ලි විජේමාන්න, සෑම් පී. ඩී ප්‍රනාන්දු, වැලන්ටයින් ජයවික්‍රම වැනි සෙනෙඩ් මංත්‍රීවරුන් අධිකරණ ඇමැති ධුර දැරීම පැසසිය යුත්තකි. නියෝජ්‍ය මුදල් ඇමැති ධුරය සෙනෙට් සභාවට පැවරීම මතකයට ලක් වන්නේ 1947 නියෝජ්‍ය මුදල් ඇමැති ධුරය දැරූ යූ. බී. වන්නිනායක මහතා 1965 පාර්ලිමේන්තුවේ මුදල් ඇමැති ධුරය හෙබවීය. එංගලන්තයේ සාම් මංත්‍රී මංඩලයට බොහෝ දුරට සමාන කළ හැකි මෙම ප්‍රජාතන්ත්‍රවාදි පාර්ලිමේන්තු ක්‍රමය වඩාත් ශක්තිමත් කරන ආයතනයක් ලෙස දිස්වූයේ සෙනෙට් මංත්‍රීවරුන් විසින් තර්ක විතර්ක මැද විදහාපාන ලද විශේෂ වූ කුසලතා හේතුවෙනි.

දැන් අපි අවුරුදු 25 ක් පැරණි සෙනෙට් සභාව අහෝසි කිරීමට හේතු කිමදැයි සොයා බලමු. බැලූ බැල්මට මෙය වඩාත් ප්‍රජාතන්ත්‍ර ක්‍රමයක් ලෙස පෙනුනද ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු සමයේ බොහෝ විට සිදුවූයේ දේශපාලන මත වාදයන් අනුව හදිසි අණ පණත් පවා බොහෝ විට ප්‍රමාද කිරීමයි. තතු දත් ආරංචි වලට අනුව 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් සෙනෙට් සභාව බැහැර කිරීමට හේතුව එය බවයි. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එහි සාධාරණත්වයක් පෙනුනද සෙනෙට් මංත්‍රී මංඩලයේ බහුතරය හෘදය සාක්ෂියට එකඟව ක්‍රියා කිරීම සිදුවුවහොත් ඇතැම් විට උක්ත සිදුවීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සිදුවිය යුත්තකැයි නිගමනය කිරීම ද සාධාරණය. සිරිමාවෝ බණ්ඩාරණායක මහත්මිය පාර්ලිමේන්තු ආසනයක තරග නොකර උත්තර මංත්‍රී මංඩලයේ මංත්‍රී ධුරයක් ලබා පාර්ලිමේන්තුවේ බහුතරයේ කැමැත්ත ඇතිව අගමැති ධුරය හෙබවීම මෙහිදී මතකයට ලක්වන අතර නැවත සෙනෙට් සභාව පිහිටුවීම සඳහා සාකච්ඡා කරන මොහොතක විවිධ අයුරින් උපකල්පනය කිරීමේ පැතිකඩ රැසක් ඇති බව ද සඳහන් කළ යුතුය.

අවසාන වශයෙන් ජනවාර්ගික ප්‍රශ්නයකට පිළියමක් ලෙස සෙනෙට් සභාව යළි පිහිටුවන්නේ නම් දේශපාලන වාසි නොතකා ඉන් පරිබාහිරව අවංකව සුළු ජාතික ප්‍රශ්නයට තිරසාර විසඳුම් අඩංගු ක්‍රියාදාමයන් එහි අන්තර්ගත යුතු වෙයි. තිස් වසරක යුද්ධය නිමා වූවාසේ ඔඩු දුවන ජනවාර්ගික ප්‍රශ්නයට අන්තවාදයෙන් බැහැරව විවෘත මනසකින් යුතුව ක්‍රියා කිරීමේ වේදිකාවකට ඉඩ සැලසී ඇති හෙයින් පැරැණි අසාර්ථක භාවයන්ට නියමිත පිළිතුරු සපයන ඊට ගම්‍ය වන ප්‍රතිපත්ති රාමුවක් තුළ රැහැන්ගත වීමට පසුබිමට අවතීර්ණ විය යුතු කාලය එළැඹ ඇත්තේය. කලින් පැවැති සෙනෙට් සභාවේ ව්‍යුහයට වඩා සෘජුවම සුළු ජාතික නියෝජිත බහුතරයක් පත්වීමට ඉඩ කඩ සැලසීමත් ඔවුනගේ අනන්‍යතාවයට මදි පුංචිකමක් නොවීමට නීති ප්‍රතිපාදන ව්‍යවස්ථාවෙන්ම සලසාදීමත් අනිවාර්යය විය යුත්තක් වන්නේය. එසේම මේ සඳහා ඉන්දියාවේ මැදිහත්වීම පිලිබඳ වැරදි අවබෝධයක් ඇති කර නොගැනීමත්. ඊට උඩ ගෙඩි දෙන්නන් පිළිබඳව විමසිල්ලෙන් සිටීමත් අනිවාර්යයෙන් විය යුත්තක් වන්නේ ය.

✍ **තියබෝල්ඩ් සමරතුංග**

රදගුරු සමුළු නිවේදනයෙන් කියන දේ ගැඹුරින් විමසා බලමු

තෙල් මිල ඉහළ නැංවීමට එරෙහිව හලාවත පැවැති උද්ඝෝෂණයක දී ඩබ්ලිව්. ඇන්තනි ප්‍රනාන්දු නමැති තරුණ ධීවරයාගේ මරණය සම්බන්ධයෙන් බලවත් කණගාටුව ප්‍රකාශ කරන බව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළ අතර මිනිස් ජීවිතයක වටිනාකම පිළිබඳව කිසිදු තැකීමකින් තොරව සිදුකරන ලද මෙවැනි මිලේච්ඡ ක්‍රියා තවදුරටත් සිදු නොවීමට වග බලා ගන්නා ලෙස ද එම නිවේදනයෙන් ඉල්ලා සිටියේය.

මරණයේ වේදනාව ජීවත්වන්නවුන්ට බව ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දු ගේ මරණයෙන් යළිත් සනාථ වී තිබේ. ඒ වියෝග සංවේගය ඔහුගේ බිරිඳට ය. අසරණ දරු පැටියන් දෙදෙනාට ය. ඥාතීන්ට ය. පවුලට මහ මෙරක ශක්තියක් වූ ඔහුගේ වියෝවෙන් ඒ පවුලට අත්වූ ඉරණම වචනයට නැගිය නොහැකි තරම් ය. ඒ මරණය වළක්වා ගත හැකිවූයේ නම් කෙතරම් අගනේ දැයි තේරුම් ගත හැකිවන්නේ දැන් ය.

එළැඹ ඇත්තේ එළවාගත් සිහි බුද්ධියෙන් යුතුව සිදුවීම් විමර්ශනයට ලක් කළ යුතු මොහොත ය. ඩබ්ලිව්. ඇන්තනී ප්‍රනාන්දුට අත්වූයේ ස්වාභාවික මරණයක් නොවේ. උද්ඝෝෂණයක් මැඩලීම සඳහා පොලීසිය ගත් ප්‍රයත්නයක දී ඔහුට වෙඩි වැදුණේය. ඒ වෙඩි පහරින් ඔහු මිය ගියේ ය. මෙබඳු උද්ඝෝෂණ වලට එල්ල වූ පොලිස් වෙඩි පාරවල්වලින් මියගිය පළමු පුරවැසියා ඔහු නොවේ. 53 හර්තාලයේ දී ද මෙබඳුම සිදුවීම් වාර්තා විය. කන්දසාමි හා සෝමපාල යන කම්කරුවෝ ද පොලිස් වෙඩි ප්‍රහාරයන්ට ලක්ව මිය ගියේය. 1977 දී පේරාදෙණිය විශ්ව විද්‍යාල බිමේ ඇවිලී ගිය ශිෂ්‍ය උද්ඝෝෂණයට තැබූ වෙඩි පහරින් වීරසූරිය ශිෂ්‍යයා මිය ගියේය. ඒ බිමේ පොලිස් මුර පොළක් ඉදිකිරීමට විරෝධය පෑ ශිෂ්‍යයන්ට තැබූ වෙඩි පහරකින් පද්මසිරි අබේසේකර ශිෂ්‍යයා මිය ගියේය. එයට විරෝධය පෑ කොළඹ සරසවි සිසුන්ට එල්ල වූ වෙඩි පහරින් රෝහණ රත්නායක ශිෂ්‍යයා මිය ගියේය. 87 මැයි දින තහනමට එරෙහි වූ සිසුන් අතර සිටි කිත්සිරි මෙවන් රණවක හා ලෙස්ලි ආනන්ද මිය ගියහ. පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පතට එරෙහිව ඇවිළ ගිය කම්කරු විරෝධතාවට එල්ලවූ පොලිස් පහරින් රොෂේන් චානක මිය ගියේය. මෙදා ඩබ්ලිව්. ඇන්තනි ප්‍රනාන්දු ය. ඒ අනුව උද්ඝෝෂණවල දී මිය ගිය පළමු වැන්නා ඇන්තනී ප්‍රනාන්දු නොවේ. පෙර සඳහන් කළ උද්ඝෝෂකයන් මෙන්ම නම් නොදන්නා බොහෝ දෙනෙක් සටන් වල දී මරුමුවට පත්වී ඇත. පළමුවැන්නා ඇන්තනී ප්‍රනාන්දු නොවුණද ඔහු අන්තිමයා බවට පත්කැර ගත යුතුව තිබේ. මළ කඳන් බදා වැළපෙන අඳුරු ශාපලත් යුගය අහවර කළ යුතුව තිබේ. ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ නිවේදනයෙන් මෙන්ම මෙරට ජාතික අධ්‍යාත්මයෙන් ඉල්ලා සිටින්නේ ඒ ගැඹුරු ඉල්ලීමය.

මිනිසුන් මිය යන හෝ මරා දැමෙන සටනක් කුමට ද යන්න 21 වැනි සියවසේ මිනිස් සමාජය ඉදිරිපිට නොනැගිය යුතු තරමේ ප්‍රශ්නයකි. මන්දයත් 21 වැනි සියවසේ මිනිසා සෑම අතින්ම පෙර සමාජයන්ට වඩා බුද්ධිමත් විය යුතු හෙයිනි. සාමූහික විචාර බුද්ධියෙන් උස් මහත් වී සිටිය යුතු හෙයිනි. ඒ අනුව පැරැණි සටන් මෙන්ම සටන් මැඩලන පැරැණි ක්‍රම ද අතහැර දැමිය යුතුය. බුද්ධිමය සංවාදයෙන් ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට මේ සමාජයට විශේෂ බාධාවක් තිබිය නොහැකිය.

උද්ඝෝෂණවලට වෙඩි තබන ලෙස පොලිසියට උපදෙස් දී නැතැයි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා මාධ්‍යයට කියා තිබිණි. උද්ඝෝෂකයන් ද තමන්ගේ දරුවන් මෙන් රැකබලා ගන්නා යුගයක් නිර්මාණය කර ගත යුතුය. මන්දයත් සෑම උද්ඝෝෂණයක්ම අසාධාරණ හේතු මත පදනම්ව නිර්මාණය නොවන හෙයිනි. ඉන්ධන ප්‍රශ්නය වුවද සහේතුකය. තමන්ට සාධාරණය ඉටුකර ගැනීම සඳහා පෙරට ඒමට ජනයාට අයිතියක් තිබේ. වගකිව යුත්තන් කළ යුතුව තිබෙන්නේ මහජනයා පාරට බස්සන තීන්දු තීරණ ගැනීමෙන් වැළකී සිටීමය. එය දුෂ්කර හෝ අසීරුවෙන් කළ නොහැකි වූ දෙයක් නොවේ. ඒ සම්බන්ධයෙන් කෙරෙන ප්‍රමාණවත් හොඳම සාකච්ඡාවකින් ඕනෑම ප්‍රශ්නයක් නිරාකරණය කර ගත හැකිය. එය නොහැකි නම් අප 21 වැනි සියවසේ මිනිසුන් බවට පත් නොවෙමු.

උද්ඝෝෂකයන් සතුවද විශේෂ වගකීමක් තිබේ. සාධාරණ ඉල්ලීම් වෙනුවෙන් අසාධාරණ හා අයුක්ති සහගත ක්‍රියාමාර්ග වෙත අවතීර්ණ වීමේ අයිතියක් ඔවුනට නැත. හලාවත උද්ඝෝෂණයේ දී ද මේ අපහසුව වෙසෙසින් කැපී පෙනුණේය. පොලිස් යතුරුපැදියක් ගිනිබත් කෙරිණි. පොලිසියට ගල් මුල් ප්‍රහාරයක් එල්ල වූ බව ද වාර්තා විය. කටුනායක උද්ඝෝෂණයේ දී ද මෙම දුර්ගුණය යහමින් කැපී පෙනුණි. උද්ඝෝෂකයන් අතර සිටින ප්‍රචණ්ඩකාරීන්ට තමන් අහිමත දිශාවට සටන මෙහෙයවීමේ අවස්ථාව හිමිකර නොදිය යුතුය. එබඳු බොරු වළවල් සේම මර උගුල් කල් ඇතිව හඳුනා ගැනීමේ ඉව හා ශක්තිය උද්ඝෝෂකයන්ට තිබිය යුතුය. නොඑසේ නම් සිදුවිය හැක්කේ ඉල්ලීම් දිනා ගැනීම කෙසේ වෙතත් මිල කළ නොහැකි ජීවිත වලින් වන්දි ගෙවීමය. මේ විෂම චක්‍රයෙන් සමාජය අත්මිදිය යුතුය. ඒ සඳහා පාලකයා මෙන්ම පාලිතයා ද සිය ප්‍රඥාව අවශ්‍ය මට්ටමට උස් මහත් කර ගත යුතුය.

(2012.02.24 ලංකාදීප කතුවැකිය)

වෙහෙසෙන මිනිස්සු

අයුක්තියට, අසාධාරණයට එරෙහිව ධීවර ජනතාව සමඟ අත්වැල් බැඳගත් පියතුමන්ලා

රජය මඟින් ඉන්ධන මිළ ඉහළ දැමීමත් සමඟ රට පුරා ධීවර ජනතාව මහත් අසීරුතාවයකට පත්ව වීදි බැස විවිධ අන්දමේ උද්ඝෝෂණ සඳහා පසුගිය සති දෙක පුරාවට එළඹ සිටිනු දක්නා ලදි. විශේෂයෙන් මෙහිදි වඩාත් කැපී පෙණුනේ හලාවත පැවති උද්ඝෝෂණයයි. කුමන ආකාරයකින් හෝ සිදුවුණු ඒ අවාසනාවන්ත සිදුවීම නිසා හලාවත ධීවර උද්ඝෝෂණය මෙලෙස රටපුරා මෙන්ම ලොව පුරාම වැඩිම අවධානයක් දිනාගත් පුවතක් විය.

කෙසේ වුවද එම උද්ඝෝෂණයේ දී මියගිය ඇන්තනි ප්‍රනාන්දු මහතාගේ දේහය මිහිදන් කිරීමෙන් පසුව ඒ සියල්ල අතීතයට එක්වෙමින් පැවැතිය ද මෙම සිද්ධීන් පිටුපස කතෝලික සභාව සහ ගරු පියතුමන් සිටින බවට ඇතැම් මාධ්‍ය ඔස්සේ ද, රජයේ පාර්ශ්වයෙන් ද චෝදනා වක්‍රව එල්ලවෙමින් පවතී. මේ දිනවල පුවත්පත්, රූපවාහිනී ප්‍රවෘත්ති හරහා ඇතැමුන් කරන ප්‍රකාශවලින් ඒ බව කදිමට ගම්‍යවේ. විශේෂයෙන් මොවුන 'කරනා ඇතැම් විග්‍රහයන් තුළින් දකුණේ ධීවර ජනතාව ඉන්ධන මිළ අර්බුදයේ දී නිසොල්මන්ව සිටිද්දි හලාවත, මීගමුව වැනි බහුතර කතෝලික ධීවර ජනතාවක් වෙසෙන ප්‍රදේශයන්හි ජනතාව පමණක් මේ ප්‍රශ්නය මත රජයට එරෙහිව වීදි බැසීම මාතෘකාවක් ලෙස යොදා ගැනීම කැපී පෙනෙන කරුණකි.

මෙහිදී හලාවත, මීගමුව වැනි ප්‍රදේශවල ධීවර ජනතාවට දැනුණ ඉන්ධන මිළ ඉහළ යෑම දකුණේ ජනතාවට නොදැනුනාද එසේත් නැත්නම් ඔවුන්ට එය දරා ගත හැකිද යන්න වෙනත් කරුණකි. එය විග්‍රහ කළ යුත්තේ ඒ පිළිබඳ සැබෑ තතු සොයා බැලීමෙනි.

එසේ වුවද හලාවත, මීගමුව ධීවර උද්ඝෝෂණයන්ට කතෝලික සභාව හෝ ගරු පියතුමන් ගෑවීම තරයේම ප්‍රතික්ෂේප කළ යුතු තත්ත්වයකි. සැබැවින්ම සිදුවූයේ රජයට එරෙහිව නැගුණු මහා උද්ඝෝෂණ රැල්ලට හමා යන්නට ඉඩ නොදී ඒවා සමනය කරන්නට සුවිශේෂි මෙහෙයක් ගරු පියතුමන් සහ කතෝලික සභාව මඟින් සිදුවීමය. මෙහිදි හලාවත වැල්ල පල්ලිය මිසම් සේවක ගරු ක්ලෝඩ් හයසින්ත් පියතුමා අතින් සිදු වූ මෙහෙය අති සුවිශේෂිය. මේ බවට වන පැහැදිලි සාක්ෂි ජනමාධ්‍ය තුළ පළ වූ ඡායාරූප වලින් ලබාගත හැකිය. තත්ත්වය මෙසේ බැවින් ඇතැම් ඊනියා කුහක මාධ්‍ය තුළින් හා වග කිව යුතු අංශවලින් කෙරෙන අභූත චෝදනා පිළිකුලෙන් යුක්තව හෙළා දැකිය යුතුව ඇත. අති උතුම් කාදිනල් හිමිපාණන්ද, හලාවත රදගුරු හිමිපාණන්ද ප්‍රකාශ කළ පරිදි තමන් වහන්සේ ඉන්ධන මිළ ප්‍රශ්නයේදී ධීවරයන් සමඟ සිටිනා බව ප්‍රකාශ කිරීම සැබැවින්ම ඔවුන් සනසාලූ, ජේසු ස්වාමිදරුවන් ප්‍රකාශ කළ ප්‍රේමයේ වදන් යළි යළි ප්‍රකාශ කිරීමක් වැන්න. තමන්ගේ අනුගාමිකයන්ගේ ආගමික, සමාජීය, ආර්ථික ප්‍රශ්න හමුවේ දෙවිඳුන්ට සාක්ෂි දැරීම සැබෑ ක්‍රිස්තු අනුගාමිකයන් වශයෙන් සබා ශ්‍රේෂ්ඨයන්ට පියතුමන්ලාට සභාවට අකැප වන්නේ කුමන තත්ත්වයක් යටතේ ද යන්න එවැනි චෝදනා නගන්නන් හමුවේ ප්‍රශ්න කළ යුතුව ඇත.

ප්‍රියන්ත පීටර්ස්
වෙන්නප්පුව

ධීවර අරගලයේදී සභා මඟපෙන්වීම පල දැරුවාද ?

භූමිතෙල් සහ ඩීසල් මිළ ඉහළ යෑම විශේෂයෙන් අපේ රටේ ධීවරයන්ටත් බලපාන්නේ යැයි කීම බොරුවක් නොවේ. මාළු සහ භූමිතෙල් අතර කිසිදු සම්බන්ධයක් නැතිවුවද ධීවරයන් සහ තෙල් මිල අතරේ ඇත්තේ කිට්ටු සම්බන්ධයකි. මෙවැනි බාහිර හේතු ධීවර කර්මාන්තය කෙරේ බලපාන්නට වූයේ දශක කීපයකට පෙර මෙරට ධීවර කර්මාන්තයද නවීකරණය වීමට භාජනය වූ නිසාය. විශේෂයෙන් යාන්ත්‍රික ධීවර යාත්‍රා භාවිතයට පැමිණීම නිසාය. සුළං, දියවැල්, වඩදිය, බාදිය හා සමීපව කෙරුණ පැරණි ධීවර යාත්‍රා කරණය නවසිය පණස් ගණන් වලදී යාන්ත්‍රීකරණය වීම ආරම්භ විය. එයින් සිදුවූයේ මාළු මිල කෙරෙහි ප්‍රාග්ධනය හා ශ්‍රම දායකත්වයට අමතරව ඉන්ධන ගාස්තුවකුත් එකතු වීමය. තෙල් මිල අස්ථාවර සාධකයක් විය. ඒ නිසා තෙල් විසින් මාළු මිල හැසිරවීම ආරම්භ විය.

අපට තෙල් ලැබුණේ ඉරානය ප්‍රමුඛ මැද පෙරදිග රටවලිනි. න්‍යෂ්ටික බල පරිහරණය පිළිබඳව ඉරානය හා ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවල් අතර ආරාවුලක් පැන නැගුනි. ඉරානය ඇමෙරිකාවට අවනත නුවුයෙන් ඉරානයේ තෙල් අලෙවියට බාධා ඇතිකරන 'සම්බාධක' පණවන ලදී. න්‍යෂ්ටික බලය නිපද වූයේ ඉරානයය. ඉරානයට සම්බාධක පැනවුයේ ඇමෙරිකාවය. එහෙත් තෙල් පාදක කොටගෙන ජන අරගල හටගත්තේ ශ්‍රී ලංකාවේ මුහුදු වෙරලේය. අරගල කළ යුත්තේ එක්කෝ ඇමෙරිකාවට එරෙහිවය නැත්නම් ඉරානයට එරෙහිවය. එහෙත් ඒවා පසෙක තිබියදී අප අරගල කරන්නේ ලංකාවේ රජයට එරෙහිවය! එය හරියට 'පහත් තැනින් යයි ගලා ජලේ' යි කීවා වගේය.

තෙල් මිල ඉහළ යාම බලපාන්නේ ලංකාවේ ධීවරයින්ට පමණක් නොවේ. වෙළෙඳ පොළේ පතෝල වෙළෙන්දාටත් එම ආනිසංශ පොදුය. එහෙත් තෙල් ගණන් යන මිළට සාපේක්ෂව පතෝල මිලද ගලපා ගැනීමෙන් යථා තත්ත්වයට මුහුණ දීම ඔහුට මහා කජ්ජක් නොවේ. එසේ නම් ධීවරයන්ටත් එසේ කළ නොහැකිද? මීට පෙර අවස්ථාවලදී ඔවුහු එසේ නොකළෝද? සුපුරුදු ලෙස ක්‍රියා නොකොට මෙවර මේ අමුතු කැක්කුමකින් 'ජන අරගලයකට' පිවිසුනේ ඇයි? මාළු ගැන අනුකම්පාවෙන්ද? නැතිනම් මාළු කන අපට ඇති ආදරේටද? එසේත් නැත්නම් ලඟ එන මානුෂික අයිතිවාසිකම් චෝදනා සම්මේලනයකට දර දිය සැපයීමේ චේතනාවෙන් ද?

කෙසේ වෙතත් තෙල් අර්බුදය ගැන හරි හැටි නොදැන තමන් භාරයේ සිටින මේ කිතුනු බැටළුවන් ගැන සභා එඬේරුන් නිකම් සිටියේ නැත. ඔවුහු රාජ්‍ය බලධාරීන් හා වහ වහා කථාකොට වේලාව පිරිමහින සුදුසුම සහනදායකත්වයකට පැමුණුනහ. සභා ශ්‍රේෂ්ඨයන්ගේ සහතිකය බැටළුවන්ගේ සන්සුන් වීමට හොඳටම ප්‍රමාණවත් විය. (මීට පෙර අපි එය අත්දැක ඇත්තෙමු. කතෝලිකයින්ට ඕනෑම ප්‍රශ්නයකදී ශුද්ධොත්තම පාප් වහන්සේ ද - ඒ වෙනුවෙන් පෙනී සිටින මීසමේ පියතුමාට ද වැඩි කෙනෙක් නැත.) එහෙත් සිදුවූයේ කුමක්ද? සභා ශ්‍රේෂ්ඨයන්ට එහා සිටියකු විසින් යහපත් එඬේරාගේ සැරයටිය" පැහැර ගැනීමය. කවුරුන් හෝ ඒ සොරදෙටුවෝ අපේ අහිංසක බැටළුවන් 'ඊනියා ජන අරගලයක' ඛේදාන්තය වෙත මෙහෙයවූහ. මේ අදිසි හස්තයන් විසින් - සමතයකට පත් කිරීමට කතෝලික සබා ශ්‍රේෂ්ඨයින් විසින් දරණ ලද සියළු උත්සාහයන් නිෂ්ප්‍රභා කරමින් එම උද්‍යෝගය තමන්ට අවශ්‍ය වූ තැනට ගෙන ගියහ.

මේ වත්ම කිතුනු ජන අඩවියක පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පණතක් අරබයාද මෙවැනි අරගලයක් පැන නැගුනි. එහිදී සභා ශ්‍රේෂ්ඨයන්ගේ මැදිහත් වීම පමා විය. එය කෙළවර වූයේ ද වටිනා දේව දරුවකු කතෝලික සභාවට අහිමි වීමෙනි. මෙම අවස්ථාවේදී සභා ශ්‍රේෂ්ඨ මැදිහත් වීම කල්වේලා ඇතිව සිදුවිය. එහෙත් අවාසනාව වලකා ගත නොහැකි විය. සභාවට තවත් දේව දරුවකු අහිමිවිය.

ඇත්තටම තම අනුගාමික ජනතාවට තම පියාපත් සෙවනේ ආරක්ෂාව සහතික කිරීමට සභාව අසමත්වීද? නැතිනම් සභාවේ ආරක්ෂාව පිළිබඳ එහි අනුගාමිකයන් තුළ සහතිකයක් තවමත් ඇතිවී නැද්ද? මේ අප අප තුළම මහත් ගැඹුරින් විමසා බලා වහා අවශ්‍ය පිළියම් යෙදිය යුත්තකැයි සිතේ.

එන්. එම්. පෙරේරා
පමුණුගම

නගර සභා සේවකයන්ට කම්කරු විනිශ්චය සභාව අකැපද?

ගැටලුව – ජයන්ත සඳගිරිය සුලු නගර සභාවේ කාර්යාල කාර්ය සේවකයකු වශයෙන් 2005 ජනවාරි පළමු දින සිට සේවය කළේ ය. ඔහු සේවයට බඳවාගත්තේ එවකට සිටි නගරාධිපතිවරයා විසිනි. 2011 මැතිවරණයත් සමඟ හිටපු නගරාධිපතිවරයාගේ පක්ෂය පරාජය වූ අතර විරුද්ධ පක්ෂය ජයග්‍රහණය කර නව නගරාධිපතිවරයකු පත්විය. 2011 දෙසැම්බර් මස 31 වන දින සිට ජයන්තගේ සේවය අවසන් කර ඇත. තම සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවට පැමිණිලි කිරීමට අදහස් කරයි. ඔහුට සහනයක් ලබාගත හැකි වේද?

විසඳුම –

සේවය අවසන් කළ අයකුට සහනයක් ලබා ගත හැකි එකම අධිකරණය කම්කරු විනිශ්චය සභාව බව සත්‍යයකි. කාර්මික ආරාවුල් පනතේ 31 බී වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ. එහෙත් මේ සහනය ලබාගත හැක්කේ පෞද්ගලික අංශයේ සේවකයන්ට පමණකි. පළාත් පාලන ආයතනවල සිටින සේවකයන් රජයේ සේවකයන් ලෙස සැළකේ. එම සේවකයන් පළාත් පාලන අමාත්‍යංශය යටතේ පාලනය වන අතර, පත්වීම්. මාරුවීම් හා අනිකුත් පරිපාලන කටයුතු කෙරෙන්නේ පළාත්පාලන කොමසාරිස්වරයා මගිනි.

එහෙත් ඉහත ගැටලුව අනුව ජයන්ත පත්කර ඇත්තේ නගරාධිපතිවරයා විසිනි. නගර සභාවක පරිපාලන කටයුතු සඳහා සුලු සේවකයන් සීමිත පිරිසක් බඳවා ගැනීමට ඇති අයිතිය යටතේ එවකට සිටි නගරාධිපතිවරයා ජයන්තට පත්වීමක් දී ඇත්තේය. නගරාධිපතිවරයාගේ තනතුර අහෝසි වීමත් සමඟම ඔහුගේ සේවය ද අවසන්වී ඇත. ජයන්ත පළාත් පාලන සේවයේ සේවකයකු ලෙස නොසැළකෙන බැවින් සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවට පැමිණිලි කිරීමේ

අයිතිය ඔහුට ඇත.

කාර්මික ආරාවුල් පනතේ කාර්මික ව්‍යාපාර යන ශීර්ෂය යටතේ පළාත් පාලන ආයතනයක සේවයේ නියුක්ත තැනැත්තන්ද ආවරණය වන බව දක්වා තිබේ. ඊට අමතරව සාප්පු හා කාර්යාල සේවක පනත, පඩි පාලක සභා පනත හා අනිකුත් කම්කරු නීති යටතේ ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් ලැබී නැත්නම් ඒ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලිකිරීමේ අයිතිය ද ඉල්ලුම්කරුට ඇත. එහෙත් පාරිතෝෂික පනතේ "සේවා යෝජකයා" යන්නට පළාත් පාලන ආයතනයන් අයත් නොවන බව පැහැදිලිවම දක්වා ඇති බව සැළකිය යුතුය. එබැවින් පාරිතෝෂික පනත යටතේ හිමිකම් ලබා ගත නොහැකි බව පැහැදිලිය. එහෙත් කම්කරු විනිශ්චය සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට තහනමක් නැති බැවින් සාධාරණ හා යුක්ති සහගත ලෙස ක්‍රියාකිරීමට බැඳී සිටින කම්කරු විනිශ්චය සභාවෙන් පාරිතෝෂික මුදලක් පවා ඉල්ලා සිටීමට අයිතියක් ඇති බව සැළකිය යුතුවේ.

විශේෂයෙන්ම සේවක අර්ථසාධක මුදල් හා සේවක බාර අරමුදල් ගෙවා නැත්නම් ඒවා අයකර දීමට කම්කරු කොමසාරිස්වරයාට බලතල ඇත. ජයන්තට වැටුප් ගෙවන්නේ නගර සභාවේ අරමුදල්වලින් බැවින් මෙහිදී සේව්‍යයා ලෙස සැළකෙන්නේ නගර සභාවය. ඒ අනුව ජයන්තගේ සේවා කාලය තුළ ලැබූ මාසික වැටුප් ගණන් බලා ඊට අදාල දායක මුදල් දඩමුදල්ද සහිතව අය කිරීමේ බලය කම්කරු කොමසාරිස් සතුවේ.

සේවක අර්ථ සාධක අරමුදල් පනතේ රෙගුලාසි යටතේ සඳහන් කර ඇත්තේ පළාත් පාලන ආයතනයක (නගර සභා, සුලු නගර සභා හෝ ඕනෑම පළාත් පාලන ආයතනයක) සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ වෙනත් සේවක අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මකවේ නම් එවැනි සේවකයන්ට මෙම රජයේ සේවක අර්ථසාධක ක්‍රමය බල නොපාන බවය. ඒ අනුව මෙම සේවකයාට ද එවැනි ක්‍රමයක් ක්‍රියාත්මක නොවේ නම් එම අර්ථ සාධක හා සේවක භාර අරමුදලේ හිමිකම් ලබා ගත හැකිවේ. මෙම ආයතනය එසේ මෙම සේවකයා වෙනුවෙන් එවැනි මුදලක් යවා නැත්නම් කම්කරු කොමසාරිස් මඟින් ඒ මුදල්ද ලබා ගැනීමේ අයිතිය ඇත.

කෙසේ වෙතත් පළාත් පාලන අයාතනවල මෙවැනි සේවකයනට බොහෝවිට නීතිය පිළිබඳ අවබෝධයක් නැති බැවින් සේවය අවසන් වීමෙන් පසු පැමිණිලි නොකරන බව පැහැදිලිය. පළාත් පාලන ආයතනයක සේවකයන් දෙවර්ගයක් සේවය කරන බව සැළකිය යුතු වේ. පළාත් පාලන කොමසාරිස් යටතේ පත්වීම් ලැබූ සේවකයන් හා පළාත් පාලන ආයතනයෙන් පත්වීම් ලැබූ සේවකයන් වේ. පළමු කොටස දැන් සැළකෙන්නේ රජයේ සේවකයන් ලෙසය. ඔවුනට රජයේ සේවකයන්ට හිමි වරප්‍රසාද හිමිවේ. එහෙත් දෙවන කොටසේ සේවකයන්ට එම වරප්‍රසාදය අහිමිය. ඔවුනට ලැබෙන්නේ මෙරට පෞද්ගලික අංශයේ සේවකයන්ට හිමි වරප්‍රසාදය. එබැවින් තමන්ට අසාධාරණයක් වී නම් කම්කරු කොමසාරිස්ට හෝ කම්කරු විනිශ්චය සභාවට පැමිණිලි කිරීමේ අයිතිය ඔවුන්ට ඇත.

එහෙත් මෙරට නීති වාර්තා අනුව පෙනී යන්නේ එවැනි පැමිණිලි ඉදිරිපත් වන්නේ ඉතාමත් අල්ප වශයෙන් බවය. උදාහරණ ලෙස 1968 වර්ෂයේ ඉදිරිපත් වූ කොළඹ නගර සභාව එරෙහිව මුණසිංහ (71 නනීවා. 223-224) නඩුවෙන් පසු වාර්තා වූ නඩුවක් නැති තරම්ය. එහිදී බේරුම්කරුවකු විසින් දුන් තීරණයක් වාර්තා වී ඇති අතර සේවකයාට අභියාචනයෙන් වාසියක් අත් වී නැතත් එවැනි පළාත් පාලන ආයතනවල සේවකයන්ට කම්කරු විනිශ්චය සභාවකට ඒමේ අයිතිය පිළිගත් අවස්ථාවක් ලෙස එය සැළකිය හැකිය. මේ අනුව ජයන්ත ගේ සේවය අසාධාරණ ලෙස අවසන් කර ඇති බව ඔප්පු කළ හැකි නම් ඔහුට සාධාරණ තීරණයක් (නැවත සේවය හෝ වන්දියක්) ලබා ගත හැකි වනු ඇත. මෙහිදී වගකිව යුතු වන්නේ පළාත්පාලන ආයතනය බව සැළකිය යුතු වේ.

නැවත රැකියාව හෝ වන්දි මුදලක්ද අනිකුත් ව්‍යවස්ථාපිත දීමනාද ලබාගැනීමේ අයිතිය මෙවැනි සේවකයන්ට හිමිය. එහෙත් කිසියම් විෂමාචාරයක් මත සේවය අවසන් කර ඇත්නම් එවැනි වන්දි හෝ නැවත සේවය ලබා ගැනීමේ අවස්ථාව අහිමි වේ. එහෙත් සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාර අරමුදල් ලබා ගැනීමේ අයිතිය ඉවත් නොවන බව සැළකිය යුතුය. මේ අනුව ජයන්තගේ සේවය අසාධාරණ ලෙස අවසන් කර ඇත් නම් ඔහුට කම්කරු නීතියෙන් සළසා ඇති සහන ලබාගැනීමේ අයිතිය විවෘතව ඇත. ඒ සඳහා කම්කරු විනිශ්චය සභාවටත් (සේවය අවසන් කර හය මාසයක් ඇතුළත) කම්කරු කොමසාරිස් වෙතත් පැමිණිලි ඉදිරිපත් කළ යුතුවේ. ඒ අනුව සහන ලබාගත හැකි වනු ඇත.

මෙරට... 1 පිටුවෙන්

එම විදුහලේ ශ්‍රවණාගාරයේ දී ඉකුත් 24 දින සිකුරාදා පැවති 110 වන වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී 2011 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමින් අදියුරු පියතුමා එසේ පැවසීය.

ප්‍රධාන ආරාධිත, ආදි සිසු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ප්‍රියශාන්ත ඩෙප් මහතා සහ ප්‍රධාන ශිෂ්‍ය නායක ශෙමාල් ප්‍රනාන්දු සහාව ඇමතූ අතර විශේෂ දක්ෂතා දැක්වූ සිසුන් ත්‍යාග හා සහතික පත් හිමිකර ගත්හ. 2011 වසරේ දී එක් දිනක් හෝ නිවාඩු නොලබා සේවයට වාර්තා කළ ගුරු මහත්ම මහත්මින් දෙදෙනකුට ද විශේෂ ත්‍යාග හිමිවීම කැපී පෙනුණි.

හා. ජුසේ වාස්... 1 පිටුවෙන්

ප්‍රධාන පෙළේ ප්‍රාතිහාර්යයක් වාර්තා වී ඇති හෙයින් ශුද්ධාසනයේ සාන්තුවරයට එසැවීමේ කොමිසම ඒ පිළිබඳව පර්යේෂණ කරමින් සිටී. තවද ජයන්ති වසරට සමගාමීව ලංකාවේ භාග්‍යවත් ජුසේවාස් පිය පාද ස්පර්ශය ලැබූ ස්ථාන වෙත වන්දනා ගමනක් සංවිධානය කිරීමට ද මීසම්, පාසල් හා ආයතන මට්ටමින් දිගින් දිගට ම දැනුවත් කිරීම්, යාච්ඤා කිරීම හා පිදුම් පුද කිරීමටත් යෝජනා කෙරිණි.

උගත් පාඩම් හා... 3 පිටුවෙන්

සිංහල පමණක්ය යන ස්ථාවරයෙන් මිදී ඉදිරියට ගමන් කරමින් භාෂාමය ගැටළු පැහැදිළිව හඳුනා කටයුතු කිරීමේ අවශ්‍යතාවක් පවතී. යහපාලනය ක්‍රියාත්මක වීමේ හැඟීම සියල්ලන් තුළ තහවුරු කළ යුතුය. නීති විරෝධි ලෙස අවි ආයුධ අත දරා සිටින කණ්ඩායම් නිරායුද කිරීම අවශ්‍යවේ. අප ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නේ අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ කාරණාවේදී සහ අත්අඩංගුවේ පසුවන පුද්ගලයන්ගේ නාම ලේඛණයක් ඉදිරිපත් කිරීමට රජය කටයුතු කිරීම මඟින් ඔවුන්ගේ නෑසිය හිතවතුන්ට පවත්නා සැබෑ තත්ත්වය සැක හැර දැන ගැනීමට හැකිවන අතර තවදුරටත් අතුරුදන් වූවන් කෙරේ බලාපොරොත්තු තබා නොගත යුතු බවට හැඟීමක් ඔවුන්ට ඇති කළ හැකි බවයි. රජය මඟින් සිය අත් අඩංගුවේ නැති පිරිස ගැනත්, ඔවුනට සිදුවූයේ කුමක්ද යන්න ගැනත් අනාවරණය කිරීමේ වගකීමෙන් බැඳී සිටී. ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ නීත්‍යානුකූල ජනතා අයිතියට ගරු කිරීමේ වගකීමක් පවතී. මේ සඳාදරණීයයන්ගේ වියෝව නීත්‍යානුකූල ලෙස හඳුනා ගෙන තහවුරු කිරීමේ අවශ්‍යතාවක් පවතින අතර මෙය සියලු මිනිස් වග සතු ගැඹුරු අවශ්‍යතාවක් හා නීත්‍යානුකූල තත්ත්වයකි. වරක් හඳුනාගත් පසු ජනතාව අනාගතය කෙරේ යොමුකර ඔවුන්ගේ ඉදිරි ජීවිතය පවත්වා ගැනීමට අපට ශක්තියක් දිය හැකිය.

අපගේ දුබලතා මැනවින් හඳුනා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳවද අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නෙමු. වාර්තාව එය මෙසේ දක්වා ඇත. "රජය සහ සමාජය යන දෙපාර්ශ්වයම වඩාත් යහපත් සමාජයක් උදෙසා කලාවේ නිර්මාණශීලිභාවය නැංවීම සඳහා අසමත් වී ඇත. එහෙයින් කලාව සමාජයේ ඒ ඒ සංඝයන් අවබෝධකර ගැනීමේ තත්ත්වය නැංවීම සඳහා කෙතරම් දුරට උපයෝගි කරගත හැකි දැයි අප හඳුනා ගත යුතුය. අප භාෂාමය සහ සංස්කෘතිකමය පොදු භාවයන් සහ සමානකම් හඳුනා ග නිමින් ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු කොට ස්ථාපිත කිරීමටත්, සිංහල හා දමිළ සංස්කෘතීන් හි ඉතා පොහොසත් මූලයන් සහ සංස්කෘතික පුනර්ජීවනයන් චිත්‍ර, නාට්‍ය හා සංගීතය ආදිය ඔස්සේ සැලකිල්ලෙන් හා කල්පනාවෙන් තහවුරු කිරීමටත් කටයුතු කළ යුතුය. (ලේඛන 9.272, 9.273, පිට 385)

ආගමික නායකයන් ලෙස අප සතු ප්‍රත්‍යක්ෂ කාර්ය භාරය පිළිබඳව කල්පනාකාරීව සහ අපගේ වගකීම වනුයේ සෑම සියලු දෙයක් අපගේ සීමාවන් තුළ පිහිටා කටයුතු කිරීම බව වටහා ගෙන අප උදක්ම රජයෙන් ඉල්ලා සිටිනුයේ මේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුපරීක්ෂාකාරී අධීක්ෂණය සඳහා වගකිව යුතු පුද්ගලයන්ගෙන් යුතු පිරිසක් පත්කරන ලෙසය. යහපත වෙනුවෙන් ඇප කැපවෙන සෑම සියලු පිරිමි හා කාන්තාවන් සමඟ එක්වන්නට අප ප්‍රාර්ථනා කරන අතර ඔවුන් හා එකමුතුව රජය සිය බලය පාවිච්චි කරමින් ඉක්මනින් කොමිසමේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත්, එමඟින් අප සඳාදරණීය දේශයට සුවිශේෂි ලෙස අවශ්‍යව පවතින සමෘද්ධිය සහ ප්‍රතිසංධානය තහවුරු කිරීමට කැප වන ලෙසත් ඉල්ලා සිටිමු.

ගුරු දිවියේ රජත ජයන්තිය

කොළඹ 13 ශාන්ත බෙනඩික් විදුහලේ ආචාර්ය මණ්ඩලයේ සේවය කරන ශාන්ති ලාල් පෙරේරා මහතා සේවයේ අවුරුදු 25 රජත ජයන්තිය නොබෝදා සැමරීය. ඒ නිමිත්තෙන් කොටහේන ශාන්ත ලූසියා ආසන දෙවිමැදුරේදී තුති පිදීමේ මෙහෙයක් පැවැත්විය.

1970 සිට 1985 දක්වා මෙම විදුහලේ අධ්‍යාපනය ලැබූ ඒ මහතා 1985 සිට ආචාර්ය මණ්ඩලයේ සේවය කරයි. විදුහලේ ටෙනිස් පුහුණුකරු හා කණ්ඩායම භාර ආචාර්ය වරයා ලෙස ඔහු දක්ෂ ටෙනිස් ක්‍රීඩකයන් රැසක් බිහිකර ඇත.

ටෙනිස් පුහුණුකරුවන්ගේ සැසිවාර විශාල සංඛ්‍යාවකට දායක වී ඇති ඔහු ජාත්‍යන්තර විනිසුරුවරයෙකි. ටෙනිස් ක්‍රීඩාවට අමතරව කනිෂ්ඨ ක්‍රිකට් කණ්ඩායම, පෝතක බාලදක්ෂ කණ්ඩායම, ටේබල් ටෙනිස් ක්‍රීඩාව හා පිහිනුම් භාරව සේවය කර ඇත. දහම් ගුරු III විභාගය ඉතා උසස් ලෙස සමත් වී ඇත. ඔහු උතුරු කොළඹ දිසාවට අයත් ලුණු පොකුණ ශාන්ත ඇන්ඩෘ මීසමේ ද, තුඩැල්ල දිසාවට අයත් ඕපාත ශාන්ත අන්තෝනි මීසම් වලද දහම් ගුරුවරයෙකු ලෙස සේවය කර ඇත. දේව ධර්ම නිකේතනය මගින් පවත්වනු ලැබූ බයිබල් විමර්ශනය හා මනෝ විද්‍යාව වැනි පාඨමාලා හදාරා ඇත.

ප්‍රදීප ලේඛක ගුරු පියා සේවයෙන් ඉසිඹු ලබයි

පන්නිපිටිය ක්‍රිස්තුරාජ විද්‍යාලයේ වසර 36 ක් අනගි සේවයක් ඉටු කළ ක්‍රිස්ටෝපර් රණසිංහ මහතා ඥානාර්ථ ප්‍රදීපය ලේඛකයකු මෙන්ම ගත් කතුවරයෙකි. මරදාන ශා. ජෝශප් විද්‍යාලයේ අදියුරු ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් සේවයෙන් ඉසිඹු ලැබීම නිමිත්තෙන් තුති දීමේ දිව්‍ය පූජාව ගරු මාකස් ෆර්ඩිනැන්ඩස් හා ගරු ජේ.ඩී. ඇන්තනී ඇතුළු පියවරුන්ගේ සහභාගිත්වයෙන් විද්‍යාලයීය ආදි සහ වත්මන් සිසු සිසුවියන් ඇතුළු දෙමාපිය සහභාගිත්වයෙන් පන්නිපිටිය ක්‍රිස්තුරාජ දේවස්ථානයේ පවත්වන ලදී.

අනතුරුව විදුහල්පතිනි ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු පැවිදි සොයුරිය ඇතුළු ආචාර්ය මණ්ඩලය හා සිසු දරුවන් විසින් පාසල් භූමියට එතුමන් පිළිගෙන විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ අර්ථවත් චාම් සමුදීමේ උත්සවයක් පවත්වන ලදී. එහිදී සහාව ඇමතූ ගරු විදුහල්පතිනිය ප්‍රකාශ කළේ අද දින විශ්‍රාම ලබන ක්‍රිස්ටෝපර් ගුරු පියාණන් සිය ගුරු දිවිය තුළ තමන්ට හැකි ප්‍රමාණයෙන් කැපවූ සේවයක් ලබා දුන් බවත්, සැමවිටම නායකත්වයට නිරන්තරයෙන් ලබා දුන් පක්ෂපාතිත්වය අගයන බවත්ය. දරුවන් ඇමතූ ගුරු පියාණන් ප්‍රකාශ කළේ නිරන්තරයෙන් දෙවිඳුන්ගෙන් ලද තලෙන්තු නිසි ලෙස ප්‍රයෝජනයට ගනිමින් තමන්ටත් පාසලටත්, සමාජයටත් වැඩදායි පුරවැසියන් වන ලෙසටය.

යහපත් එඬේරිකාවකගේ දූත ගමන මෙසේ නිමාවිය

ඒ වර්ෂ 2000 ක්‍රිස්තු ජයන්ති වසරයි. මුළු ලොවම කිතු උපතේ ජයන්තිය සැමරීමට සූදානම් වන මොහොතේ නායකකන්ද කුඩා ග්‍රාමයේද පෙර නොවූ විරූ සූදානමක් ඒ සඳහා ඇති වූයේ ඊට මුල් වූ විශේෂ ධර්ම දූතිකාවකගේ ඇපකැප වීමෙනි. එවකට නායකකන්ද යහපත් එඬේරා බාලිකා මහ විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිනිය ලෙස සේවය කළ ශ්‍රියාකාන්ති පෙරේරා ගුරු මෑණියන් එම දූතිකාවයි. ඇය මෙම විදුහලේ දක්ෂ ශිෂ්‍යාවක් වන අතර අවුරුදු 35 ක ගුරු සේවා කාලයක් තුළ විදුහලට ඇපකැප වූ ගුරු මාතාවකි.

ඇය අද වනවිට පාසලින් මෙන්ම දැයෙන් ද සමුගෙන සතියක් ඉක්ම ගොසිනි. කිතුනු සාහිත්‍ය උලෙළ, කිතුනු ජයන්තිය සැමරීම සඳහා ඇගේම සංකල්පයක් වූ හෙළ කිතුනු සාහිත්‍යය උලෙළ පැවැත්විණි. එම උලෙළ තුළින් එදා පාසල ලැබූ පන්නරය අදට ද විද්‍යාමාන වේ. විවිධ ආගම්, ජාති නියෝජනය වන මෙම පාසලේ දැරියන්, ගුරුවරුන් හා දෙමාපියන් අතර කිතුනු වටිනාකම් හුවා දැක්වීමට මෙන්ම සහයෝගය, එකමුතුකම හා අධ්‍යාත්මික ගුණ වගාව ඇති කිරීමට එදා මෙම උතුම් කාර්යය හේතුපාදක වූ බව සිහිපත් කරනුයේ හෘදයාංගම සතුටකිනි.

සුපිරි පාසලක මෙන් නොව විශේෂ අවශ්‍යතා සහිත දරු කැලකගේ විදුබිමක් වූ මෙම පාසල තුළ මෙවන් උත්සවයක් පැවැත්වීමට ඇති ඉඩ පහසුකම් නොමැතිවීම විශේෂ බාධාවක්ව පැවති එවකට ඒ සඳහාම අළුතින් ඉදිකරන ලද එළිමහන් වේදිකාව ඈ තුළ වූ අප්‍රතිහත ධෛර්යය මල්ඵල ගැන්වීමකි. එම විවෘත වේදිකාව මත තුළ යහපත් එඬේරා වූ අප සමිඳුන්ගේ පිළිරුව සිංහාසනාරූඪ කරමින් කිතු ජයන්තියට පෙරමඟ හෙළි කරගත් යහපත් එඬේරා සිසු කැල එම උත්සවය පෙර පැවති උත්සව සැමකටම වඩා අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන්ට යෙදුනි. ඒ ඇගේ උපරිම කැපවීම මල්ඵල ගැන්වීමෙනි.

එදා ක්‍රිස්තු ජයන්තිය සැමරූ මොහොතේ අප ප්‍රවීණ ගායන ශිල්පිනි ලතා වල්පොල මහත්මිය "නමෝ මරියනි" ගීතිකාව ගයමින් දෙවිඳුන්ට කළ උපහාරය අද ඔබ දෙවිඳුන් සමඟ ස්වර්ගයේ සිට ගායනා කරන බව දන්නා නිසා අපි සතුටු වෙමු. එහෙත් මෑණියනි, ඔබ අප අතරින් වෙන් වූවත් ඔබේ ගුණ සුවඳ අප අතර සිසාරා පවතී. ආදර ගුරු මෑණියනි, ඔබට සදා මොක් සුව

විදුහල්පතිනිය ගරු ජොසපා පැවිදි සොයුරිය,
ගුරු මඩුල්ල ඇතුළු සිසු දැරියන්

යුග දිවියේ ස්වර්ණ ජයන්තිය

මට්ටක්කුලියේ පදිංචි සාන්ත මරියා මීසම් සංඝයේ ඇන්ටනි වැලන්ටයින් සහ පර්ලි පර්ඩිනන් යුවල සිය විවාහ දිවියේ 50 වැනි සංවත්සරය ස්තෝත්‍ර දිව්‍ය යාගයක් පවත්වා සැමරීමට සූදනම් වෙති. මෙම යුවලගේ දයාබර දියණිය ශාන්ති මානෙල් සහ බෑණනුවන් වන සුසන්ත ද සේරම් යන දෙපල වසර විසිපහකට අධික කාලයක් තිස්සේ මට්ටක්කුලිය සාන්ත මරියා දහම් පාසලේ දහම් දූත සේවයේ යෙදෙමින් සිටිති. *(රුක්මාල් සිල්වා)*

අවිස්සාවෙල්ලට නුදුරු, වැදගත් පවුලක, 42 වියැති, කඩවසම්, ගොඩනැගිලි කොන්ත්‍රාත්හි නියැලී සිටින 6 දෙනෙකුගෙන් යුතු පවුලේ බාල පුතුට දියුණුවට අත දිය හැකි දේපළැති රූමත් දියණියක සොයයි. දු.අ. 011-2957514. අංක N3627, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මහනුවර, කතෝලික, 1980 දෙසැම්බර් මස උපන්, උස 5' 8", ප්‍රසිද්ධ පෞද්ගලික මූල්‍ය ආයතනයක ජ්‍යෙෂ්ඨ විධායක ශ්‍රේණියේ සේවයේ නියුතු, පැහැපත්, කඩවසම්, ආගමට ලැදි එකම පුතුට ප්‍රසන්න පෙනුමැති, ගුණ ගරුක, ආගමට ලැදි, රැකියාවක නියුතු දියණියක දෙමව්පියන් සොයයි. මහනුවර අවටින් විශේෂයි. සියලු විස්තර පළමු ලිපියෙන් දන්වන්න. අංක N3632, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

සීදුව, අවු. 36, උස 5' 8", සුදු, කඩවසම්, නවීන නිවස වාහන හිමි පවුලේ බාල ව්‍යාපාරික පුතුට උගත්, රූමත්, සුදු, අවු. 31 හෝ ඊට අඩු යහපත් දුවක දෙමව්පියෝ සොයති. දු.අ. 075-2055082. ප.ව. 2-9 අතර අමතන්න. අංක N3633, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

කතෝලික, ගම්පහ දිස්ත්‍රික්කය, වයස 28 උස 5' 7", කොළඹ උසස් විදුහලක උසස් අධ්‍යාපනලාභී, Charted Intermediate සමත් පිළිගත් සමාගමක Accounts excautive රැකියාවැති, ඉඩකඩම්, ගේ දොර යාන වාහන ඇතුළු මිලියන ගණනාවක දේපළැති කඩවසම් එකම පුතුට උගත්, රූමත් රැකියාවැති දියණියක සංස්ථාසීය විශ්‍රාමික දෙමව්පියෝ සොයති. අංක N3636, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

කඳානට නුදුරු, කතෝලික, වැදගත් පවුල් පසුබිමක් ඇති, පුද්ගලික ආයතනයක සේවය කරන, 1985 උපන්, වටිනා දේපලක් හිමි පුතුට ප්‍රසන්න දුවකට පියා ඇරයුම් කරයි. අංක N3638, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

දංකොටුව, කතෝලික, අවු. 30, උස 5' 10", උසස් පෙළ සමත්, ගේ දොර හිමි ව්‍යාපාරික කඩවසම් පුතුට යහපත් දියණියක මව සොයයි. දු.අ. 077-9692729. අංක Q11N4988, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

කුරුණෑගල, රෝ. කතෝලික, කන්‍යාරාමයක උගත්, දහමට ලැදි, උපාධිධාරී, නීති ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අවු. 30, උස 5' 4", සිහින්, තලඑළළු, ප්‍රසන්න පෙනුමැති, දායාද සහිත දියණියට උගත්, යහපත් සුදුසු රැකියාවක නියුතු අවු. 31-35 අතර සහකරුවකු දෙමව්පියෝ සොයති. කුරුණෑගල පදවියට අයත් ප්‍රදේශ වලින් නම් වඩාත් සුදුසුයි. දු.අ. 037-2259227. අංක N3628, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

වයඹ, රෝමානු කතෝලික, උස 5' 4", අවු. 24 දැනට ජපානයේ ඉගෙනුම ලබන, සති දෙකක නිවාඩුවකට අප්‍රේල් මස පැමිණෙන දියණියට සුදුසු සහකරුවකු දෙමව්පියන් සොයයි. දුරකථන අංකය සමග පළමු ලිපියෙන් සියලු විස්තර එවන්න. අංක N3629 කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

වෙන්නප්පුවට නුදුරු, කතෝලික, රජයේ ලිපිකාරිණී, නිවසක්, ලක්ෂ පහක්, ස්වර්ණාභරණ හිමි, අවු. 35, උස 5' 2", බාල දියණියට රැකියාවැති කතෝලික පුතකු දෙමව්පියෝ සොයති. අංක N3630, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

ගම්පහට නුදුරු, කතෝලික, අවු. 22+, උස 5' 3", උ.පෙළ සමත්, රූමත්, පැහැපත්, ඉඩමක්, ගේ දොර බඩු රන් අභරණ හිමි තිදෙනෙකුගෙන් යුත් පවුලේ එකම දියණියට යහපත් පුතකුට දෙමව්පියන්ගෙන් ඇරයුම්. දු.අ. 071-3415130. අංක N3640, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මැදවච්චියේ පදිංචි, ව්‍යාපාරික පවුලක (කතෝලික) උස 5'ක් පමණ, සිහින් සිරුරැති, තලඑළළු, පියකරු පෙනුමැති, අවු. 26, පෞද්ගලික පාසලක ගුරු වෘත්තියේ නියුතු එකම දියණියට ව්‍යාපාරික හෝ ස්ථිර රැකියාවක නියුතු සහකරුවකු දෙමව්පියෝ සොයති. දු.අ. 025-2245905, 071-8025330. අංක Q11N4946, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

ජා-ඇලට නුදුරු, රෝ.ක., අවු. 26, පුද්ගලික ආයතනයක ලිපිකාරිණියකි. උගත් දියණියට යහපත් සහකරුවකු දෙමව්පියන් සොයයි. දායාද සහිතය. දු.අ. 075-8143164, 011-3028444. අංක Q11N4947, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

දංකොටුව, රෝමානු කතෝලික, උස 5' 3", 1978 නොවැම්බර් මස උපන්, සිංහල, උපාධිධාරී ගුරුවරියට නිවසක් හිමිය. එකම සොහොයුරිය ඉතාලියේ පදිංචිව සිටියි. ස්ථිර රැකියාවක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් හිමි සුචරිතවත් පුතකු පියා සොයයි. දුරකථන අංකය සමග විමසන්න. දු.අ. 031-5689985, 078-3588033. අංක Q11N4951, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මීගමුවට නුදුරු, කතෝලික, අවු. 27, උස 5' 4", පැහැපත්, රූමත්, මානව සම්පත් කළමනාකරණය හදාරන දියණියට ගුණ යහපත් සහකරුවකු විශ්‍රාමික දෙමව්පියන් සොයයි. දායාදය සහිතයි. දු.අ. 071-2816675. අංක Q11N4953, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මීගමුවට නුදුරු, රෝ.ක., අවු. 31, උස 5' 5 1/2", A/L සහ AAT විභාගය සමත් පිළිගත් පෞද්ගලික ආයතනයක රැකියාවැති නිවසක් හිමි, ගුණගරුක පවුලේ බාල දියණියට උගත්, ආගමට ලැදි, ස්ථිර රැකියාවක් කරන යහපත් ප්‍රසන්න පෙනුමැති සහකරුවකු මව සොයයි. දු.අ. 071-8036268. අංක Q11N4954, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

මාදම්පේට නුදුරු, 1976 උපන්, උස 5' 4", තලඑළළු, දායාද සහිත දියණියට සුදුසු යහපත් පුතකු මව සොයයි. දු.අ.072-8886328. අංක Q11N4955, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

කළුතර, සිංහල, රෝ.ක., වයස 25, උස 5' 4", පැහැපත්, නීති උපාධිය සමත් දියණියට චරිතවත්, ගුණ ගරුක පුතකුට ආරාධනා කරන්නේ ව්‍යාපාරික දෙමව්පියන් විසිනි. සියළු වත්කම් ඇය සතුය. සියළු විස්තර පළමු ලිපියෙන් දන්වන්න. අංක Q11N4969, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.